චතුරාර්යසත්‍යාවබෝධයට ධර්ම දේශනා

මහමෙව්නා
සදහම් ප්‍රකාශන

# සසරක රහස

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

**මහමෙව්නා සදහම් ප්‍රකාශන**
මහමෙව්නාව භාවනා අසපුව
වඩුවාව, පොල්ගහවෙල.
දුර / ෆැක්ස් : 037 2244602
ඊ මේල් :mahamevnawa@mahamevna.org
www.mahamevna.org | www.gautamabuddha.org

මහමෙව්නා සදහම් ප්‍රකාශන

# සසරක රහස

ශ්‍රී බු.ව. 2551 ක් වූ නිකිණි මස

© පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

**පරිගණක අකුරු සැකසුම,**
**පිටකවර නිර්මාණය සහ ප්‍රකාශනය**

මහමෙව්නා සදහම් ප්‍රකාශන
මහමෙව්නාව භාවනා අසපුව
වඩුවාව, පොල්ගහවෙල.
දුර / ෆැක්ස් : 037 2244602
ඊ මේල් : mahamevnawa@mahamevna.org
වෙබ් අඩවි : www.mahamevna.org
www.gautamabuddha.org

**මුද්‍රණය**

ඉලේෂන් ඔෆ්සෙට් (පුද්.) සමාගම
කටුනායක ගුවන්තොටුපල,
මිනුවන්ගොඩ පාර, ආඬිඅම්බලම.
දුර : 011 2254490 / 2254636

දසබලසේලප්පභවා නිබ්බානමහාසමුද්දපරියන්තා
අට්ඨංග මග්ගසලිලා ජිනවචනනදී චිරං වහතූති

*දසබලයන් වහන්සේ නමැති ශෛලමය පර්වතයෙන් පැන නැගී*
*අමා මහා නිවන නම් වූ මහා සාගරය අවසන් කොට ඇති*
*ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වූ සිහිල් දිය දහරින් හෙබි*
*උතුම් ශ්‍රී මුඛ බුද්ධ වචන ගංගාව (ලෝ සතුන්ගේ සසර දුක නිවාලමින්)*
*බොහෝ කල් ගලාබස්නා සේක්වා !*

*(සළායතන සංයුත්තය - උද්දාන ගාථා)*

*නමස්කාර වේවා බුදු රුවනට සැමදා බුදු හිමි සරණ යමි*
*නමස්කාර වේවා දම් රුවනට සැමදා සදහම් සරණ යමි*
*නමස්කාර වේවා සඟ රුවනට සැමදා මහ සඟ සරණ යමි*
*නමස්කාර වේවා තුනු රුවනට සමදා තිසරණ සරණ යමි*

---

පූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ විසින්
ශ්‍රී. බු.ව. 2550 ඇසළ මස
කැනඩාවේ ටොරොන්ටෝ නුවර
මහමෙව්නාව භාවනා අසපුවේ දී පැවත් වූ දේශනා ඇසුරිනි.

---

# දුක පිණිස හේතු ඵල දහමේ සකස් වීම

## -පටිච්ච සමුප්පාදය 1-

***ගරුතර මහා සංඝයා වහන්ස,***
***ශ්‍රද්ධාවන්ත පින්වත්නි,***

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ **පංච භයවේර සූත්‍රය** තමයි අද අපි ඉගෙන ගන්නෙ. අද ඉගෙන ගන්න දේශනාව බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර දී අනාථ පිණ්ඩික සිටුතුමාට දේශනා කරපු එකක්. අනේපිඬු සිටුතුමාගේ නියම නම සුදත්ත. එයා වෙළඳාම් කරන, ව්‍යාපාරික කටයුතු කරන කෙනෙක්.

දවසක් මෙයා වෙළඳ ගණුදෙනු වලට රජගහ නුවරට ගියා. ගිහින් රජගහ නුවර සිටුවරයාගේ මාලිගාවෙ නැවතුනා. ඒ සිටුවරයා සුදත්ත සිටුතුමාට කිව්වා, “බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයේ පහළ වෙලා ඉන්නවා. දැන් උන්වහන්සේ රජගහ නුවර වැඩ ඉන්නවා” කියල. ඒ සම්බුද්ධ කියන වචනය ඇහෙන කොට ම හරි ප්‍රීතියකට පත්වුනා මේ සුදත්ත. රජගහ නුවර සිටුතුමාගෙන් විස්තර අහගත්තා. එතුමා බුදුරජාණන් වහන්සේ ගැන විස්තර කළා. මොකද එයා ශ්‍රද්ධාවට ආපු කෙනෙක්. එයා විස්තර කරල දුන්නා බුදුරජාණන් වහන්සේ මෙහෙම මෙහෙම කෙනෙක් කියල.

ඉතින් එදා මෙයාට නින්ද යන්නෙ නෑ බුදුරජාණන් වහන්සේ ගැන ම මතක් වෙනව. කාට ද? සුදත්තට. ඒ බුදු රජාණන් වහන්සේ මෙහෙම මෙහෙම ගුණ වලින් යුක්තයි. උන්වහන්සේ හෙට උදේට කොහොම හරි ගිහිල්ල බලන්න ඕනෙ. උන්වහන්සේ බැහැදකින්න ඕනෙ කියල බුදු ගුණ හිත හිත ඉන්නව, නින්ද යන්නෙ නෑ. බුදු ගුණ හිත හිත ඉන්න කොට මෙයාගෙ හිත කොයි තරම් බුදුගුණයේ බැස ගත්ත ද කියන්නෙ, මෙයාගේ හිතේ ලොකු ආලෝකයක් ඇති වුනා. දැන් මෙයා ඇඳෙන් නැගිටල බලපුවහම එළිවෙලා වගේ පේනවා. බැහැල පිටත් වුනා බුදුරජාණන් වහන්සේ වැඩසිටි දිහාවට. පිටත් වෙලා සොහොනක් ළඟින් යනකොට හිත පොඩ්ඩක් ගැස්සුනා. ගැස්සිච්ච ගමන් ම ඒ ආලෝකය නැතිව ගියා. කරුවල වුනා. කරුවල වෙච්චි ගමන් මෙයාට යන්න එන්න විදිහක් නෑ. දැන් මොකද කරන්නෙ කියල කල්පනා කරන කොට අහසින් ඇහෙනවා ගාථාවක්. දෙවි කෙනෙක් ගාථාවක් කියනව.

**"සතං හත්ථී සතං අස්සා - සතං අස්සතරී රථා**
**සතං කඤ්ඤා සහස්සානි - ආමුත්ත මණිකුණ්ඩලා**
**ඒකස්ස පදවීතිහාරස්ස - කළං නාග්ඝති සෝළසිං"**

දෙවිකෙනෙක් කියනවා ආභරණ වලින් සරසපු ඇත්තු සීයක් ලැබුණත්, ආභරණ වලින් සරසපු අශ්වයෝ සීයක් ලැබුණත්, ආභරණ වලින් සරසපු අශ්ව කරත්ත සීයක් ලැබුණත්, ආභරණ වලින් සරසපු කුමාරිකාවන් ලක්ෂයක් ලැබුනත් ඒ එකක් වත් බුදුරජාණන් වහන්සේ දකින්න යන පියවරෙන් දාසයෙන් එකක් තරම් වත් වටින්නෙ නැහැ කියල. සිටුතුමනි බය නැතිව යන්න කියල. එතකොට ආයෙමත් බුද්ධානුස්සතියට හිත වැටුණ. ආයෙ බුදු ගුණ හිතන කොට හිත තැන්පත් වුනා. අයෙ හිත ආලෝකවත් වුණා. එළිය වගේ පේනවා. ආයෙමත් පිටත් වුණා. මේ වගේ තැන් දෙකක දි තුනකදි මෙයාට කරුවල වුණා. ආයෙමත් එළිය වුනා. කොහොම හරි මෙයා යනකොට එළිය වැටිල.

බුදුරජාණන් වහන්සේ දැකපු ගමන් ම "සුදත්ත මෙහෙ එන්න." කියල කිව්ව. සුදත්තට හරි සතුටක් ඇතිවුනා නම කියල කතා කිරීම ගැන. බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා වන්දනා

කළා. එදා ධර්ම දේශනා කරල සෝතාපන්න වුනා. බුදුරජාණන් වහන්සේ බැහැ දකින්න යන ගමන කොයිතරම් වටිනව ද? දැන් අපිට බුදුරජාණන් වහන්සේ ජීවමානව නෑ. දැන් අපිට යන්න තියෙන්නේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් දකින්නයි. එතකොට අපේ හිතේ තියෙන්නේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය අහන්නයි කියන චේතනාව නම් එයාට පියවරක් පාසා කොයි තරම් පිනක් රැස්වෙනව ඇත් ද? එතකොට බලන්න මේ අවස්ථාවේ වටිනාකම.

ඉතින් අනාථ පිණ්ඩික සිටුතුමා ඒ විදිහට තමයි බෞද්ධ වුනේ. ඊට පස්සේ එතුමා කල්පනා කළා බුදුරජාණන් වහන්සේට සැවැත් නුවරින් ආරාමයක් හදා දෙන්න ඕනෙ කියල. කල්පනා කරල සැවැත් නුවර විශාල ජනගහණයක් ඉන්නව, සැවැත් නුවර නගරයට ළඟත් නැති, දුරත් නැති, විවේකයත් ලැබෙන, හුදෙකලා බවත් තියෙන තැනක් හොය හොයා යනකොට දැක්කා ජේත කුමාරායාගේ උයන. මෙතන හොඳයි කියල ජේත කුමාරයා හම්බවෙන්න ගියා. ගිහිල්ල කිව්වා "මට ඕනෙ වෙලා තියෙනවා බුදුරජාණන් වහන්සේ උදෙසා ආරාමයක් හදල දෙන්න. ඒකට නගරයට ළඟත් නැති, දුරත් නැති, විවේකයක් ලැබෙන තැනක් තමයි හොඳ. ඔබේ මේ උයන නම් ඒකට බොහොම අගෙයි" කියල කිව්වා. "ඔබ මේක විකුණනවා ද?" කියල ඇහුවා. "නෑ. විකුණන්නෙ නෑ." කිව්වා. ඊට පස්සේ ආයෙමත් දවසක් ගිහිල්ලා ඇහුවා. "විකුණන්නෙ නෑ" කිව්වා. සුදත්ත සිටුතුමා අතහැරියෙ නෑ. ආයෙමත් ගිහිල්ල ඇහුවා. අහනකොට කිව්වා "රත්තරන් ඇතිරුවත් විකුණන්නෙ නෑ" කිව්වා. එතකොට සුදත්ත සිටුතුමා කිව්වා "නෑ මම ගත්තා. මම රත්තරන් අතුරලා මේක ගන්නවා" කියල. පුදුම වුනා.

ඊට පස්සේ සේවකයන්ට කියල ගබඩාවෙ තියෙන රත්තරන් කරත්ත වලින් ගේනවා. ගෙනල්ල එක කහවණුව කහවණුව ගෑවෙන්න මුළු ජේත උයන පුරා ම අතුරනවා. අතුරන කොට පොඩි කොටසක් අතුරන්න කහවණු මදිවුණා. එතකොට ජේත කුමාරයා බැලුවා ශ්‍රමණයන් වහන්සේ නමකට ආරාමයක් හදවන්න මෙච්චර වියදම් කරන්න මේකෙ මොකක් හරි තියෙනව කියල. කල්පනා කරල ජේත කුමාරයා කියනව, "සිටුතුමනි, ඔය

අතුරපු ප්‍රමාණය ඇති. ඉතිරි ටිකට රත්තරන් අතුරන්න ඕනෙ නැහැ. ඒ ටික මගේ ගානෙ. හැබැයි මම ඉල්ලීමක් කරන්නම්. මේ ආරාමෙට මගේ නම දාන්න ඕනෙ." ඒ කියන්නෙ ඒ කාලෙත් නම දාගන්න කැමති අය ඉඳල තියෙනවා. මොකද එයා තෙරුවන් සරණේ පිහිටපු එක්කෙනෙක් නෙවෙයිනෙ. තෙරුවන් සරණේ පිහිටපු කෙනා නම දාගන්න හදන්නෙ නෑ. තිසරණයේ පිහිටපු කෙනා පිනයි, පිනේ විපාකයයි දන්නවා. එයාට පැහැදීමක් තියෙනවා. ජේත කුමාරයා ඒ වෙනකොට තිසරණයට ආපු එක්කෙනෙක් නෙවෙයි. ඊට පස්සෙ තමයි ජේතවනයට **"අනාථපිණ්ඩිකස්ස ආරාමේ"** කියල නම ලැබුනේ.

ඉතින් මේ අනාථ පිණ්ඩික සිටුතුමා, සුදත්ත කියන නම නැතිවෙලා එයා දන් දීපු ආකාරයට අනාථ පිණ්ඩික සිටුතුමා කියල ප්‍රසිද්ධ වුනා. බුදුරජාණන් වහන්සේ බැහැදකින්න ගිහිල්ල මෙයා එකත්පසක වාඩිවුණා. වාඩිවුණාට පස්සේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "පින්වත් ගෘහපතිය, ආර්ය ශ්‍රාවකයන්ට භය වෛර ඇති වෙන කරුණු පහ සංසිඳුනා නම්, සෝතාපත්ති අංග හතරෙහි සමන්විත නම්, (සෝතාපත්ති අංග කීවෙ බුදුරජාණන් වහන්සේ කෙරෙහි නො සෙල්වෙන පැහැදීම, ධර්මය කෙරෙහි නො සෙල්වෙන පැහැදීම, ශ්‍රාවක සංඝයා කෙරෙහි නො සෙල්වෙන පැහැදීම, ආර්යකාන්ත ශීලය) ආර්ය න්‍යාය ප්‍රඥාවෙන් හොඳට අවබෝධ වෙලා නම්, ප්‍රඥාවෙන් හොඳට දැකල නම්, එයාට තමන් ගැන තමන්ට ම දැනගන්න පුළුවන් කියනවා, මම නිරයෙන් නිදහස් වුන කෙනෙක්. මම තිරිසන් අපායෙන් නිදහස් වුන කෙනෙක්. මම ප්‍රේත ලෝකෙන් නිදහස් වුන කෙනෙක්. මම අපායට නො වැටෙන කෙනෙක්. මම නිවන් මගට ආපු එක්කෙනෙක්. මම සෝවාන් වෙච්ච එක්කෙනෙක්. මම ආපහු කැරකිලා ආපස්සට වැටෙන්නෙ නැති එක්කෙනෙක්. මම ස්ථිරව මේ බුද්ධ ශාසනයේ නිවන් අවබෝධ කරනවා" කියලා තමන්ට තමන් ගැන දැනගන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ අහනවා, "කොහොමද **ආර්ය න්‍යාය** ප්‍රඥාවෙන් මනාකොට දකින්නෙ?" එහෙනම් දැන් අපි ඉගෙන ගන්නෙ මොකක් ගැන ද? ආර්ය න්‍යාය ගැන. ආර්ය න්‍යාය ප්‍රඥාවෙන් දකින්නේ කොහොම ද?

"**(ඉධ ගහපති අරිය සාවකෝ)** පින්වත් ගෘහපතිය, මේ කාරණයේ දී ආර්ය ශ්‍රාවකයා, **(පටිච්ච සමුප්පාදායේව සාධුකං මනසිකරෝති)** පටිච්ච සමුප්පාදය ම මනාකොට නුවණින් මෙනෙහි කරයි." ඔන්න ශ්‍රාවකයාගේ තියෙන දක්ෂතාවය. මතක තියාගන්න කරුණක් දැන් එනව. කොහොමද මෙනෙහි කරන්නේ. ආර්ය න්‍යාය කියන්නෙ මෙන්න මේ කොටසට. **"ඉති ඉමස්මිං සති ඉදං හෝති"** ඒක පාළියෙන් ම මතක තියාගන්න. ඒක ලේසියි. "මෙය ඇති කල්හි මෙය වේ." **"ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති"** "මෙය උපදින විට මෙය උපදී." මේක තමයි න්‍යාය. ඊළඟට දෙවෙනි කොටස. **"ඉමස්මිං අසති ඉදං න හෝති"** "මෙය නැති කල්හි මෙය නැත." **"ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති"** මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ. මේකට තමයි ආර්ය න්‍යාය කියන්නේ. එතකොට මේක තමයි අවබෝධ කරන්න තියෙන්නේ. අවබෝධ වෙන ආකාරය අපි දැන් ඉදිරියේ දී ඉගෙන ගන්නවා.

මොකක්ද දැන් මේ අපි පාළියෙන් ඉගෙන ගත් කොටස.

**"ඉති ඉමස්මිං සති - ඉදං හෝති**<br>
**ඉමස්ස උප්පාදා - ඉදං උප්පජ්ජති**<br>
**ඉමස්මිං අසති - ඉදං න හෝති**<br>
**ඉමස්ස නිරෝධා - ඉදං නිරුජ්ඣති"**

ඉතින් ඒ තමයි **"යදිදං අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං, සෝක පරිදේව, දුක්ඛ දෝමනස්සුපායාසා සම්භවන්ති. ඒව මේ තස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති."** මේ විදිහට කටපාඩම් කරගන්න ඕනෙ. මොකද හේතුව මේ විදිහට පාඩම් හිටියොත් තමයි ආර්ය ශ්‍රාවකයෙකුට මෙනෙහි කරන්න පුළුවන් වෙන්නෙ.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඉගෙනීමේ දී ඉගෙන ගන්න ක්‍රම කීපයක් තියෙනවා. පළවෙනි එක තමයි **"සුතා"**. සුතා කියන්නෙ ශ්‍රවණය, සවන්දීම. දෙක **"ධතා"**. ධතා කියන්නෙ

ධාරණය කර ගැනීම. මතක තබා ගැනීම. තුන **"වචසා පරිචිතා"**. වචසා පරිචිතා කියන්නෙ වචනයෙන් පුරුදු කිරීම. හතරවෙනි එක **"මනසානුපෙක්ඛිතා"** මනසානුපෙක්ඛිතා කියන්නෙ නුවණින් මෙනෙහි කිරීම. පහ **"දිට්ඨියා සුප්පටිවිද්ධා"** අවබෝධයෙන් පැහැදිලි කර ගැනීම. බුද්ධ දේශනා ඉගෙන ගෙන ප්‍රගුණ කළොත් අවබෝධ වෙනවා. දැන් එතකොට අපට තේරෙනවා, මේක නිකං මේ කණෙන් අහල, අර කණින් අතඇරින එකක් නෙවෙයි. ඇසූ පමණින්, කථා කළ පමණින්, සම්පූර්ණ වෙන එකකුත් නොවෙයි.

සුතා, ධතා, වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුප්පටිවිද්ධා. ඔය ටික තමන් ඉගෙන ගන්න ධර්මය තුළ පුරුදු කර ගත්තොත්, ඊට පස්සෙ ඒ ධර්මය තමන්ගෙ ජීවිතය තුළ, තමන්ට තේරෙන, තමන්ට අවබෝධ වෙන, දෙයක් බවට පත්වෙනවා. එතකම් ම ධර්මය තමන්ගෙන් පිටස්තර දෙයක්.

එතකොට පටිච්ච සමුප්පාදයේ **අවිජ්ජා පච්චයා සංඛාරා...** කියල පටන් අරගෙන ඉවර කළා **ඒවමේ තස්ස කේවලස්ස දුක්ඛක්ඛන්දස්ස සමුදයෝ හෝති** කියල. මේ සංසාර දුක හැදි හැදී යන ආකාරය තමයි පටිච්ච සමුප්පාදයේ ඒ කොටසින් ඉගෙන ගන්නෙ. ඒ ටිකට කියන්නේ පටිච්ච සමුප්පාදය කියල. පටිච්ච සමුප්පාද කියන වචනයේ තේරුම මේ **දුක පිණිස හේතු ඵල දහම සකස් වීම**.

ඊළඟට එතැනින් නවතින්නෙ නැහැ ශ්‍රාවකයා. දුක පිණිස හේතු ඵල දහම සකස් වීම වගේ ම දුක නැතිවීමත්, පටිච්ච සමුප්පාදයේ නිරෝධයත් ශ්‍රාවකයා දැන ගන්නවා. කොහොම ද ඒ? **"අවිජ්ජාය ත්වේව අසේස විරාග නිරෝධා සංඛාර නිරෝධෝ, සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ, විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරෝධෝ, නාමරූප නිරෝධා සළායතන නිරෝධෝ, සළායතන නිරෝධා ඵස්ස නිරෝධෝ, ඵස්ස නිරෝධා වේදනා නිරෝධෝ, වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ, තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ, උපාදාන නිරෝධා භව නිරෝධෝ, භව නිරෝධා ජාති නිරෝධෝ, ජාති නිරෝධා ජරා, මරණං සෝක පරිදේව දුක්ඛදෝමනස්සුපායාසා නිරුජ්ඣන්ති. ඒව මේ තස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හෝති."**

එතකොට ආර්ය ශ්‍රාවකයා පටිච්ච සමුප්පාදයේ දුක හටගන්න ආකාරය විතරක් නෙවෙයි නුවණින් මෙනෙහි කරන්නෙ. පටිච්ච සමුප්පාදය නිරුද්ධ වීම ගැනත් නුවණින් මෙනෙහි කරනවා. එතකොට අපි ආර්ය න්‍යායේ මුලින් ම ඉගෙන ගත්තා **"ඉති ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති"** ඒකෙන් කියන්නෙ දුක හටගන්නා ආකාරය. ඊළඟට තියෙන්නෙ **"ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣන්ති"** ඒකෙන් කියන්නෙ දුක නැතිවෙන ආකාරය.

දැන් අපි පටිච්ච සමුප්පාදය සිංහලට ගන්න බලමු. **අවිජ්ජා පච්චයා සංඛාරා** කියන්නෙ අවිද්‍යාව හේතුකොට ගෙන සංස්කාර ඇතිවේ. සංස්කාර හේතුකරගෙන විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය හේතුකර ගෙන නාම රූප ඇතිවේ. නාම රූප නිසා ආයතන හය ඇතිවේ. ආයතන හය නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා විඳීම ඇතිවේ. විඳීම නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදාන ඇතිවේ. උපාදාන නිසා භවය ඇති වේ. භවය නිසා ඉපදීම ඇතිවේ. ඉපදීම නිසා ජරා මරණ, දුක් දොම්නස්, සුසුම් හෙලීම් හට ගනී.

දැන් අපි **ඉමස්මිං සති ඉදං හෝති** කියන එක. ඒකට සිංහලෙන් කියන්නේ මෙය ඇති කල්හි මෙය වේ. අවිද්‍යාව ඇති කල්හි සංස්කාර වේ. සංස්කාර ඇති කල්හි විඤ්ඤාණය වේ. විඤ්ඤාණය ඇති කල්හි නාම රූප වේ. නාම රූප ඇති කල්හි ආයතන හය වේ. ආයතන හය ඇති කල්හි ස්පර්ශය වේ. ස්පර්ශය ඇති කල්හි වේදනාව වේ. වේදනාව ඇති කල්හි තණ්හාව වේ. තණ්හාව ඇති කල්හි උපාදාන වේ. උපාදාන ඇති කල්හි භවය වේ. භවය ඇති කල්හි ඉපදීම වේ. ඉපදීම ඇති කල්හි ජරා මරණ, දුක් දොම්නස්, සුසුම් හෙලීම් ඇති වේ.

එතකොට අපි ඉගෙන ගත්තා **ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති.** මෙය උපදින විට මෙය උපදී. අවිද්‍යාව උපදින විට සංස්කාර උපදී. සංස්කාර උපදින විට විඤ්ඤාණය උපදී. විඤ්ඤාණය උපදින නාම රූප උපදී. නාම රූප උපදින විට ආයතන හය උපදී. ආයතන හය උපදින විට ස්පර්ශය උපදී. ස්පර්ශය උපදින විට විඳීම උපදී. විඳීම උපදින විට තණ්හාව

උපදී. තණ්හාව උපදින විට උපාදාන උපදී. තණ්හාව උපදින විට භවය උපදී. භවය උපදින විට ඉපදීම උපදී. ඉපදීම උපදින විට ජරා මරණ, දුක් දොම්නස්, සුසුම් හෙලීම් ආදී මුලු මහත් දුක ම උපදී.

පටිච්ච සමුප්පාදය නුවණින් මෙනෙහි කිරීමේ දී බුදුරජාණන් වහන්සේ ක්‍රමය කියා දුන්න. දැන් ඕක ආර්ය න්‍යාය. ඒක කොටසක්. අනෙක් කොටස නුවණින් මෙනෙහි කරන්න තියෙන්නෙ අවිද්‍යාවෙ ඉඳල නෙවෙයි. අන්තිම ඉඳල. ජරා මරණ වල ඉඳල. ජරා මරණ දුක් දොම්නස් සුසුම් හෙලීම් හටගන්නෙ එතන තමයි අපි ඉන්නෙ. අපි ඉන්න තැන ඉඳල තමයි ඒක මෙනෙහි කරන්න තියෙන්නෙ.

දැන් අපි ජරාවට ගොදුරු වෙච්ච ජීවිතයක් පවත්වන්නෙ. ජරාවට පත්වීම බුදුරජාණන් වහන්සේ තෝරල තියෙනවා. ඒ ඒ සත්වයාගේ ඒ ඒ සත්ව නිකාය වල ජරා **(ජීරණතා)** දිරාගෙන යනවා. **(ඛණ්ඩිච්චං)** දත් කැඩිල යනව. **(පාලිච්චං)** කෙස් ඉදිල යනව. **(වලිච්චචතා)** හම රැලි වැටිල යනව. **(ආයුනෝ සංහානි)** ආයුෂ ගෙවිල යනව. **(ඉන්ද්‍රියානං පරිපාකෝ)** ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන මේ ඉන්ද්‍රියන් මෝරල යනව. දැන් අපි නාකි වුනා කියන්නෙ මේ ඉන්ද්‍රියන් ඔක්කොම මෝරනව. මෝරන කොට ආයුෂ ඉවර වෙනව. එතකොට මේ කියන ලක්ෂණ ටික ඔක්කොම වෙනව. දැත් හැලෙනව. ඊළඟට කෙස් ඉදෙනව. හම රැලි වැටෙනව. ඇස් දුර්වල වෙනව. කණ් දුර්වල වෙනව, ගඳසුවඳ දැනීම දුර්වල වෙනව. රස දැනීම දුර්වල වෙනව. ඇඟේ පතේ ශක්තිය දුර්වල වෙනව. මේක ජරා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනව ජරා කියන එක මේ ලෝකයේ ඉපදිච්ච සියලු දෙනාට පොදු එකක්. එතකොට අපි සියලු දෙනා අත්විඳින එකක්. එතකොට අපි අවබෝධ කර ගන්න ඕනෙ ජරාවට ගොදුරු වෙන ජීවිතයක් පවත්වනව කියල.

ඊළඟට බුදුරජාණන් වහන්සේ මරණය විස්තර කරනව, ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව ලෝකයෙන් **(චුති)** චුතවෙනව, **(චවනතා)** චුත වෙන බව, **(භේදෝ)** බිඳිල යනව, **(ඛන්ධානං භේදෝ)** පංච උපාදානස්කන්ධ බිඳිල යනව, **(කළේබරස්ස නික්ඛේපෝ)** ශරීරය

බැහැරට දානව. මේ මොකක් ද? මරණය. එතකොට මරණය කියල බුදුරජාණන් වහන්සේ විස්තර කරන්නෙ චුත වීම. **(යා තේසං තේසං සත්තානං තම්හා තම්හා සත්ත නිකායේ චුති චවනතා මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භේදෝ ඛලේබරස්ස නික්ඛේපෝ)** කලුරිය කිරීම, මරණය, පංච උපාදනස්කන්ධය බිඳීම මේ ඔක්කෝම කියන්නෙ මරණයට.

දැන් දිව්‍ය ලෝකය ගත්තොත් චුති ත් තියෙනව. බිඳී යාමත් තියෙනව. මෙහෙ තියෙනව කලුරිය කිරීම. නැත්නම් මරණය. **ඛලේබරස්ස** කියන්නෙ මෘත ශරීරයට. **ඛලේබරස්ස නික්ඛේපෝ** කියන්නෙ මළ සිරුර බැහැරට යනව. ඉතින් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේක මොකක් ද? මරණය.

ඊළඟට මේ ජරා මරණ වලට අපි භාජනය වෙලා ඉන්නව, ගොදුරු බවට පත්වෙලා ඉන්නව කියන කාරණය ඉස්සෙල්ල අවබෝධ කරගන්න ඕනෙ. අපි ජරාවට පත්වෙන ජීවිතයක් පවත්වන බවත්, මරණයට යටත් වූ ජීවිතයක් (මරණය ජයගත්තු නෙවෙයි) පවත්වන බවත් අපි අවබෝධ කරගන්න ඕනෙ. අවබෝධකර ගන්න කොට අපට ඇති වෙනව ('මෙය ඇති කල්හි මෙය වේ' කියල කලින් ඉගෙන ගත්තනෙ) "කුමක් ඇති කල්හි ද ජරා මරණ ඇතිවෙන්නේ?" ඉපදීම ඇති විටයි ජරා මරණ අතිවෙන්නෙ. එතකොට "කුමක් ඉපදීමෙන් ද ජරා මරණ ඉපදුනේ?" ඉපදීම ඉපදීමෙන්. දැන් අපි මව් කුසක ඉපදුන මොහොතෙ ඉඳල ම ජරා මරණයට ගොදුරක්. ඒ නිසා තමයි මව් කුසක ඉපදුන මොහොතෙ ඉඳල ම එයාට මරණය උරුම වෙලා තියෙන්නෙ. මොකද හේතුව? ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත.

එතකොට අපි මෙහෙම අවබෝධයක් ඇතිකර ගත්තොත් අපට විසඳුමක් තියෙනව. මොකක්ද මේක අවබෝධ කරගෙන යන්න පුළුවන්. එහෙම නැත්නම් අපි ගත්තොත් පසුගිය කාලෙ ලංකාවෙ සුනාමි එක ආපු වෙලාවෙ මිනිස්සු ගොඩාක් කතා බස් කළා මේක කර්මයක් ද? කර්ම විපාකයක් එල දීල ද? මොකද මෙහෙම වුනේ? කියල කතා කර කර යනකොට නිකම් ඒක හිතෙන්නෙ මේක කර්ම විපාකයක්. එතකොට මේක අපට වෙන එකක් නෑ. මොකද හේතුව? මේ කොටස දන්නෙ නැති නිසා. ජරා

මරණ වලට මුහුණ දෙන්නෙ කුමක් නිසා ද? ඉපදීම නිසා. ඉපදීම නිසයි කොයි ආකාරයක හරි ගින්නෙන් වේවා, ජලයෙන් වේවා, වස විසකින් වේවා, වෙනත් අසනීපයකින් වේවා ජරා මරණවලට පත්වෙන්නෙ ඉපදීම නිසා. එහෙම නම් ඉපදීමෙන් නිදහස් වෙනකම් ම ජරා මරණ තමයි එයාට තියෙන්නෙ.

නමුත් අපි දැක්ක ඒ මරණ වලදි, අපේ රටේ අය පැතුව 'අනේ! උපනුපන් ආත්මයකදි මේ අයට මේක සිද්ධ වෙන්න එපා'. ඒ කියන්නෙ අපි හොයන්නෙ මැරෙන්නෙ නැති, ජරාවට පත්වෙන්නෙ නැති උපතක්. නමුත් ඒ පතන උපත තුළ කවදාවත් අපිට ඒක හම්බවෙන්නෙ නෑ. එහෙනම් 'ඊළඟ ආත්මයෙදි මෙයාට දිගාසිරි ලැබේවා!', 'ඊළඟ ජීවිතයෙදි මේ වගේ අකල් මරණ වලට ගොදුරු නොවේවා!' කියල පතනවනෙ. නමුත් දැන් තේරෙනව ද ඔබට අවබෝධ කරන කොට අපට පැහැදිලි කරගන්න පුළුවන් වෙන්නෙ මොකක් ද? ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත. ඒ ආර්ය න්‍යායට ගලපගත්ත ගමන් මේ සංසාරයේ හැම තැනක් ගැන ම අපට අවබෝධයක් ඇති කරගන්න පුළුවන්. ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත. එතකොට අපි කොහේ ඉපදුනත්, මෙහෙ ඉපදුනත්, වෙන රටක ඉපදුනත්, වෙන ලෝකෙක ඉපදුනත් අපට අවබෝධයක් ඇති වෙනවා ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත. ඉපදීම උපදින විට ජරා මරණ උපදී. (**ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති**) ඒක තමයි අපි තේරුම් ගන්න තියෙන ක්‍රමය.

එතකොට ශ්‍රාවකයා හිතනවා, මේ ජරා මරණ අඳුන ගත්තට පස්සේ ජරාවට පත්වෙන කොට ජරාවට පත්වෙන්න එපා කියල අපි පතන්නෙ නෑ. ඇයි අපි දන්නව, මේක කොච්චර පැතුවත් වළක්වන්න බෑ කියල. මරණයට පත් වෙන ජීවිතයක් තුළ මරණයට පත් වෙන්න එපා කියල පතන්නෙ නෑ. දැන් ඒ පැතීමත් දුකකට අයිතියි. දැන් බුද්ධ දේශනාවෙ තියෙනවා, (**යං පිච්චං න ලභති තම්පි දුක්ඛං**) කැමති යමක් නො ලැබේද එය දුකකි. දැන් කැමති යමක් නො ලැබීම දුකකි කියන එක බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මොන කාරණාවකට ද කියන එක හොයන්නෙ නැතිව සමහරු කියනව 'ඔන්න මට කාර් එකක් ඕනෙ' එතකොට කාර් එකක් නෑ. දුකයි. එතකොට මට කාර්

එකක් හම්බවුනා. එතකොට දුක ඉවරයි. 'ඔන්න මට රස්සාවක් නෑ' ඔන්න මම දුකෙන් ඉන්නව. රස්සාවක් හම්බ වුනා. එතකොට කැමති යමක් ලැබීම සැපයි එහෙනම්. ඒ මොකද එහෙම හිතන්නෙ අර බුදුරජාණන් වහන්සේ මේක දේශනා කළේ මොන කාරණයක් පැහැදිලි කරන්න ද කියල දන්නෙ නැති කම.

බුදුරජාණන් වහන්සේ බොහෝම ලස්සනට ඒක පැහැදිලි කරනවා, මේක ඇතිවෙන්නෙ කොහොම ද? මිනිස්සුන්ට ඇතිවෙනවා **(ඒවං ඉච්ඡා උප්පජ්ජති)** මෙහෙම හැඟීමක් ඇති වෙනවා. **(අහෝ වත මයං න ජරා ධම්මා අස්සාම)** "අනේ අපිට නම් ඔය විදිහට ජරාවට පත්වෙන්න එපා!" එතකොට **(න ච වත නෝ ජරා ආගච්ඡෙය්‍යාති)** "අපේ ජීවිතයට නම් ඔය විදිහට ජරාව එන්න එපා!" **(න ඛෝ පනේතං ඉච්ඡාය පත්තබ්බං)** ඒක ප්‍රාර්ථනා කරල ලබන්න බෑ. **(ඉදම්පි යං පිච්චං න ලභති තම්පි දුක්ඛං)** ඒක තමයි යමක් කැමති වේද එය නො ලැබීමේ දුක. මොකක් ද ජරාවට පත් නො වී ඉන්න කැමතියි. නමුත් ඒ කැමති දේ ලැබෙන්නෙ නෑ. ඒක තමයි කැමති දේ නො ලැබීමේ දුක කියන්නෙ.

ඊළඟට බුදුරජාණන් වහන්සේ විස්තර කරනව මරණය ගැන. මරණය ගැනත් ඇතිවෙනව **(ඒවං ඉච්ඡා උප්පජ්ජති)** මෙන්න මෙහෙම අදහසක් ඇතිවෙනව, **(අහෝ වත මයං න මරණ ධම්මා අස්සාම)** "අනේ, අපිව මැරෙන්න එපා!" **(න ච වත නෝ මරණං ආගච්ඡෙය්‍යාත)** "අපේ ජීවිතයට මරණය එන්න එපා." **(න ඛෝ පනේතං ඉච්ඡාය පත්තබ්බං)** ඒ වුනාට මේක කැමති වෙලා ලබන්න පුළුවන් එකක් නෙවෙයි. **(ඉදම්පි යං පිච්චං න ලභති තම්පි දුක්ඛං)** මේක තමයි යමක් කැමති නම් මෙය නො ලැබීමේ දුක.

මේ කැමති දේ නො ලැබීමේ දුකෙන් අපි කවුරුත් පෙලෙනව. ඕකෙන් නො පෙලෙන කෙනෙක් ලෝකෙ හොයාගන්න බෑ. දැන් අපි ගත්තොත් මේ ජරාව වළක්වන්න මොන තරම් විටමින් තියෙනව ද? මොනතරම් එක්සසයිස් තියෙනව ද? දුවන්නෙ හැම තැන ම පාරෙ පාන්දර ජාමෙ නැගිටල. එතකොට මොකද මේ ඔක්කොම කරන්නෙ? කෑම වර්ග කොච්චර නම් අපි තෝර තෝර කනව ද? මොන තරම් පරිස්සම් වෙන්න හදනව ද? නමුත් අපිට පුළුවන් ද ජරාවට පත් වීම වළක්වන්න. බෑ. මරණය

වළක්වන්න කොයි තරම් දේවල් කරනව ද? නමුත් මරණය වළක්වන්න පුළුවන් ද? බෑ. මොකද හේතුව, ඒ ඔක්කොම තියෙන්නෙ ඉපදීම ප්‍රත්‍යය කරගෙනයි. ඉපදිච්ච සත්වයාට ඒක උරුමයි. එතකොට ඒක අපි අවබෝධ කරගන්න ඕනෙ මේක තමයි කැමති දේ නො ලැබීමේ දුක. දැන් අපි කැමතියි කායික මානසික දුක් දොම්නස් නැතිව ඉන්න. අපි කැමතියි. පතනව. නමුත් ඒ පතන දේ අපට ලැබෙන්නෙ නෑ. මේක දන්නෙ නැතිව මිනිස්සු බුදුරජාණන් වහන්සේගේ ධර්මයට පහර වදින විදිහට කතා කරනව. "කෝ කාර් එකක් හම්බුනොත් ඒක සැපනෙ. එතකොට අරක බොරු වුනානෙ." කියල අපහාස කරනව. එතකොට ඒ දන්නෙ නැති කම නිසා. හරියට දන්නව නම් එයාට වෙන්නෙ අවබෝධ වීම යි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනව අපට ජරා මරණ ගැන අවබෝධයක් තියෙන්න ඕනෙ. ජරා මරණ ගැන අවබෝධයක් ඇති වුනොත් තමයි විසඳුමක් කරා අපි යන්නෙ. අවබෝධයක් නැත්නම් විසඳුම කරා යන්නෙ නෑ. ඒ අවබෝධය නැති කම නිසා ඔබට මතකද මම කිව්වා, "නිවන් සැප ලැබේවා!" කියල බැනර් එක ගහනව. "අනේ මෙයා අප අතර ම උපදින්න" කියල පතනව. ඇයි ඒ? එයාට ආයෙ ඉපදුනත් ලැබෙන්නෙ මේව ම යි කියල කල්පනාවක් නෑ. එතකොට බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ ජරා මරණ ගැන හොඳ අවබෝධයක් අපි විසින් හිතල ඇතිකර ගන්න ඕනෙ. හිත හිත නුවණින් විමස විමස ඇතිකර ගන්න ඕනෙ.

දැන් ඔන්න අපි ජරා මරණ මේකයි කියල සවන් දුන්නා **(සුතා)**. ජරා මරණ මේකයි කියල මතක තියාගත්ත **(ධතා)**. දැන් ජරා මරණ කියන්න මේකයි කියල විස්තර කරනව **(වචසා පරිචිතා)**. ඉතුරු දෙක එන්නෙ තමන්ගෙ කුසලතා මත. **(මනසානුපෙක්ඛිතා - දිට්ඨියා සුප්පටිවිද්ධා)** නුවණින් මෙනෙහි කිරීමත්, අවබෝධ කිරීමත්.

දැන් බලන්න කිසාගෝතමියගෙ දරුව මැරුණා. කිසාගෝතමිය පිළිගත්තෙ නෑ, මැරුණා කියල. ඒ කිසා ගෝතමිය වගේ අම්මල අඬනව අපි කොච්චර දැකල තියෙනව ද? සමහර මළගෙවල් වලට ගියා ම, සමහර අම්මලගෙ දරු දුක කොච්චර ද කියනව නම්, දැන් අපි ඉන්නව කියල, ස්වාමීන් වහන්සේල

ඇවිල්ල කියල තේරෙන්නෙ නෑ. "අනේ පුතේ, නැගිටින්න. ස්වාමීන් වහන්සේලා වැඩියා" කියල සිහිවිකල්ලෙන් අඬන අම්මල මේ ජීවිතයේ දී දැකල තියෙනව. සමහර ස්වාමියා මැරුණහම බිරිඳ අඬනව, "අනේ, නැගිටින්න. මේ දරුවො බලන් ඉන්නව" මැරිල කියල හිතාගන්න බෑ. ඒ වගේ මිනිස්සුන්ගේ ජීවිතයෙ මරණයෙදි ඇති වෙන කම්පනය කොයි තරම් බරපතල ද?

දැන් ඔය සුනාමි කාලෙ ඒ මිනිස්සුන්ගෙ සුළුපටු කම්පනයක් නෙමෙයි තිබුනෙ. මිනිස්සු දන්නෙ නැහැ මොකක් ද වුනේ කියල. මිනිස්සු මුහුද පැත්ත බලන්න කැමති නැහැ. අපි ඒ පැත්තට යනකොට සමහර පවුල් වල එක්කෙනා දෙන්නා ඉතිරි වෙලා හිටියා. ඒ ගොල්ලො නවතින තැන නැවතිලා ඉඳලා රෑට උදේට එනව. ඇවිල්ල අර මුහුදට ගහගෙන ගියපු පාලු ගේ වටේට ඇවිද ඇවිද ඉන්නව. "අනේ මෙතන තමයි පොඩි දරුවො නිදා ගත්තෙ, මෙතන තමයි අපි ඉව්වෙ, මෙතන තමයි අපේ ඇඳුම් තිබුනෙ" ගිනි අව්වෙ පිච්චි පිච්චි මිනිස්සු දුක් වෙනවා කඩා වැටුන ගෙවල් වලට වෙලා. (ඒ දවස්වල අව්ව හරි සැරයි. ගින්දර වගේ පිච්චෙනව. මේ ගිනි අව්වෙ කොණ්ඩෙ පීරල නැතිව කොණ්ඩෙ ඔක්කොම තඹ පාට වෙලා.) ආණ්ඩුව ලොකු මහන්සියක් ගත්ත මිනිස්සුන්ගෙ මේ මානසිකත්වය නැති කරන්න. නාට්‍ය පෙන්නුවා, විහිලු කතා දැම්මා, එහෙම කරලා ඒ මිනිස්සුන්ගෙ ජීවිතයෙන් සම්පූර්ණයෙන් ම ඒක අමතක කෙරෙව්වා. මේ වගේ අවබෝධ කරන්න තියෙන අවස්ථාවල් අපට කොච්චරවත් හම්බ වෙනවා. අපි ඒ හැම අවස්ථාවක් ම අමතක කරනවා. අවබෝධ කරන්න ඒක හේතු වෙන්නෙ නෑ. අපි ඒක අවබෝධයට පාවිච්චි කරන හැටි දන්නෙත් නෑ. අන්තිමට අමතක වෙනව. අමතක වුනහම වෙන්නෙ මොකක් ද? දැන් ටික ටික මෙයාගෙ හිතට එන්නෙ මේ ප්‍රශ්නෙ නෙමෙයි. දැන් දරුවො නැතිවුනා. ඒක අමතක වෙනව. අමතක වෙලා ගිහිල්ලා ඔලුවට ටික ටික එනවා ආධාර. බලන්න හිතට වෙන දේ.

සමහර අයට තිබුනෙ පොඩි ගෙයක්. දැන් එයාට තට්ටු දෙකේ ගෙයක් හදල දුන්න. දැන් එයාට නූපන් ලෝභය හටගන්නව. දැන් එයාට මතක නෑ "මමත් ඒ විදිහට ම ගහගෙන යන්න ඉඳල බේරිච්ච කෙනෙක්. මම කුසල් දහම් රැස් කරන්න ඕනෙ නේද?

මම යහපතේ හැසිරෙන්න ඕනෙ නේද? මම පින් කරන්න ඕනෙ නේද?" කියන සිතිවිල්ල එන්නෙ නෑ. ඊට වඩා වෙනස් එකක් එන්නෙ. ඔන්න බලන්න අවබෝධය කියන එක නැතිවුනා ම හැමතිස්සෙ ම ජීවිතය යන්නෙ කොහෙට ද? අනවබෝධයටම යි. අවිද්‍යාව තියෙන කොට අවිද්‍යාවටම මිසක් විද්‍යාවට එන්නෙ නෑ.

එතකොට කිසාගෝතමියට දරුව නැතිවෙච්ච වෙලාවෙ කිසාගෝතමිය පිළිගත්තෙ නෑ ළමය මැරිල කියල. කිසාගෝතමිය හැමෝටම ගිහින් කිව්වෙ මොකක් ද? මේ දරුව කිරි බොන්නෙ නෑ. මේ දරුවා ඇස් අරින්නෙ නෑ. මාත් එක්ක කතා කරන්නෙ නෑ. මෙයාට අසනීපයක් තියෙනව. සනීප කරල දෙන්න. දැන් වෛද්‍යවරු ගාවට යනව යනව. වෛද්‍යවරු කියනව මේක සනීප කරන්න බෑ කියල. දැන් මෙයා යනකොට කවුරු හරි ඥාණවන්ත කෙනෙක් කිව්ව අන්න අතන වැඩඉන්නව මේ ලෝකයට දුක නැතිවෙන්න බෙහෙත් දෙන උත්තමයන් වහන්සේ එතනට යන්න කිව්ව.

කිසාගෝතමිය බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා ළමයාගේ රෝග ලක්ෂණ ටික කිව්වා. "ස්වාමීනී, මගේ ළමයා කිරි බොන්නෙ නෑ. ඇස් අරින්නෙ නෑ. හිනා වෙන්නෙ නෑ. මේ ළමයා කිසිම දෙයක් කතා නෑ. අනේ මට මෙයා සනීප කරල දෙන්න" කිව්ව. බුදුරජාණන් වහන්සේට මෙයා මැරුණ කියල කියන එක තේරල දෙන්න බෑ. කිව්ව "හොඳයි, සනීප කරල දෙන්නම්" කියල. හැමෝම බෑ කියද්දි දැන් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් වුනා සනීප කරල දෙන්න. සනීප කරල දෙන්නම් කිව්ව. හැබැයි මේකට ඕනෙ කිව්ව අබ ටිකක්. "හා... මං ගෙනත් දෙන්නම්" කිව්ව. යන්න ලැහැස්ති වුනා. "එහෙම බෑ කිසා ගෝතමී, කවුරුවත් මැරිච්ච නැති ගේකින් අරන් එන්න" කිව්ව.

දැන් මෙයා මේ ළමයත් කරේ තියාගෙන යනව. එක ගෙදරකට ගිහිල්ල කියනව, "අනේ මට අබ ටිකක් දෙන්න" අබ ගේනවා. "මේ ගෙදර කවුරුවත් මැරිල ඉන්නව ද?" "අපෝ... අපේ සීයා මැරිල ඉන්නව." කිව්ව. "එහෙනම් එපා" කිව්ව. ඊළඟ ගෙදරට ගියා. "අනේ අබ ටිකක් දෙන්න" අබ ටිකක් දුන්නා. "මේ ගෙදර කවුරුවත් මැරිල තියෙනව ද?" කියල ඇහුවා. "අනේ

අපේ දරුවෙක් මැරුණා මේ ළඟ දි.” හැම ගේක ම මැරිලා. දැන් යනකොට යනකොට අවබෝධ වුනා මේ මරණයට ගොදුරු වෙලා මේ දරුවා. එයා කෙලින් ම සොහොනට දැම්මා. දාලා ආවා.

දැන් එනකොට කිසා ගෝතමියට තේරෙනවා ඉපදීම නිසා මරණයට පත් වෙන බව. ඉතින් ඉපදීම නිසා ජරා මරණයට පත් වෙන බව අපි ඔය විදිහට නුවණින් මෙනෙහි කරල, අවබෝධ කරගන්න ඕනෙ. එහෙම අවබෝධ කරගත්තට පස්සේ අපට පැහැදිලි වෙනවා, ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත. ඉපදීම උපදින විට ජරා මරණ තමයි උපදින්නෙ.

එතකොට මෙතෙක් වේලා අපි පැහැදිලි කරගත්තෙ ජරා මරණ ගැන. දැන් අපි පැහැදිලි කරගමු ඉපදීම. බුදුරජාණන් වහන්සේ විස්තර කරල දෙනවා, **(යා තේසං තේසං සත්තානං, තම්හි තම්හි සත්ත නිකායේ)** ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව වර්ගයා තුළ **(ජාති)** ඉපදෙනවා **(සඤ්ජාති)** විශේෂයෙන් උපදිනවා, **(ඔක්කන්ති)** මව් කුසේ බැස ගන්නවා, **(අභිනිබ්බත්ති)** විශේෂයෙන් පහළ වෙනවා, **(ඛන්ධානං පාතුභාවෝ)** පංච උපාදානස්කන්ධය පහළ වෙනවා, **(ආයතනානං පටිලාභෝ)** ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන ආයතන හය ලැබෙනව. මේක තමයි ඉපදීම.

එතකොට අපි උපන්නෙ මව් කුසින්. මේ ලෝකයේ සත්වයෝ මව් කුසින් විතර ද උපදින්නෙ? නෑ. මේ ලෝකෙ සත්වයො උපදිනවා බිත්තර ඇතුළෙ. ඒ බිත්තර ඇතුලෙ උපදිනකොට කියනවා අපි **අණ්ඩජ**. බිත්තර ඇතුළෙ ඉපදිලත් එයාට ලැබෙන්නෙ පංච උපාදානස්කන්ධයක්. ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන ආයතන හය. එහෙම නැත්නම් **සංසේදජ**. තෙත් පරිසරයේ උපදිනව. තෙත් පරිසරයේ ඉපදුනාමත් එයාට ලැබෙන්නෙ පංච උපාදානස්කන්ධයක්. ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන ආයතන හය. එහෙම නැත්නම් කෙනෙකුට ලැබෙනවා ජලාබුජ. අපි ඉපදුනා වගේ. **ජලාබුජ** කියන්නෙ මව් කුසේ පොඩි තිතක් වගේ ඉපදිලා, ඊට පස්සේ කර්ම විපාක විඳින්න තියෙන ස්වරූපයට අනුව ඇස, කණ, නාසය, දිව, කය, මනස නාම රූප ප්‍රත්‍යයෙන් හැදෙනව. එතකොට අපිට තියෙන්නෙ ඒ ඇස, කණ, නාසය, දිව, කය, මනස තමයි. ඊට පස්සෙ ඔන්න අපි ඉපදෙනවා.

සාමාන්‍යයෙන් වර්තමානයේ අපි ඉපදීම කියන්නෙ මව් කුසේ පිහිටීම නෙමෙයිනෙ. අපි ඉපදීම කියල සලකන්නෙ මොකක් ද? මව් කුසින් බිහිවීම. ඒ වෙලාව අරගෙන ගිහිල්ලයි කේන්දරය හදන්නෙ. බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ ඉපදීම කියන්නේ විඤ්ඤාණය මව්කුසේ බැස ගැනීම. ඇයි එතන ඉඳල ම ජරා මරණ තියෙනවා.

එතකොට ඊලඟට උපදින්නෙ **ඕපපාතිකව**. ඕපපාතිකව ඉපදීමට තමයි **(අභිනිබ්බත්ති)** විශේෂයෙන් පහළවෙනව. එතකොටත් පංච උපාදානස්කන්ධයක් තමයි පහල වෙන්නෙ. එතකොටත් ආයතන හයක් තමයි ලැබෙන්නෙ. මේක තමයි ඉපදීම කියල වදාළේ.

බුදුරජාණන් වහන්සේ වදාළා "මහණෙනි, යම් තැනක ඇසක් උපදිනවා ද, කණක් උපදිනවා ද, නාසයක් උපදිනවා ද, දිවක් උපදිනවා ද, කයක් උපදිනවා ද, මනසක් උපදිනවා ද, එතන රෝගයන්ගේ පහළ වීම යි. ඒ දුකේ ඉපදීමයි." ඇයි දැන් ඒ නිසා නෙ ඔක්කොම රෝග ටික හටගන්නෙ. යම් තැනක ඇස, කණ, නාසය, දිව, කය, මනස උපදිනවා ද, එතන ඉපදුනේ මොකක් ද? දුක. **(දුක්ඛස්සේසෝ උප්පාදෝ)** මේක දුකේ ඉපදීම යි. **(රෝගානං ඨිති)** රෝගයේ පැවැත්ම. **(ජරා මරණස්ස පාතුභාවෝ)** ජරා මරණයේ පහළවීම. බලන්න කොයි තරම් අවබෝධයක් මේ ජරා මරණ ගැන, ඉපදීම ගැන බුදුරජාණන් වහන්සේට තිබිල තියෙනව ද?

දැන් අපිට හිතෙන්නෙ කෙනෙක් උපදින කොට සතුටක් ඇතිවෙන්නෙ. නම් තියන්න නම් හොයනවා, ලස්සන ම නම තමයි දැන් ළමයට තියන්න කල්පනා කරන්නෙ. ඇඳුම්. දැන් අපට ශක්ති පමණින් හොඳ ඒවා. පහසුකම්. දැන් අපි හිතන්නෙ නෑ මෙයා කර්ම විපාකයක් අනුව ඉපදිලා, මෙයා ඊට පස්සේ කොහේ යන ගමනකට ලෑස්ති වෙලා ආවද කියල, අපට තේරෙන්නෙ නෑ.

ඉතින් ඔන්න ඉපදීම. ඉපදීම ඇති කල්හි තමයි ඔය ආකාරයට කොහේ හරි, **ජලාබුජ** උපතක් හරි, **අණ්ඩජ** උපතක් හරි, **සංසේදජ** උපතක් හරි, **ඕපපාතික** උපතක් හරි ලැබුනා නම්,

ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත. එයාට කොහේවත් ගිහිල්ල, කොහේවත් දුවල, හැංගිලා, බේරෙන්න පුළුවන් කමක් නෑ. එහෙනම් අපි ජරා මරණ හටගන්න කොට කළකිරෙන්න ඕනෙ මොකක් ගැන ද? ඉපදීම ගැන. ඉපදීම නිසයි මේ ජරා මරණ, ශෝක, වැළපීම්, දුක් දොම්නස් හටගන්නේ කියන අවබෝධයට අපි එන්න ඕනෙ.

ඒ අවබෝධයට ආවෙ නැත්නම් වෙන්නෙ මොකක් ද? අපි හිතනවා ජරා, මරණ, ශෝක, වැළපීම්, දුක්, දොම්නස් නැති උපතක් පතනව. අපි කියන්නෙ "අපිට නම් උපනූපන් ආත්මෙක මෙහෙම දුක් ලැබෙන්න එපා!" සමහරු කියනව හොඳට ම ජරාවට පත්වුනෙ කෙනෙක් දැක්කහම "අයෙ නම් දකින්නවත් ලැබෙන්න එපා!" කියනව. හේතුව මොකද? හිතාගෙන ඉන්නෙ ජරා මරණ නො දකින ඉපදීමක්. ඒ කියන්නෙ ඉපදීම ගැන අවබෝධයක් නෑ. අපට ඉපදීම ගැනත් අවබෝධයක් තියෙන්න ඕනෙ. ජරා මරණ ගැනත් අවබෝධයක් තියෙන්න ඕනෙ. ඒ අවබෝධය තිබුනොත් තමයි විසඳුමක් කරා යන්නෙ. එහෙම නැත්නම් අපට හිතෙන්නෙ, "අනේ, අපට ආයෙමත් එකට උපදින්න ඇත්නම්..." මට හොඳට මතකයි. එක මව් කෙනෙක් හිටිය මම අඳුරන, ඒ මෑණියන්ට ලාදුරු රෝගය හැදිල. ඉතින් දවසක් මම ගෙදර ගිය වෙලාවක කාලයක් තිස්සෙ මාව බලන්න ආසයි කියල දැන් ඉතින් මාව දැකල ආව. දැන් මම කාලෙකින් දැක්කෙ. මට පුදුමයි දැක්කහම මේ ඇඟිලි ඔක්කොම ගැලවිලා ගිහිල්ල. මේ එක ඇහැක් එළියට ඇවිල්ල. වහන්න බෑ ඒ ඇහැ. මාව දැකල ඇඬුවා. කිව්වා "අනේ මට පන්සලකට යන්න විදිහක් නෑ, මලක් පහනක් පූජා කරගන්න විදිහක් නෑ, දානෙ ටිකක් දෙන්න විදිහක් නෑ, සිල් ගන්න විදිහක් නෑ" මම ඇහුවා "අම්ම දැන් මොකද කරන්නේ" "මම හැමදාම මම මල් පූජා කර කර පතනව කාරණාවක්." මම ඇහුවා "මොකක් ද පතන්නේ?" "අපේ පවුලෙ සියලු දෙනා ම ත් එක්ක ආයෙමත් ලබන ආත්මෙ උපදින්න." අම්ම, තාත්තා ඔක්කොම තැඹිලි වල්ල වගේ එකට. පුළුවන් කියල හිතේ.

බලන්න අවබෝධයක් නැති වුනා ම. දැන් මේ අම්මට තේරුම් කරල දෙන්න විදිහක් නෑ. මම නිශ්ශබ්දව හිටිය. ඒ කාලෙ මට තේරෙන්නෙත් නෑ. මමත් මේ ධර්මය කියවල නෑ.

නමුත් මට තේරුනා ඒ හිතීම, ඒ අම්ම හිතන්න ඕනෙ එකක් නෙමෙයි කියල. හැබැයි මට තව කළකිරුණා ජීවිතේ ගැන. කළකිරුණෙ මොකද, මෙහෙම දුක් විඳ විඳත්, මෙහෙම පීඩා විඳ විඳත්, ආයෙත් සංසාරෙට ම නෙ කැමති. ආයෙ උපදින්න ම නෙ කැමති. කළකිරුණ මට ඒක අහල. මෙහෙම එකක් ද මේ සත්වයන් තුළ තියෙන්නෙ කියල.

මේකෙන් එකක් තේරෙනව. දැන් අපි හිතන්නේ ඉපදීමෙන් තමයි මේකට විසඳුම තියෙන්නෙ කියල. ඒක තමයි සමහරුන්ට Shock වැදුනම Suiside කරගන්නෙ. හිතනව මේ ජීවිතයේ මේ ප්‍රශ්න ඔක්කොම තියෙන්නෙ ජීවත් වෙලා ඉන්නකම්. ඊට පස්සේ හිතනවා මම මැරෙනවා. මම මරුණට පස්සේ මේ ප්‍රශ්න ඔක්කොම ඉවරයි. එතකොට ජීවිතයේ විසඳුම හැටියට දකින්නේ මරණය. එයා දන්නෙ නෑ මරණය කරා යන කොට මේ පටිච්ච සමුප්පාදයට මුහුණ දීපු එක්කෙනෙක් මේ මැරෙන්නෙ කියල අවබෝධයක් නෑ. එයා හිතන්නෙ මරණය විසඳුමක් කියල. ආයෙ උපතක් කරා යනව. ආයෙ එයාට මේ ප්‍රශ්න එක, දෙක, තුන වෙලා තමයි එයාට හම්බවෙන්නෙ.

එතකොට අපි අවබෝධ කරගන්න ඕනෙ, බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ඉපදීම කියන එකේ ස්වභාවය. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ යම් තැනක **පඨවි** ධාතුව උපදිනවා ද, **ආපෝ** ධාතු, **තේජෝ** ධාතු, **වායෝ** ධාතු, **ආකාස** ධාතු, **විඤ්ඤාණ** ධාතු ඒ කියන්නේ පඨවි ධාතු කියන්නේ මේ කෙස්, ලොම්, නිය, දත්, සම් ආදිය. ආපෝ ධාතු කියන්නේ පිත, සෙම, සැරව ආදිය. තේජෝ ධාතු කියන්නෙ උණුසුම. වායෝ ධාතු කියන්නෙ ආශ්වාස ප්‍රශ්වාස ආදී වාතය. ආකාස ධාතුව කියෙන්න මේව හැදෙන ඉඩකඩ. විඤ්ඤාණය. මේවා තියෙනවා ද යම් තැනක බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා **(දුක්ඛස්සේසෝ උප්පාදෝ)** මේ දුකේ ඉපදීම යි. **(රෝගානං ඨිති)** රෝගයන්ගේ පැවැත්ම යි. **(ජරා මරණස්ස පාතුභාවෝ)** ජරා මරණයේ පහළවීමයි.

මේකෙන් අපට පේනවා, දැන් බලන්න ඉපදීම නිසා හොඳට ම වයසට ගිහිල්ලා මේ ජරා මරණ අභියස පණ ඇද ඇද ඉන්න

අය බලන්න. ඒ කවුරුවත් ඉපදීම නිසා මට මේ දුක උරුම වුනා කියල අවබෝධයකින් ද මැරෙන්නෙ. ඒගොල්ලො මැරෙන්නෙ ආයෙමත් උපදින්න හිතාගෙන. අඩුගානෙ මේ දේවවාදී ආගම් අදහන අය පවා හිතන්නේ මේ දෙවියන් ළඟට ගිහිල්ල හරි උපදින්න. එතකොට ඉපදීමක් ම යි පතන්නෙ.

ඉපදීම පතන්නෙ නැති අය ඉන්නව. ඒගොල්ලො කියනව, බුදුරජාණන් වහන්සේගේ කාලයේ හිටියා ඉපදීම කියන්නෙ මොකක් ද, ජරා මරණ කියන්නෙ මොකක් ද කියල අවබෝධ වෙච්ච නැති අය. ඒගොල්ලො කියනව **(යාව ජීවං සුඛං ජීවේ - රිනංගුත්වා ගෘතං ජීවඃ)** "ජීවිත කාලෙ පුරා ම සැප සේ කාල බීල හිටපන්." දැන් මේ ලෝකෙ තියෙන්නෙ ඒ මතය තමයි. "ණයට හරි ගිතෙල් බීපන්" කියනව. ඒ කාලෙ හොඳ කෑමකට තියෙන්නෙ ඇත්තෙ ගිතෙල් වෙන්නැති. **(භස්මි භූතස්ස දේහස්ස)** මේ ශරීරය පිච්චුවාට පස්සේ **(පුනරාගමනං කෘතඃ)** ආයෙ කවුද එන්නෙ? මේ මතය නේද දැන් ලෝකෙ වැඩි? ලෝකයේ වැඩි ඔය මතය තමයි. ඉන්න කම් කාල බීල විනෝදෙන් ඉන්න ඕනෙ. මැරුණාට පස්සේ අපි දන්නෙ නෑ. ජීවිත අවබෝධය කරන්න බෑ ඒකට. ඒකට කියන්නේ **උච්ඡේද දෘෂ්ටිය** කියල. හැබැයි ඒවා ඔක්කොම ප්‍රහාණය වෙනව පටිච්ච සමුප්පාදය අවබෝධ වෙන කොට.

එතකොට එයා ඉපදීම ගැන අවබෝධයක් ඇති කරගන්න ඕනෙ මේක තමයි ඉපදීම කියල අර හතර ආකාරයකට. අපි ලබන්නෙ පංච උපාදානස්කන්ධය, ආයතන හය, ධාතු හය කියල අපට අවබෝධයක් තියෙන්න ඕනෙ. ඊට පස්සෙ අපි ආයෙත් අර න්‍යාය ගන්න ඕනෙ. **"ඉමස්මිං සති - ඉදං හෝති"** ඒකෙන් අවබෝධ කරගත්තේ ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත.

ඊළඟට අපි ප්‍රශ්නයක් අහන්න ඕනෙ, "කුමක් ඇති කල්හි ද ඉපදීම තිබෙන්නේ?" මොකක් ද උත්තරේ? "භවය ඇති කල්හි ඉපදීම ඇත." "කුමක් ඉපදුනොත් ද ඉපදීම උපදින්නේ?" "භවය ඉපදුනොත් ඉපදීම උපදින්නේ." ඔන්න ඔය කොටස, සාමාන්‍ය කෙනෙකුට ජරා මරණ තේරෙන්න පුළුවන්. මේක ඉපදීම නිසා වුනා කියලත් හිතෙන්න පුළුවනි. නමුත් ඒ ඉපදීම වුනේ කොහොම ද කියල දන්නෙ නෑ. අන්න එතනදි මුලා වෙනව.

කොටසක් කියනව මේ ඉපදීම තමා විසින් කරගත්තු දෙයක්. තමා විසින් ඉපදිලා. කොටසක් කියනව මේ ඉපදීම දෙවි කෙනෙක් විසින් කරල දීපු එකක්. දේව නිර්මාණයක්. කොටසක් කියනව මේ ඉපදීම ඉබේ හටගත්තු එකක්. ඔය තුනෙන් එකකට මේ පටිච්ච සමුප්පාදය අවබෝධ නො කරපු එක්කෙනා වැටෙනව. එක්කො ඉපදීම තමා විසින් කරන ලදි. ඉපදීම තමා විසින් කරන ලදි කියල හිතුවොත්, ජරා මරණත් එතකොට තමන් කරගත්තු එකක්. ඉපදීම දෙවියන් විසින් කරන ලදි කියල හිතුවොත් ජරා මරණත් දෙවියන්ගෙ වැඩක්. අන්න එතකොට යාඥා කරනවා, "අනේ දෙවියනේ මේ ලෙඩේ ඉක්මනට සනීප කරල දෙන්න", "අනේ දෙවියනේ දැන් ම මාව මැරෙන්න සලස්වන්න එපා." සැබෑවට ම මේ මොහොතෙත් ලෝකෙ පතනව ඒක. එතකොට ජරා මරණ කියන්නෙ තවකෙනෙක් විසින් කරන එකක් කියල.

තව කෙනෙක් කියනව "නෑ.... මේක ඉබේ හටගත්තු එකක්" "ඉබේ හටගත්තු එකක් නිසා අපට මේකෙ මොකුත් කරන්න දෙයක් නෑ. හිත හදාගෙන මූණ දෙමු" ඒ මතයෙ ඉන්න මිනිස්සුත් ලෝකෙ ඉන්නව. එතකොට අපි එහෙම නෙවෙයි කරන්නේ. අපි හේතු ඵල විමසනවා "කුමක් ඇති කල්හි ද, ඉපදීම ඇති වන්නේ?" "කුමක් ඉපදුනොත් ද ඉපදීම උපදින්නේ?"

එතකොට අපිට උත්තරයක් බුදුරජාණන් වහන්සේ කියාදීල තියෙනවා, භවය ඇති කල්හි ඉපදීම ඇත. භවය උපදින විට උපදී. එහෙනම් අපි දැන් අවබෝධ කරගන්න ඕනෙ භවය කියන්නේ මොකක් ද කියල. බුදුරජාණන් වහන්සේගෙන් ආනන්ද හාමුදුරුවො අහනව ඔය ප්‍රශ්නය. අහනවා,

**(භවෝ, භවෝ'ති භන්තේ වුච්චති)** "ස්වාමීනී භවය, භවය කියල කියනවා. **(කිත්තාවතානු බෝ භන්තේ භවෝ හොති)** ස්වාමීනී, භවය කියල කියන්නේ කුමන කරුණක් මත ද?" ඉතින් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ආනන්ද හාමුදුරුවන්ට, "**(කාමධාතු වේපක්කඤ්ච ආනන්ද කම්මං නාභවිස්ස අපි නු බෝ කාමභවං පඤ්ඤායති)** ආනන්දය, කාම භවයේ විපාක විඳින්ට කර්මයක් නැත්නම්, කාම භවයක් කියල එකක් තියෙනවා ද?" "**(නෝ හේතං භන්තේ)** නැහැ ස්වාමීනී." "**(ඉති බෝ ආනන්ද, කම්මං ඛෙත්තං)** ඒ

නිසා ආනන්දය, කර්මය තමයි කුඹුර. (**විඤ්ඤාණං බීජං**) විඤ්ඤාණය තමයි බීජය. (**තණ්හා සිනේහෝ**) තණ්හාව තමයි වතුර. (**හීන ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං, පත්තනා පතිට්ඨිතං, චේතනා පතිට්ඨිතං**) හීන ධාතුවේ විඤ්ඤාණය පිහිටියා, ප්‍රාර්ථනාව පිහිටියා, චේතනාව පිහිටියා."

මේකෙන් අපිට හරි ම පැහැදිලියි භවය කියන වචනයේ තේරුම. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා භව තුනක් තියෙනවා. උපත ලබන්න තියෙන තැන් හැදෙන භව කීයක් තියෙනව ද? භව තුනක් තියෙනව කියල බුදුරජාණන් වහන්සේ අවබෝධයෙන් දේශනා කළා. **කාම භවය, රූප භවය, අරූප භවය**. දැන් කාම භවය ගැන තමයි අර ප්‍රශ්නයට උත්තර දුන්නේ. කාම ධාතුවේ විපාක විඳින්නට කර්මයක් නැත්නම් කාම භවයක් කියල එකක් හැදෙනව ද කියල අහනව. එතකොට භවය කියන එක තේරෙනව. මොකක් ද භවය කියන්නේ? එතකොට කාම ධාතුවේ විපාකයක් විඳින්නට කර්මයක් සකස් වුනොත් එතන හැදිල තියෙන්නෙ මොකක් ද? කාම භවය. කාම භවයට බුදුරජාණන් වහන්සේ පෙන්නලා දෙනවා තව වචනයක්. **හීන ධාතුව**. හීන ධාතුව කියන්නෙ පහත් ස්වභාවය කියන එක. එතන තමයි කියනව චේතනාව පිහිටියේ. චේතනාව කියන්නේ? **"චේතනා හං භික්ඛවේ කම්මං වදාමි"** මතක තියෙන්න ඕනෙ චේතනාව කියන්නෙ මොකක් ද කියල හරියට ම එතකොට. චේතනාව කියන්නේ කර්මය. එතකොට හීන ධාතුවේ චේතනාව පිහිටියා ම, හීන ධාතුවේ පැතුම පිහිටියා ම, හීන ධාතුවේ විඤ්ඤාණය පිහිටියා ම, හැදිල තියෙන්නෙ මොකක් ද? කාම භවය.

එතකොට අපි මේ ජීවත් වෙන්නේ මොන භවයේ ද? අපි ජීවත් වෙන්නේ කාම භවයේ. අපි මේ ජීවත් වෙන ජීවිතය තුළ රූප භවය ගැන දන්නෙ නෑ. අරූප භවය ගැන දන්නෙත් නෑ. නමුත්, තියෙනව. දැන් අපිට ඒක මෙහෙම තේරුම් ගන්න පුළුවන්. අපි කියමු ගෙඩියක් තියෙනව. ඒ ගෙඩියෙ පොත්තක් තියෙනව. මදයක් තියෙනව. ඇටයක් තියෙනව. දැන් අපිට පිටින් බලන කොට මදය පේනව ද? නෑ. ඇටය පේනව ද? නෑ. අපිට පේන්නෙ මොකක් ද? පොත්ත. යම් දවසක පොත්ත ගැලවුනා ද, එතකොට අපිට මදය පේනවා. යම් දවසක මදය ගැලවුනා ද, ඇටය පේනවා.

ඒ වගේ අප තුළ රූප භවයත් තියෙනවා, අරූප භවයත් තියෙනවා. නමුත් අපි දැන් මුහුණ දීල ඉන්නෙ කාම භවයට. අපි ඉපදුනේ කර්මානුරූපව කාම භවයේ. සමහර විට කලින් ජීවිතයේ අපි අරූප භවයේ ඉන්නත් පුළුවන්. කලින් ජීවිතයේ රූප භවයේ ඉන්නත් පුළුවන්. ඒ භවයේ ඉඳල, ඒ ජීවිතයේ ඉඳල ඒකෙන් චුතවෙලා වෙන්න පුළුවන්. අපි දන්නෙ නෑ කොහොම ද භවය හැදුනෙ කියල. භවය හැදිච්ච විදිහට තමයි උපත තියෙන්නෙ.

එහෙනම් උපත හැදෙන්නෙ අපිට ඕනෑවට ද? භවයට ඕනෑවට ද? පුද්ගලයෙකුට ඕනෑ හැටියට නෙවෙයි උපත හැදෙන්නෙ. භවය සකස් වෙච්ච හැටියටයි. **(භව පච්චයා ජාති)** උපත ඇතිවෙන්නෙ භවය හේතු කරගෙනයි.

එතකොට අපි දැන් අහල තියෙනවා චුති සිතක් ගැන. අහල තියෙනව නේද? චුති සිතක් ඇති වුනහම, ප්‍රතිසන්ධි සිතක් ඇතිවෙනව. දැන් පටිච්ච සමුප්පාදයේ උගන්වන්නෙ කොහොම ද? භවය ඇති කල්හි ඉපදීම ඇත කියල මිසක් චුති ඇති කල්හි ඉපදීම ඇත කියල ද? නෑ. එහෙම නම් අපේ සිත චුත වෙනකොට භවයක් හැදිල තියෙන්නෙ ඕනෙ උපතක් කරා යන්න නම්. එහෙනම් ප්‍රධාන වෙන්නෙ චුති සිත නෙමෙයි. ප්‍රධාන වෙන්නෙ භවය. භවය ඇති කල්හි ඉපදීම ඇත. භවය හටගන්නා විට ඉපදීම හටගනී.

දැන් එහෙම නම් කාම ධාතුවේ විපාක විඳින ආකාරයේ කර්ම අපට රැස්වෙලා නැද්ද? රැස් වෙලා තියෙනව. එතකොට කාම ධාතුවේ විපාක විඳින ආකාරයට කර්ම රැස්වෙලා නම්, අපේ විඤ්ඤාණය පිහිටල තියෙන්නෙ මොකේ ද? හීන ධාතුවෙ. එතකොට විඤ්ඤාණය පිහිටල තියෙන්නෙ හීන ධාතුවෙ. විඤ්ඤාණය වැඩෙන්න ඕනෙ ආකාරයට අපි කයෙන් ක්‍රියා කරල තියෙනව නම්, වචනය පාවිච්චි කරල තියෙනව නම්, හිතෙන් හිත හිත ඉන්නව නම්, ඒක තමයි කුඹුර. දැන් ඒ කුඹුරෙ නම් අපි හැමතිස්සෙම විඤ්ඤාණය වගා කරන්නෙ, ඒකට වුවමනා ආකාරයට තණ්හාවත් පවත්වනව නම්, අපිට කවදාවත් දුකෙන් නිදහස් වීමක් බලාපොරොත්තු වෙන්න බෑ. අපි නො දැන කරපු දේවල් කොච්චර දුර ගෙනියනව ද කියල අපි දන්නව ද? අපි දුකෙන් නිදහස් වෙන්නේ මේ ස්වභාවය අවබෝධ කරපු දවසට.

එතකොට ඔබ තේරුම් ගන්න කාම ධාතුවේ විපාක විඳින්නට කර්ම සකස් වීම තමයි කාම භවය. එතකොට අපි අවබෝධ කරගන්න ඕනෙ කාම භවය ගැනත්, රූප භවය ගැනත්, අරූප භවය ගැනත්. මොකද මේ භව තුන පැහැදිලිව අපි තේරුම් ගත්ත නම් ඉතුරු ටික පැහැදිලිව තේරුම් ගන්න පුළුවන්.

මේ පටිච්ච සමුප්පාදය ගැන දවසක් ආනන්ද හාමුදුරුවො භාග්‍යවතුන් වහන්සේට කියනවා, "මේ පටිච්ච සමුප්පාදය ගැන සිහිකරද්දි මට හිතෙන්නෙ මේක අවබෝධ කරන්න ලේසියි වගේ." බුදුරජාණන් වහන්සේ වදාළා "හා... හා.... ආනන්දය, ඕක නම් කියන්න එපා. මේ පටිච්ච සමුප්පාදය අවබෝධ කරගන්න බැරි වීම නිසා ම මේ සත්වයා නූල් බෝලයක් පටලෝගෙන වගේ, අවුලෙන් අවුලට පත් වෙලා." ඊකෙ හරි ලස්සන වචන ටිකක් තියෙනවා. **"මුඤ්ජබබ්බරනිකා"** ඒ කියන්නෙ සම්පූර්ණයෙන් ම තණකොළ ගොඩක් පැටලුනා වගේ, නූල් බෝලයක් පැටලුනා වගේ මේ සංසාරයෙන් එතෙර වෙන්න බැරිව ඉන්නවා මේක අවබෝධ නො කිරීම නිසා. මොකක් ද ඒ? පටිච්ච සමුප්පාදය අවබෝධ නො වීම නිසා.

එතකොට පින්වත්නි, මේ පටිච්ච සමුප්පාදය අවබෝධ කරගැනීම මේ ජීවිතයේදී අනිවාර්යයෙන් ම අපි කරගන්න ඕනෙ දේ. මොකද හේතුව, මේ පටිච්ච සමුප්පාදය අවබෝධ කරගත්තොත් තමයි අපට මේ ජීවිතයේ **සෝතාපන්න** වෙන්න පුළුවන් වෙන්නෙ. ආනන්ද හාමුදුරුවන්ට එහෙම හිතුනේ, ආනන්ද හාමුදුරුවො සිහිය තියෙන අය අතරින්, නුවණ තියෙන අය අතරින් අග්‍ර නෙ.

මෙන්න බුදුරජාණන් වහන්සේ කාම භවය විස්තර කරන හැටි. **(ඉති බෝ ආනන්ද කම්මං ඛෙත්තං)** ආනන්දය ඔය විදිහට කර්මය තමයි කුඹුර. **(විඤ්ඤාණං බීජං)** විඤ්ඤාණය තමයි පැලවෙන දේ. **(තණ්හා සිනේහෝ)** තණ්හාව තමයි වතුර. එතකොට මේ ඔක්කොම විස්තර කරන්නෙ භවය කියල විස්තර වෙන තැනයි. භවය ගැන තෝරන්නයි කියන්නෙ. **(අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයෝජනානං)** චතුරාර්ය සත්‍යය අවබෝධ නො වීම කියන කාරණයෙන් වැහිච්ච, ආසාවට බැදිච්ච සත්වයාගේ හීන ධාතුවේ

විඤ්ඤාණය පිහිටලා තියෙනව. **(ඒවං ආයතිං පුනබ්බවාභිබ්බන්ති හෝති)** ඔය විදිහට තමයි කියනවා ආයෙමත් භවයක් ඇති වෙලා උපතක් ඇති වෙන්නෙ.

එහෙම නම් අපි පැහැදිලි කරගන්න ඕනෙ, සාමාන්‍යයෙන් අපේ රටේ බොහෝ තැන්වල හිතන්නෙ මේ උපදිනවා කියන එක හරි සරල එකක් හැටියට. එහෙම හිතල තමයි අපෙන් අහන්නේ චුති සිට ළඟට පටිසන්ධි හිත පහල වෙන කොට අවසාන සිත නේද මේකට බලපාන්නෙ කියල කල්පනා කරනව මිසක් එයා දන්නෙ නෑ මේකෙ පසුබිමේ තියෙන්නෙ පටිච්ච සමුප්පාදය කියල. එතකොට අපි තේරුම් ගන්න ඕනෙ පටිච්ච සමුප්පාදය යි මේකෙ පසුබිම.

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා රූප ධාතුවේ විපාක විඳින්න කර්මයක් ඇතිවෙලා නැත්නම්, රූප භවය කියල එකක් ඇති වෙනව ද? දැන් ඔන්න අපි මැරෙන කොට රූප ලෝකෙ ද උපදින්නෙ. නෑ. මොකද හේතුව? රූප ලෝකයේ උපදින්න ඕනෙ කරන කර්මයක් හැදිල නැත්නම්. ඔන්න කවුරු හරි කෙනෙක් ධ්‍යාන වැඩුව. පංච නීවරණ යටපත් කළා. පංච නීවරණ යටපත් කරල ධ්‍යානයක් පවත්වන ගමන් එයාගෙ හිතේ වැඩ කරන්නෙ කාමය නෙවෙයි. කාමයෙන් මිදිල ඉන්නෙ එයා. බලපවත්වන්නෙ රූප ධ්‍යානය. එතකොට එයාට කර්මයක් හැදෙනව එතන. ඒක රූප ධාතුවේ විපාක පිණිස හේතු වෙන කර්මයක්. එතකොට එයාට සකස් වෙන්නෙ රූප භවය.

"**(ඉති ඛෝ ආනන්ද, කම්මං ඛෙත්තං)** ආනන්දය ඔය විදිහට කර්මය තමයි කුඹුර. **(විඤ්ඤාණං බීජං)** විඤ්ඤාණය තමයි පැලවෙන දේ. **(තණ්හා සිනේහෝ)** තණ්හාව තමයි වතුර. **(අවිජ්ජා නීවරණානං සත්තානං)** අවිද්‍යාවෙන් වැසුණු සත්වයන්ගේ **(තණ්හා සංයෝජනානං)** තණ්හාවෙන් බැඳුණු සත්වයන්ගේ **(මජ්ඣිමා ධාතු)** අර කාම ධාතුවට මොකක්ද බුදුරජාණන් වහන්සේ භාවිතා කළේ? **'හීන ධාතු'** කියල. රූප ලෝක වලට භාවිතා කළේ **'මජ්ඣිමා ධාතු'** කියල. අරූප ලෝක වලට බුදුරජාණන් වහන්සේ පාවිච්චි කරන්නෙ **'පණීත ධාතු'** කියල. එතකොට එහෙමයි කියනව ආයෙමත් උපදින්නෙ. **(ඒවං ආයතිං පුනබ්භවාභිනිබ්බන්ති)**

**(අරූප ධාතු වේපක්කඤ්ඤ කම්මං ආනන්ද නාභවිස්ස)** අරූප ධාතුවේ උපදින්න කර්මයක් හැදිල නැත්නම්, **(අපිනුඛෝ අරූප භවෝ පඤ්ඤායථ)** අරූප භවයක් හැදෙනව ද කියල අහනව. මෙයාට අරූප භවයක් තියෙනව ද කියල අහනව. නැහැ ස්වාමීනී කියනව. **(ඉති ඛෝ ආනන්ද කම්මං ඛෙත්තං)** ආනන්දය, කර්මය තමයි කුඹුර. **(විඤ්ඤාණං බීජං)** විඤ්ඤාණය තමයි පැලවෙන දේ. **(තණ්හා සිනේහෝ)** තණ්හාව තමයි වතුර. අවිද්‍යාවෙන් වැසුනු, තණ්හාවෙන් බැඳුණු සත්වයන්ගේ ප්‍රණීත ධාතුවේ විඤ්ඤාණය පිහිටියා ම, පැතුම පිහිටියා ම, චේතනාව පිහිටියා ම, ඔය විදිහටයි කියනව ආයෙමත් උපදින්නෙ.

එතකොට අපි මේකෙන් පැහැදිලි කරගන්න ඕනෙ, මේ ලෝකේ අණ්ඩජව හරි, ජලාබුජව හරි, සංසේදජව හරි, ඕපපාතිකව හරි ආයෙමත් උපදිනව නම් උපදින්නේ කුමක් ඇති කල්හි ද? භවය ඇති කල්හි. බලන්න මේ කාරණා අපි අවබෝධ කළේ නැත්නම්, අපි තුළ කර්මය නැමැති කුඹුරක, විඤ්ඤාණය නැමැති පැළයක්, තණ්හාව නැමැති වතුරෙන් තෙත් වෙවී, වැඩෙනව කියල අපි දන්නෙ නෑනෙ. අපි මේක දැනගන්නෙ බුදුරජාණන් වහන්සේගේ දේශනාවෙන් විතරයි. ලෝකෙ වෙන කොහේවත් මේ පාඩම උගන්වන්නෙ නෑ. මේක තියෙන්නේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයේ විතරයි.

එතකොට අපි තේරුම් ගන්න ඕනෙ කාම භවයක් තිබුණොත්, ආර්ය න්‍යායට අනුව බලන කොට කාම ලෝකයේ උපත ඇත. **(ඉමස්මිං සති - ඉදං හෝති)** රූප භවය ඇති කල්හි රූප ලෝකයේ උපත ඇත. අරූප භවය ඇති කල්හි අරූප ලෝකයේ උපත ඇත. කාම භවය උපදින විට කාම භවයේ උපදී. එතකොට අරූප භවයක් හටගන්න කොට ඒකෙ උපතක් හැදෙනව. රූප භවයක් හැදෙන කොට ඒකෙ උපතක් හැදෙනව.

එතකොට ඔබට තේරුම් ගන්න පුළුවන් ද හිතන ලේසියෙන් මේකෙන් ගැලවෙන්න බැරි බව. කතා බස් කරන වේගයෙන්, හිතන වේගයෙන්, මේ සංසාරෙන් අපිට එතෙර වෙන්න බෑ. ඒකයි මේ පාඩම උගන්වන්න බුදු කෙනෙක් ම ඕනෙ. ලෝකෙ අනිත් හැම පාඩමක් ම ඉගෙනගන්න බුදුවරු ඕනෙ නෑ. දැන්

බුදුවරුන්ගෙන් බණ අහල ද මේ රට වල බිල්ඩින් හැදුවෙ? නෑ. මේ ජීවත් වෙන ක්‍රම හදල තියෙන්නෙ බුදුවරුන්ගෙන් බණ අහල නෙවෙයි. හඳට රොකට් යවන්නෙ. නමුත් ජරා මරණ වලින් නිදහස් වෙන්න බුදුරජාණන් වහන්සේ නමකගේ ධර්මයක් ඕනෙ. ඇයි හේතුව, මේ කොටස ලෝකයේ කාටවත් අහුවෙන්නෙ නෑ. මේ කොටස අහුවෙන්නෙ බුදුවරයෙකුට ම යි.

දැන් ඔබ මතක තියාගන්න ඕනෙ කරුණු කීපයක් තියෙනවා මෙතන. භවය කියල විස්තර කරන තැන බුදු රජාණන් වහන්සේ විස්තර කරනව කර්මය කියන එක. දැන් හොඳට මතක තියාගන්න ඕනෙ තැනක්. නැත්නම් පැටලෙන්න පුළුවන්. දැන් කර්මය කියන එක හොඳ ලස්සනට මේකෙ විස්තර කරල තියෙන්නෙ භවය කියන වචනය විස්තර කරන තැන. "**(ඉති ඛෝ ආනන්ද කම්මං ඛෙත්තං)** ආනන්දය, කර්මය තමයි මේකෙ කුඹුර. **(විඤ්ඤාණං බීජං)** විඤ්ඤාණය තමයි මේකෙ පැලවෙන දේ. **(තණ්හා සිනේහෝ)** තණ්හාව තමයි මේකෙ වතුර. අවිද්‍යාවෙන් වැසුනු, තණ්හාවෙන් බැඳුණු සත්වයන්ගේ හීන ධාතුවේ විඤ්ඤාණය පිහිටියොත්, ප්‍රාර්ථනාව පිහිටියොත්, චේතනාව පිහිටියොත් එයා ආයෙමත් ඔය විදිහට උපදිනව." එතකොට භවය ගැන තියෙන මේ විස්තරය බුද්ධ දේශනාවෙ තියෙනව. අංගුත්තර නිකායෙ පළවෙනි කොටසෙ තියෙන්නෙ. නමුත් කිසිම ඉංග්‍රීසි පරිවර්තනයක නෑ. හැම තැන ම තියෙන්නෙ becoming කියල. හොඳට බලන්න පොත්වල. සිංහල ඒවායෙත් තියෙන්නෙ 'වීම'.

ඒකට හේතුව තමයි ඒ වචනය එන්න, පාලි වචනයක් තියෙනව 'භවති' කියල. භවති කියන්නෙ 'වේ'. එතකොට 'භවෝ' කියල වචනය ගැන හිතුවා 'භවති' කියන වචනය ගැන බලලා, වචනේ හැඩේ බලල අර්ථය දුන්නා. දැන් භවෝ කිව්ව ම භවති වගේ හැඩේ තියෙන වචනයක් නෙ. එතකොට පරිවර්තනය කරන අය හිතුව භවති කියන එකේ තේරුම වේ නෙ. ඒ වගේ නිසා වීම කියල අර්ථය දුන්නා. ඔන්න වැරදිච්ච තැන. ඒ නිසා කිසිම පරිවර්තනයක භවය කියන වචනය නිවැරදිව පරිවර්තනය වෙලා නෑ. අදටත් නෑ.

එතකොට භවය කියන වචනයේ අර්ථය අපි තෝරගන්න ඕනෙ. මොකක් ද භවය කියන්නෙ. භව තුනක් තියෙනවා. කාම

භවය, රූප භවය, අරූප භවය. මොකක් ද කාම භවය කියන්නෙ? කාම ධාතුවේ විපාක පිණිස කර්ම සකස් වීම. මොකක් ද රූප භවය කියන්නෙ? රූප ධාතුවේ විපාක පිණිස කර්ම සකස් වීම. අරූප භවය කියන්නෙ අරූප ධාතුවේ විපාක පිණිස කර්ම සකස් වීම. කිසි දවසකට අපිට වරදින්නෙ නැහැ ඔය විදිහට මතකයේ තියා ගත්තොත්. මොකද හේතුව මේ දැනුම කාගෙ අවබෝධය ද? බුදුරජාණන් වහන්සේගේ අවබෝධය.

දැන් අපි මුහුණදීල ඉන්නවා කාම භවයේ විපාක පිණිස කර්ම හැදිල තියෙන්නෙ. ඇයි අපි කයින් ක්‍රියා කරනව, වචනයෙන් ක්‍රියා කරනව, මනසින් ක්‍රියා කරනව, හීන ධාතුවේ ම යි විඤ්ඤාණය පිහිටන්නෙ. ඇයි මේ විඤ්ඤාණය පවත්වන්නෙ මේ අරමුණු වල විතරනෙ. එතකොට විඤ්ඤාණය පැළවෙනව තෘෂ්ණාව නිසා.

දැන් ඔන්න ජරා-මරණ, ජාති ඊළඟට භවය අපි තේරුම් ගත්තා. ඊළඟට ආර්ය න්‍යායට අපි ආයෙමත් යන්න ඕනෙ. " කුමක් ඇති කල්හි ද භවය හටගන්නේ?" "කුමක් ඉපදුනොත් ද භවය උපදින්නේ?" "උපාදාන ඇති කල්හි භවය ඇත." "උපාදාන උපදින විට භවය උපදී."

එතකොට **උපාදාන** කියන වචනය අපි තෝරගන්න ඕනෙ. උපාදාන කියන්නේ යම්කිසි දේකට තදබල විදිහට බැඳිලා යාම. ඇලීම කියන්නේ තණ්හාව. දැන් හොඳට හිතන්න, තණ්හා - උපාදාන එකට තියෙන්නෙ හැමතිස්සෙම. දැන් අපිට යම්කිසි දේකට ආසාවක් ඇති වුනොත් ඒ ආසාව තමයි බැඳීමකට හේතු වෙන්නේ. හොඳට හිතලා බලන්න අපි යම්කිසි දේකට ආසා කලොත් ඒ දේට හිත බැඳෙනවා. එහෙමනම් ආසාවත් එක්කම තියෙන එකක් තමයි බැඳීම. එතකොට උපාදාන කියන්නේ බැඳීම කියල කියන්න පුළුවන්. ඒ වගේ ම කියන්න පුළුවන් ග්‍රහණය වීම. මොකක් හරි එකකට අහුවෙන එක කියන්න පුළුවන්.

එතකොට බලන්න ඕනෙ අපි, බුදුරජාණන් වහන්සේ උපාදාන කියලා විස්තර කරලා තියෙන්නේ මොකක් ද කියලා. දැන් අපි මතක තියාගන්න ඕනෙ කලින් ඒවා ටික. ජරා-මරණ,

ජාති, භව තුන. උපාදාන හතරක් බුදුරජාණන් වහන්සේ අවබෝධයෙන් ම දේශනා කළා. මොනවද ඒ උපාදාන හතර? පළවෙනි එක **කාම උපාදාන**. දෙවෙනි එක **දිට්ඨි උපාදාන**. තුන්වෙනි එක **සීලබ්බත උපාදාන**. හතරවෙනි එක **අත්තවාද උපාදාන**.

කාම උපාදාන. දැන් ඔබ උපාදාන කියන වචනයට අර තේරුම දාගන්න ඕනෙ. ග්‍රහණය වීම කියන එක ගනිමු. දැන් ආස කරපු දේට තමයි බැඳෙන්නේ. එතකොට කාම උපාදාන කියන්නේ කාමයට බැඳීම. දිට්ඨි උපාදාන කියන්නේ දෘෂ්ටි වලට බැඳීම. සීලබ්බත උපාදාන කියන්නේ සීලව්‍රත වලට බැඳීම. අත්තවාද උපාදාන කියන්නේ මම ය, මාගේ ය, මාගේ ආත්මය ය කියන හැඟීමට බැඳීම.

යම්කිසි දෙයකට ග්‍රහණය වුනාට පස්සේ, ඒ ග්‍රහණය වෙච්ච දෙයින් නිදහස් වීමට නම්, ග්‍රහණය වෙන්න හේතු වෙච්ච දේ නැතිව යන්න ඕනෙ. එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා කාම භවය හටගන්න හේතු වෙන්නෙත් උපාදාන. රූප භවය හටගන්න හේතු වෙන්නෙත් උපාදාන. අරූප භවය හටගන්න හේතු වෙන්නෙත් උපාදාන. මොකක්ද හේතුව? උපාදාන ඇති කල්හි භවය ඇත. උපාදාන උපදින විට භවය උපදී. එතකොට බැඳී යාමක් හටගන්න කොට ම විපාක පිණිස කර්මයක් හැදෙනවා. එතකොට බැඳීයන කොට කාමයට, කාම ධාතුවේ විපාක පිණිස කර්මයක් හටගන්නවා. කාමය අතඇරියට පස්සේ මම, මාගේ, මාගේ ආත්මය කියන එක තුළ තමයි එයා ඉතිරි ටික පවත්වන්නේ. සීලබ්බත, දෘෂ්ටි වගේ ඒවා අරගෙන. එතකොට ඉතිරි ඒවාට භවය හැදෙනවා.

කාමය කියන්නේ මොකක් ද? (**ඉට්ඨා, කන්තා, මනාපා, පියරූපා, කාමූපසංහිතා, රජනීයා**) මේ වචන වලින් විස්තර කරනවා කාමය. **ඉට්ඨා** කියන්නේ යහපත්. **මනාපා** කියන්නේ කැමැත්ත ඇති කරදෙන. **පියරූපා** කියන්නේ ප්‍රිය ස්වරූපයෙන් යුක්තයි. **කාමූපසංහිතා** කියන්නේ කාමාශාව ඇතිවෙන. **රජනීයා** කියන්නේ කිලුටු කරන එක. ඒ ලක්ෂණ වලින් යුතු යම් රූපයක් ඇද්ද, ඒක රූප කාමය යි. ඇහින් දකිනා රූපය. යම් ශබ්දයක ඔය ලක්ෂණ තියෙනව ද, ඒක ශබ්ද කාමය යි. යම් සුවඳක ඒ ලක්ෂණ ඇත්

ද, ඒක ගන්ධ කාමය යි. යම් රසයක ඒ ලක්ෂණ ඇද්ද, ඒක රස කාමය යි. යම් ස්පර්ශයක ඒ ලක්ෂණ ඇද්ද, ඒක ඵොට්ඨබ්බ කාමය යි. එතකොට මේ රූප, ශබ්ද, ගන්ධ, රස, පහස කියන පහට බැඳිලා ගිය ගමන්, එයා බැඳුනේ මොකේට ද? කාම උපාදානයට.

ඒ වගේ ම කෙනෙක් බැඳෙනවා දෘෂ්ටි උපාදානයට. දැන් ගත්තොත් මේ ලෝකයේ කාමයට වගේ ම සත්වයා දෘෂ්ටිවලට බැඳිලා යනවා. දැන් අපි ගත්තොත් සමහරු බැඳෙනවා දෘෂ්ටිවලට මේ ලෝකෙ දෙවියන් මැව්වා කියලා. සමහරු බැඳිලා ඉන්නවා දෘෂ්ටිවලට මේ ලෝකේ දෙවියන් මැව්වේ නෑ, මේක ඉබේ හටගත්තු එකක් කියලා. සමහරු බැඳිලා යනවා මේක දෙවිවරු කණ්ඩායමක් මැව්වා කියලා. මේ වගේ එක එක දෘෂ්ටි වලට, මතවාද වලට මිනිස්සු බැඳිලා යනවා. බැඳිලා ගියා ම නිකම් ඉන්නවද එයා? නෑ. ඊට පස්සේ එතන හටගන්නේත් භවයක්. එක්කෝ කාමයේ බැඳිලා, කාමයේ බැසගෙන, එයා කර්ම රැස් කරගන්නවා. එක්කෝ දෘෂ්ටියේ බැසගෙන කර්ම රැස්කරනවා. එහෙම නැත්නම් නොයෙක් සීලව්‍රත වල බැඳිලා එයා කර්ම රැස් කරගන්නවා. එහෙමත් නැත්නම්, මම ය, මාගේ ය, මාගේ ආත්මය කියන හැඟීමේ බැසගෙන කර්ම රැස් කරනවා. මේ කර්ම තමයි මෙයාට මේ බැස ගැනීම තුළ සිද්ධ වෙන්නේ. එක්කෝ කාම භවයක් හටගන්නවා, එක්කෝ රූප භවයක් හටගන්නවා. එක්කෝ අරූප භවයක් ගටගන්නවා.

දැන් ඉන්දියාවේ එහෙම සීලවෘත වලට බැඳිලා යනවා මම දැකලා තියෙනවා. හිමාලයේ ඉන්නවා සාධු වරු මුලු ඇඟේ ම අළු ගාගෙන. තහඩු කෑලි වලින් අමුඩ ගහගෙන. සීත කාලෙට කොහොම ඉන්නව ඇත් ද? ඊළඟට කොණ්ඩෙ පීරන්නෙ නෑනෙ. මම දැකලා තියෙනවා සමහරුන්ගේ කොණ්ඩෙ අඩි 15 ක් 20 ක් දිගයි. ඔතලා ඔතල උඩට හිටින්න කොණ්ඩෙ ජටා බැඳගෙන. මම දැකලා තියෙනවා සමහර සාධු වරු තනි කකුලෙන් මුලු ජීවිත කාලෙ ම හිටගෙන ඉන්නවා. ඔංචිල්ලාවක් වගේ ගැටගහලා, ඒකේ පොඩි කොට්ටයක් තියෙනවා. ඒ කොට්ටෙ උඩ එක කකුලක්. එතකොට හැම තිස්සෙම තනි කකුලෙන්. අමාරුවෙන කොට, කකුල හොඳට ම රිදෙන කොට, ඔංචිල්ලාවෙ එල්ලිලා අනෙක්

කකුල තියන්නෙ. එතකොට නාන්නෙ, කෑම ගන්නේ, වැසිකිලි - කැසිකිලි යන්නේ තනි කකුලෙන් පැන පැන. ඒවා සීලබ්බත පරාමාස වලටයි අයිති වෙන්නේ.

සමහරු ආහාරයෙන් පිරිසිදු වෙනවා කියලා දෘෂ්ටියකට එනවා. එයත් සීලබ්බත පරාමාසයකට අයත්. සමහරු ආහාරයෙන් පිරිසිදු වෙනවා කියලා හිතාගෙන එළවළුයි බතුයි කනවා. සමහරු ආහාරයෙන් පිරිසිදු වෙනවා කියල හිතාගෙන කිරි විතරක් බොනවා. දැන් ඉන්දියාවේ තියෙනවා ඒකා දසමය කියලා මාසෙ එකොළොස් වෙනිදට බත් කන්නෙ නෑ. කිරි විතරක් බීලා ඉන්නවා. ආහාරයෙන් පිරිසිදු වෙනවා කියල හිතාගෙන ඉන්නේ. සමහරු හිතනවා දිසා වලින් පිරිසිදු වෙනවා කියලා. නිදාගන්නවා දිසාව බලලා. නැගිටලා ඒ දිසාවට වඳිනවා. ඒ ඔක්කොම මොනවද? දෘෂ්ටි උපාදානත් එක්ක එකට තියෙන එකක් තමයි සීලබ්බත උපාදාන.

ඊළඟට අත්තවාද උපාදාන. මම ය, මාගේ ය, මාගේ ආත්මය ය කියන හැඟීම සම්පූර්ණයෙන් ම බැඳිල, ගැලිල තමයි ඉන්නේ. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ උපාදාන ඇති කල්හි භවය ඇත. මේක හොඳට නිස්කලංකව තේරුම් ගන්න ඕනෙ. කලබලේට බෑ.

මම මතක තියාගන්න කිව්වා, භවය විස්තර කරපු හැටි. **(ඉති බෝ ආනන්ද කම්මං ඛෙත්තං)** ආනන්දය, කර්මය තමයි කුඹුර. **(විඤ්ඤාණං බීජං)** විඤ්ඤාණය තමයි පැලවෙන දේ. **(තණ්හා සිනේහෝ)** තණ්හාව තමයි වතුර. එතකොට කාමයට බැඳිලා ගියා ම, දෘෂ්ටියට බැඳිලා ගියාම, සීලව්‍රත වලට බැඳිලා ගියාම, මම - මාගේ - මාගේ ආත්මය කියන හැඟීමට බැඳිලා එයා යම් චේතනාවක් පහළ කරනවා ද, විඤ්ඤාණයේ යම් ක්‍රියාකාරීත්වයක් තියෙනව ද, යමක් කරනවා ද, ඒ ඔක්කෝගෙන් ම සකස් වෙන්නේ එක්කෝ කාම භවයක්, එක්කෝ රූප භවයක්, එක්කෝ අරූප භවයක්. දැන් හීන ධාතුවේ නම් එයාගෙ ක්‍රියාව තියෙන්නේ කාම භවයක්. මජ්ඣිමා ධාතුවේ නම් එයාගෙ ක්‍රියාව තියෙන්නේ රූප භවයක්. ප්‍රණීත ධාතුවේ විපාක පිණිස නම් කර්ම හැදෙන්නේ අරූප භවයක්.

දැන් ඔබට තේරෙනවා ඇති ලෝක සත්වයා වැඩිපුර ඉන්නේ කොහෙද කියලා. අරූප භවයේ උපදින ගණන ඇඟිලි වලින් ගණන් කරන්න පුළුවන් තරම් පොඩ්ඩයි. රූප භවයේ උපදින පිරිසත් ඒ වගේ ම සුළු පිරිසයි. බොහෝ සත්වයාට මේ කාමය සැඩ පහරක් වගේ. මේකෙම ගහගෙන යනවා. කළකිරෙන්නෙවත් නෑ. එතකොට මේකෙ බැහැගෙන යනව එයා. **(භව පච්චයා ජාති)** භවය හේතු කරගෙන තමයි උපදින්නේ කියන කාරණය ඔබ තේරුම් ගත්තා. **(උපාදාන පච්චයා භවෝ)** උපාදාන හේතු කරගෙනයි භවය කියන එකත් දැන් අපි හෙමිහිට තේරුම් ගත්තා.

දැන් අපි ආයෙමත් ආර්ය න්‍යායට එන්න ඕනෙ. "කුමක් ඇති කල්හි ද උපාදාන ඇතිවන්නේ?" "කුමක් ඉපදීමෙන් ද උපාදාන ඉපදෙන්නේ?" "තණ්හාව ඇති කල්හි උපාදාන ඇත." " තණ්හාව ඉපදීමෙන් උපාදාන උපදී." එතකොට ඔන්න උපාදානයේ රහස. මේක අහගෙන යද්දි ඔබට තේරෙනවා ඇති මේක අවබෝධ කිරීමෙන් තොරව විසඳන්න බැහැ කියලා.

දැන් අපි දන්න කාලෙ ඉඳලා පතනව නේ. ඒත් අපි පතපු දේවල් ද වුනේ? පතපු දේවල් නෙවෙයි වුනේ. සමහරවිට ඔබ හීනෙන්වත් හිතපු නැති දේවල් වෙන්න ඇති. සාමාන්‍යයෙන් මේ ජීවිතයේත් එහෙම නම් අපි හිතපු තැන්වල ම ද උපදින්නේ? එතකොට මේක සිදුවෙලා තියෙන හැටියට යි මේක සිද්ධවෙන්නේ.

බුදුරජාණන් වහන්සේ විස්තර කරනව තණ්හාව. තණ්හාවට විවිධ වචන බුදුරජාණන් වහන්සේ පාවිච්චි කරලා තියෙනවා. නන්දි, නන්දිරාග, ආශා. තණ්හාව කියන එකේ තේරුම ඇල්ම. යම් කිසි දෙයක් කෙරෙහි අපේ හිත තදින් ඇදිල යනව නම් අන්න ඒ ඇදිලා යාම තමයි තණ්හාව කියන්නේ. එතකොට අපේ හිත රූපයට ඇදිලා යනවා නම්, ඒ මොන තණ්හාව ද? රූප තණ්හාව. අපේ හිත ශබ්දයට ඇදිලා යනව නම්, ශබ්ද තණ්හාව. අපේ සිත ගඳ-සුවඳට ඇදිලා යනව නම්, ගන්ධ තණ්හාව. අපේ සිත රසයට ඇදිලා යනව නම්, රස තණ්හාව. අපේ සිත කයට දැනෙන පහසට ඇදිලා යනවා නම්, ඵොට්ටබ්බ තණ්හාව. අපේ සිත සිතට එන සිතිවිලි වලට ඇදිලා යනවා නම්, ධම්ම තණ්හාව.

බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ තියෙනවා, රහතන් වහන්සේ ගැන විස්තර කරන කොට, (රහතන් වහන්සේට මේ තණ්හා හය ම නෑනේ.) උපමාවක් පෙන්නුවා, නෙලුම් කොළයේ තියෙන දිය බිඳුවක් වගේ කියලා. නෙලුම් කොළයේ තියෙන දිය බිඳුව නෙලුම් කොළයට ස්පර්ශ වෙලා නෑ. නෙලුම් කොළය ඇල කරන කොට වැටෙනවා. **(පදුමං වාරි යථා න ලිප්පති)** අන්න ඒ වගේ රූපයට ඇදිලා යන්නෙ නෑ. ශබ්දයට ඇදිලා යන්නෙ නෑ. ගඳ සුවඳට ඇදිලා යන්නෙ නෑ. රසයට - පහසට - සිතට එන සිතිවිලි වලට ඇදිලා යන්නේ නෑ. ඒ ඇදිලා යන්නෙ නැත්තෙ තණ්හාව නැතිවීමෙන්. තණ්හාව තිබ්බොත් වෙන්නෙ මොකක් ද? ඇදිලා යනවා. ආසාව ඇතිවෙනවා කියන්නේ ඒකයි.

ඇදිලා ගියපු ගමන් යමකට ඒකට බැඳෙනවා. උපාදාන ඇති වෙනවා. අපි රූපයට ඇදිලා යනකොට රූපයට බැඳෙනවා. ශබ්දයට ඇදිලා ගියොත් ශබ්දයට බැඳෙනවා. ගඳ සුවඳට ඇදිලා ගියොත් ගඳ සුවඳට බැඳෙනවා. රසයට ඇදිලා ගියොත් රසයට බැඳෙනවා. පහසට ඇදිලා ගියොත් පහසට බැඳෙනවා. හිතට එන දෘෂ්ටියට ඇදිලා ගියොත් දෘෂ්ටියට බැඳෙනවා. සීල ව්‍රතයට ඇදිලා ගියොත් ඒකට බැඳෙනවා.

දැන් බලන්න මේක කොයි තරම් දුරට සිද්ධ වෙනව ද කියලා. මේක ඇඟට යි සිතට යි බද්ධ වෙලා තියෙන්නේ. අපි හිතමු කෙනෙක් පුරුදු වෙලා තියෙනවා කියලා තේ එකක් බීලා වැසිකිලියට යන්න. දැන් අපිට ඉපදිච්ච ගමන් තේ පොවල ද? නෑනේ. නමුත් අපි මෑත භාගයේ පුරුදු වෙනව කියමුකෝ එහෙම එකක්. දවසක් දෙකක් මෙහෙම කරලා මාසයක් විතර ගියාට පස්සේ තේ එකක් බිව්වෙ නැත්නම් වැසිකිලියට යන්න බෑ. බලන්න ඒකට ඕනෙ හැටියට හිතත් හැදෙනවා, කයත් හැදෙනවා. දැන් එහෙම බලන කොට කොයි තරම් මේ පුරුදු වලට අපේ හිත ඇබ්බැහි වෙලා ඇද්ද? මේ කය කොයි තරම් පුරුදු වලට ඇබ්බැහි වෙලා ඇද්ද? ඒකනේ අපිට මේක තේරුම් ගන්න අමාරු වෙලා තියෙන්නේ.

මේ වගේ අපේ ජීවිතය තුළ පවත්වනවා **කාම තණ්හා**. මේ කාමයන් කෙරෙහි ආසාව පවත්වනවා. **භව තණ්හා** - මේ පැවැත්ම

කෙරෙහි ආසාව පවත්වනවා. සමහර කෙනෙකුට ඒ ආසා වලින් තොරව ආසාවක් ඇතිවෙනවා. **විභව තණ්හා**. නො පවතින්න තියෙන ආසාව. නො පවතින්න තියෙන ආසාව තියෙන එක්කෙනාට ඒ ආසාව මුල්කරගෙන උපාදාන හැදෙනවා. අත්තවාද උපාදාන. අත්තවාද උපාදාන මුල්කරගෙන එයා මොකක් හරි වැඩපිළිවෙලක යෙදෙනවා. එතකොට එයාට හැදෙනවා අරූප භවය. එතකොට කොහෙද එයා උපදින්නේ? අරූප භවයේ. කාම තණ්හාව තිබුනත් උපාදාන - භවය හැදෙනවා. භව තණ්හාව තිබුනත් උපාදාන - භවය හැදෙනවා. විභව තණ්හාව තිබුනත් උපාදාන භවය හැදෙනවා. එහෙනම් මේ තණ්හා තුනෙන් ම කරන්නේ උපාදානයක් හදලා දෙන එක. එතකොට ඒ උපාදානයෙන් කරන්නේ භවයක් හදලා දෙන එක. භවයෙන් කෙරෙන්නේ උපතක් කරා යන එක.

එතකොට බුදුරජාණන් වහන්සේගේ දේශනා වල තණ්හාව ගැන පුදුම විස්තර තියෙනවා. උන්වහන්සේ දේශනා කරනවා, " මහණෙනි, මේ තණ්හාව කවදාවත් විඳල ඇති වෙන එකක් නෙවෙයි." දැන් අපි රූප බලල "දැන් ඇති, ආයෙ ඕනෙ නෑ" කියල තෘප්තියකට පත්වෙන්නෙ නෑ. **රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්මා තණ්හා** කෙරෙහි තෘප්තියකට පත්වෙන්නෙ නෑ. සමහරු වයසට යනකොට කැමැතියි ඉක්මනට මැරෙන්න. ඇයි ඒ? ආයෙමත් මේ කාම ජීවිතය පටන් ගන්න. මොකද මේ හිතේ තියෙන ස්වභාවය තමයි, ඇතිවෙන්නෙ නෑ. ඇතිවෙනව නම් අපි මේ කාලා තියෙන කෑම අපේ මේ රස තෘෂ්ණාව නැති වෙන්න හොඳට ම ප්‍රමාණවත්. අපි බලල තියෙන දේවල්, අපි අහල තියෙන සිංදු, දිවට දැනෙන රස, කයට දැනෙන පහස මේ එකකින් අපේ ජීවිතය තුළ ඇතිවීමක් වෙන්නෙ නෑ. ඒක තමයි තණ්හාවේ ලක්ෂණය.

බුදුරජාණන් වහන්සේ පෙන්වනවා, තණ්හාව උපමා කරලා සාගරයට. සාගරයට නිරන්තරයෙන්ම ගංගා වලින් ජලය ගලනවා. නමුත් සාගරය උතුරන්නෙ නෑ. අපි නිරන්තරයෙන් ම ඇහෙන් අරමුණු ගන්නවා, කණෙන් අරමුණු ගන්නවා, නාසයෙන් අරමුණු ගන්නවා, දිවෙන් අරමුණු ගන්නවා, කයින් අරමුණු ගන්නවා. මනසින් අරමුණු ගන්නවා, නමුත් ඇතිවීමක් සිද්ධ වෙන්නෙ නෑ.

අපි හිතමු හොඳට රසට කෑමක් හදාගෙන හොඳට බඩ පිරෙන්න කෑවා. බඩ පිරිලා තියෙන නිසා එපා වෙනව මිසක් කෑම ගැන අවබෝධ වෙලා එපා වෙනව ද? නෑ. "දැන් ඉතින් ඇති, ආයෙනම් මේ කෑම එපා." එහෙම එකක් වෙන්නෙ නෑ. අප්පිරිය වෙනකම් ම කෑවා කියමු. ඒත් දවසක් දෙකක් අප්පිරිය යි. ආයෙ ඕක මතක නැතිව යනවා. ආයෙමත් අර ආසාව එනවා. පුදුම එකක් මේ තෘෂ්ණාව කියන්නේ.

බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ සත්වයා තණ්හාවට බැඳෙන්නේ වඳුරු පැටියෙක් කොහොල්ලෑ බඹාට අහුවුනා වගේ කියලා. ඉස්සර දඩයමේ යන මිනිස්සු වඳුරන් ව අල්ලන්න කොහොල්ලෑ වලින් බඹෙක් හදලා ගහක අලවලා තියෙනවා. වඳුරු පැටියෙක් එනවා. දැන් වැද්දා මේක කරන්නේ වඳුරු පැටියව අල්ලගන්නයි. වඳුරු පැටියා ඇවිල්ලා කොහොල්ලෑ බඹා දිහා බලලා අතින් ගහනවා. එතකොට ඒ අත ඇලෙනවා. ඒ අත ගලව ගන්න අනිත් අත තද කරනවා. එතකොට මොකද වෙන්නේ? ඒක ඇලෙනවා. අත් දෙක ගලව ගන්න කකුලෙන් තල්ලු කරනවා. කකුල ඇලෙනවා. ඊට පස්සේ මොකද වෙන්නේ අනිත් කකුලෙන් තල්ලු කරනවා. ඒක ඇලෙනවා. අත් දෙක යි කකුල් දෙක යි ගලව ගන්න ඔලුවෙන් අනිනවා. එතකොට වැද්දා ඇවිල්ලා අල්ලගන්නවා.

බුදුරජාණන් වහන්සේ වදාළා, අන්න ඒ වගේ තමයි මහණෙනි, මේ මාරයාගේ තොණ්ඩුව තමයි කාමය. සත්වයා රූපයට අලවලා තියෙන කම්, ශබ්දයට අලවලා තියෙන කම්, ගඳ සුවඳට අලවලා තියෙන කම්, රසයට අලවලා තියෙන කම්, පහසට අලවලා තියෙන කම් ජරා මරණ විතරයි ලැබෙන්නේ. මාරයාගේ වසඟයේ කියනවා එයා ඉන්නේ. එයා ඒකෙන් එතෙර වෙන්නේ නෑ කියනවා. බලන්න මේ තණ්හාව මනුස්සයාගේ ජීවිතයට බලපාන තාලේ.

බුදුරජාණන් වහන්සේ විස්තර කරනවා මේක ජීවිතයට එකතු වෙලා තියෙන්නේ වැලක් එතිලා තියෙනවා වගේ කියලා. වැලක් වගේ එතිලා තියෙනවා කියනවා තණ්හාව. බුදුරජාණන් වහන්සේ විස්තර කරනවා හිමාලයේ තියෙනවා වැල් ජාතියක්

මාලුවා වැල් කියලා. මාලුවා වැල ගහේ එතෙනවා. ගහේ එතෙන්නේ ගහේ යහපතට නෙවෙයි. මාලුවා වැලේ කොළය හැදෙන්නේ ගොට්ට වගේ, උඩ අතට. පහලට නෙවෙයි. වැස්සහම වතුර ගොටුවල පිරෙනවා. පිරුනට පස්සේ ගහට ඔරොත්තු දෙන්නෙ නෑ. ඊට පස්සේ ඒ ගහ කඩාගෙන වැටෙනවා. බුදුරජාණන් වහන්සේ වදාළා, මිනිස්සුන්ගේ ජීවිතය තුළ තණ්හාව බලපවත්වන්නේ අර ගහ ඔතාගෙන ඉන්න මාලුවා වැල වගේ කියලා. ඊට පස්සේ දුක තමයි කියනවා එයාගේ ජීවිතයට පිරෙන්නේ. ඊට පස්සේ කඩාගෙන වැටෙනවා.

බුදුරජාණන් වහන්සේ විස්තර කරනවා තණ්හාව ඇති කල්හි උපාදාන ඇත. උපාදාන ඇති කල්හි භවය ඇත. භවය ඇති කල්හි ඉපදීම ඇත. ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත. එතකොට බලන්න, අපේ ජීවිතය තුළ මේ තරම් බරපතල සිද්ධියක් සිදුවෙනවා කියන කාරණය අපි දන්නෙ නෑ. එතකොට බුදුරජාණන් වහන්සේ විස්තර කරපු පටිච්ච සමුප්පාදය අපි නිකම් කියවගෙන යනවා, **අවිජ්ජා පච්චයා සංඛාරා....** කියල අපි නිකම් පාඩමෙන් කියාගෙන ගියාට අපි දන්නව ද මේ වගේ ලොකු කතන්දරයක් විස්තර වෙනවා කියලා. එතකොට අපි තේරුම් ගන්න ඕනෙ තණ්හාව මුල්වෙලා තමයි අපේ ජීවිතය සම්පූර්ණයෙන් ම දුක කරා යන්න සකස් වෙලා තියෙන්නේ.

දැන් බුදුරජාණන් වහන්සේ මේ තණ්හාවේ ස්වභාවය විස්තර කරනවා. **(යායං තණ්හා පෝනෝභවිකා)** ආයෙමත් භවයක් හදල දෙන්න ඕන කරන දේ හැදෙන්න පටන් ගන්නේ තණ්හාවෙන් තමයි. යම් තණ්හාවක් ඇද්ද පුනර්භවය ඇති කරන **(නන්දිරාග සහගතා)** ආශ්වාදයෙන් ඇලෙන, **(තත්‍රතත්‍රාභි නන්දිනී)** ගිය ගිය තැන ඇලෙන. ගිය ගිය තැන ඇලෙනවා. ගිය ගිය තැන ඇලෙන්නෙ නැද්ද අපි? ඇලෙනවා. අපි මැරෙනකොට තණ්හාව දාල ද යන්නේ? නෑ. අරගෙනයි යන්නේ. අපි පෙරේත ලෝකේ ඉපදුනොත්. ඒවට ඇලෙනවා. අපි බල්ලො, බළල්ලු, ඌරො, කුකුල්ලු වුනොත්, අපි ආසා කරනවා අසූචි වලට.

බුදුරජාණන් වහන්සේ පෙන්වල දෙනවා මේ සත්ව ලෝකයේ ඉන්නවා කියනවා අසූචි ගඳ ආපු ගමන් ඉව කර කර ගිහිල්ලා

අහුවෙච්ච ගමන් කාල දාන සත්තු. ඒ ලෝකෙට යනවා මිනිස්සු මැරිලා. සමහරු උපදිනවා කාක්කෝ වෙලා. එතකොට ඒ තණ්හාව එතන පවත්වනවා. සමහරු ගිහිල්ලා උපදිනවා බල්ලො බළල්ලු වෙලා. සමහරු උපදිනවා නයි පොළොංගු වෙලා. සමහරු උපදිනවා සිංහයෝ - කොටි වෙලා. ඒ අවස්ථාවෙදි පවත්වනවා. ගිය ගිය තැන සතුටින් අභිනන්දනය කරනවා.

එතකොට මොකක්ද මේ තණ්හාවේ ස්වභාවය. **කාම තණ්හා** - කාමයන්ට ආසා කරනවා. **භව තණ්හා** - භවයට ආසා කරනවා. **විභව තණ්හා** - නො පැවැත්මට ආසා කරනවා. යම් ජීවිතයක මේ ත්‍රිවිධ තණ්හාවෙන් එක තණ්හාවක් හරි ඉදිරිපත් වෙච්ච ගමන්, මුල් වෙච්ච ගමන් ඒ තණ්හාව හේතුවෙන් උපාදාන ඇතිවෙනවා. දැන් ඔබට තේරෙනව ද උපාදාන කියන එකේ තේරුම? ආසාවක් ඇති වෙච්ච දේට තමයි අපි බැඳිලා යන්නේ. ආසාවක් ඇතිවුනේ නැත්නම් බැඳිලා යන්නේ නෑ. සමහර විට ඒ බැඳීම් ආත්මභාව ගාණක් එයා විඳෝනව. අතඅරින්නේ නෑ. සමහරු බැඳෙනවා ගෙවල් දොරවල් වලට, ඉඩකඩම් වලට. මැරුණට පස්සේ පෙරේතයෝ වෙලා උපදිනවා. ඒවා තමයි බැඳීම්.

මම දන්න නෝනා කෙනෙක් ඉන්නවා, ඒ නෝනට ඇතිවෙනවා බඩේ අමාරුවක්. ඒ නෝනට හොයාගන්න බෑ මොකක්ද මේකට හේතුව කියලා. බෙහෙත් කරනව, බෙහෙත් කරනවා ඒත් හොයාගන්න බෑ. පස්සේ බඩේ ඇතිවෙන්නේ කැක්කුමක්. ඒ කැක්කුම ඇතිවෙන්නෙ රෑට. රෑට මෙයාට තේරෙනවලු මෙයාගේ ගුද මාර්ගය දිගේ සුළඟක් ඇතුළු වෙනවා. ඊට පස්සේ බඩ මිරිකනවා වගේ. මෙයා විවාහ වෙලත් නෑ. දැන් වයසයි. අවුරුදු ගාණක් දුක් විඳලා. මෙයා භාවනා කරන්න පටන් ගත්තා මේකෙන් බේරෙන්න. භාවනා කරන එකත් මෙයාට හරියට කරගන්න ලැබිලා නෑ. ඊට පස්සේ වෙන කවුරු හරි භාවනා කරන යෝගියෙක් මෙයාට හම්බ වෙලා බැලුවාම මොකක්ද කියලා, භූතයෙක් ඇතුල් වෙලා. කවුද මේ භූතයා? පෙර භවයේ බඳින්න හිටපු එක්කෙනා. ඒ මහත්තයා කියනවලු මම ඔයාට ආදරෙයි. මම ඔයාව අතඅරින්නේ නෑ. එයා මම පතාගෙන ආවේ. අර භූතයා බඩට ඇවිල්ලා හපනවා. ආදරේට. දැන් එයා මේකෙන් විඳවනවා.

මා ගාවට ඇවිත් මොකක් හරි විස්තර කරන වෙලාවක දි, මෙයා මේක කියන්න පොල්ගහවෙලට ඇවිත්. ස්වාමීනී මට මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. මම මෙහෙම විඳවනවා. සංසාරෙ තිත්ත වෙලා තියෙන්නේ. මගේ ජීවිතයේ ඔක්කොම බිඳ වැටිලා තියෙන්නේ මේ ප්‍රශ්නය නිසා. ඒත් අර භූතයාට මේක කොච්චර කිව්වත් තේරෙන්නේ නෑ. අතඅරින්නේ නෑ එයා. එයා කියනවලු අවුරුදු දාහක් හරි මම ඔයාගේ පස්සෙන් එනවා කියලා.

දැන් අපිට මේක තේරෙන්නෙ නෑ. යම්කිසි බැඳීමක් හටගත්තට පස්සේ, ඒ බැඳීම හටගන්න මුල්වුනේ මොකක් ද? අවිද්‍යාවනෙ. මතකද භවය විස්තර කරපු තැන දි අපි ඉගෙන ගත්තා, **(අවිජ්ජා නීවරණානං සත්තා තණ්හා සංයෝජනානං)** අවිද්‍යාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු. ඒ කියන්නේ ආසාවක් බලපවත්වන වෙලාවට ඒකට ඇදිලා යනවා මිසක් ඒකට බැඳෙනවා මිසක් වෙන මොකුත් හිතෙන්නේ නෑ. සමහර අය ඉන්නවා මේ වගේ අසාමාන්‍ය දුර්වල මානසික මට්ටම් තියෙන.

ඒකෙ තව දෙයක් තියෙනවා. කලින් ජීවිතයේ බඳින්න හිටපු එක්කෙනාට අකමැත්තෙන් මෙයා වෙන කෙනෙක් ව බැන්ඳා. ඊට පස්සේ මෙයා අරයා නැති ශෝකයෙන් දිවි නසාගෙන. දැන් අර ලෝකය ඉවර වෙලා මෙයාට ආයෙමත් මනුස්ස ලෝකය හම්බවෙලා. අරයා භූතයෙක් වෙලා. පුදුම වැඩේ කියන්නේ, මේ බැඳීම ඇතිවුනාට පස්සේ කොයි ලෝකෙ හිටියත් ඕක හොයාගන්නවා. ඒක කොහොම වෙනවද කියන්න අපට තේරෙන්නේ නෑ. දැන් අපි හිතමු එයා ඉන්නේ මෙහෙ කියලා. භූතයා ඉන්නේ ඉන්දියාවේ කියමු. භූතයා එන්නේ මෙයා හොය හොයා නෙ. භූතයා කොහොමහරි හොයාගන්නවා මෙයාව. එතකොට බලන්න මේ තණ්හාව බලපවත්වපුවාම වෙන විදිහ.

අපේ ජීවිතයේ අපි අභ්‍යන්තර හිතේ පිරිසිදුකම ගැන සැලකිලිමත් වෙන්නේ නෑනෙ. අපි සැලකිලිමත් වෙන්නේ අපේ ශරීරයේ පිරිසිදුකම ගැන විතරනේ. ශරීරය අපිරිසිදු වුනොත් අපි සැලකිලිමත් නෙ. දහඩිය ටිකක් තිබුනොත්, කුණු ගෑවුනොත්, කබ ආවොත්, සොටු ආවොත්, කට ගඳ ගහනව නම්, අපි හරි කල්පනාවෙන් සොද ගන්නවා, පිරිසිදු කරගන්නව. නමුත් හිත

අපිරිසිදු වෙනකොට එහෙම කලබල වෙන්නෙ නෑනේ. බරපතල ප්‍රශ්නේ හැදෙන්නේ අපිරිසිදු වෙච්ච හිත මුල්කරගෙන. තණ්හාවනෙ බලපවත්වන්නේ. මේ තණ්හාව තනිකර ම මානසික එකක්. ඒකත් එක්ක තමයි මේක සිද්ධ වෙන්නේ.

ඉතින් පින්වත්නි, පටිච්ච සමුප්පාදය දැන් අපි ඉගෙන ගත්තේ කොටසක්. බුදුරජාණන් වහන්සේ හරි ලස්සනට මේක තෝරලා දෙන්නේ අග ඉදල නුවණින් විමස විමස බලන්න කියල. බලනකොට මේ ප්‍රශ්න ඔක්කොම අපිට තියෙනවා. දැන් අපිට ජරා-මරණ තියෙනවා. ඉපදීම නැද්ද අපිට? අපි ඉපදිලා නෙ ඉන්නෙ. ඇස, කණ, නාසය, දිව, කය, මනස තියෙනවනෙ. ඉපදීම කියන කාරණය තියෙනව දැන්. භවය නැද්ද? අපි මේ කාම භවයෙනෙ ඉන්නේ. කාම භවයෙ පිහිටලා අපි දැන් ඔය කරන්නේ. කර්ම රැස් කරන්නේ.

උපාදාන නැද්ද? තියෙනවා. දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන සෝතාපන්න වෙනකොට ප්‍රහාණය වෙනවා. ඊට පස්සේ ඉතිරි වෙන්නේ උපාදාන දෙකයි. කාම උපාදාන, අත්තවාද උපාදාන. කාම උපාදාන ප්‍රහාණය වෙනවා අනාගාමී වෙනකොට. අත්තවාද උපාදාන ප්‍රහාණය වෙනවා අරහත්වයේ දී. එහෙම තමයි උපාදාන නැතිවෙන්නේ. රහතන් වහන්සේට කාම උපාදානත් නෑ, දිට්ඨි උපාදානත් නෑ, සීලබ්බත උපාදානත් නෑ, අත්තවාද උපාදනත් නෑ. නැතිවෙන්න හේතුව තමයි තණ්හාව නැති වීම. තණ්හාව නැතිවෙන්න හේතුව අවිද්‍යාව නෑ.

කාම උපාදානත් නැත්නම්, දිට්ඨි උපාදානත් නැත්නම්, සීලබ්බත උපාදානත් නැත්නම්, අත්තවාද උපාදානත් නැත්නම් කාම භවයත් නෑ. රූප භවයත් නෑ. අරූප භවයත් නෑ. ඒ කියන්නේ විපාක පිණිස කර්ම නෑ. කුඹුරත් නෑ. පැළවෙන්න බීජ ත් නෑ. වතුරත් නෑ. පිහිටන්න චේතනාවකුත් නෑ. පිරිනිවන් පානවා. හේතු ඵල දහම හැදෙනකොට පිරිනිවන් පාන්නේ නෑ. ආයෙ ආයෙමත් එයා උපතක් කරා යනවා. ඒ වගේ භයානක සංසාරෙකට අපි වැටිලා ඉන්නේ.

මේ ජීවිතයේ ප්‍රශ්නය හරියට ම දන්නවා නම් එයා කොහොමද කරන්න ඕනෙ? බුදුරජාණන් වහන්සේ දේශනා

කරනවා, හිස ගිනිගත්ත කෙනෙක් ඒ ගින්න නිවන ලෙස මේ ධර්මය අවබෝධ කරගන්න හිත යොදන්න කියනව. සෝතාපන්න වුනොත් සියයට අනූ නවයක් විසඳිලා. ඉතින් ඒ අවස්ථාව තමයි අහිමි කරගන්නෙ නැතිව අපේ ජීවිත වලට ලබාගන්න තියෙන්නේ. ඒ සඳහා සියලු දෙනාට ම වාසනාව උදාවේවා!

# දුක පිණිස හේතු ඵල දහමේ සකස් වීම

## -පටිච්ච සමුප්පාදය 2-

***ගරුතර මහා සංඝයා වහන්ස,***
***ශ්‍රද්ධාවන්ත පින්වත්නි,***

අපි දැන් ඉගෙන ගන්නේ ආර්ය න්‍යාය ගැන. ආර්ය න්‍යාය හැටියට අපට ඉගෙන ගන්නට තියෙන්නේ පටිච්ච සමුප්පාදය පිළිබඳවයි. ඒකෙදි අපි මූලික කොටසේ දී ඉගෙන ගත්තා පටිච්ච සමුප්පාදයේ හට ගැනීම විතරක් ඉගෙන ගෙන සම්පූර්ණ වෙන්නේ නෑ කියලා. පටිච්ච සමුප්පාදය හට ගන්නේ කොහොමද? පටිච්ච සමුප්පාදය නැතිවෙන්නේ කොහොමද? කියන මේ දෙක ගැන ම හොඳ අවබෝධයක් ඇති වුනොත්, එයා ආර්ය න්‍යාය දන්නවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කළා මේ **පංච භයවේර** කියන සූත්‍රයේ දී යම් දවසක ආර්ය ශ්‍රාවකයා බුදුරජාණන් වහන්සේ පිළිබඳව නො සෙල්වෙන පැහැදීමට ඇවිල්ලා, ධර්මය ගැන නො සෙල්වෙන පැහැදීමට ඇවිල්ලා, ආර්ය ශ්‍රාවක සංඝයා කෙරෙහි නො සෙල්වෙන පැහැදීමට ඇවිල්ලා, ආර්යකාන්ත සීලයෙන් යුක්ත වෙලා, අර භය වෛර ඇති වෙන කරුණු පහ සංසිඳවාගෙන, ඒ කියන්නේ පංච දුෂ්චරිතයෙන් මිදිලා, ආර්ය න්‍යායෙන් පටිච්ච සමුප්පාදය ඇතිවෙන්නේ මෙහෙමයි, නැතිවෙන්නේ මෙහෙමයි

කියලා දැනගත්තා නම්, එයා තමන්ව ම තමන් අඳුනනවා. කොහොමද තමන් ව අඳුනගන්නේ? මම නිරයෙන් මිදිච්ච කෙනෙක්. මම තිරිසන් අපායෙන් මිදුන කෙනෙක්. පෙරේත ලෝකයෙන් මිදුන කෙනෙක්. මම අපායට යන්නෙ නැති එක්කෙනෙක්. මම නියත වශයෙන් ම මේ බුද්ධ ශාසනයේ ධර්මය අවබෝධ කරගන්න කෙනෙක්. මම ආර්ය අෂ්ටාංගික මාර්ගයට ආපු එක්කෙනෙක්. මම සෝතාපන්න වෙච්ච ශ්‍රාවකයෙක් කියලා තමන් තමන්ව අඳුනාගන්නවා. ඒකයි මේ දේශනාවේ විස්තර වෙන්නේ.

එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ කොහොමද? තමන් තමන්ව අඳුනගන්නවා. එහෙනම් ඒ ගැන සැකයක් ඇති වෙන්න විදිහක් නෑ. මීට කලින් අපි ඔබට ඉගෙන ගැනීමට සැලැස්සුවා ආර්ය න්‍යාය අවබෝධ කරගන්නේ කොහොමද කියලා. මේකෙදි බුදුරජාණන් වහන්සේ විස්තර කරපු ක්‍රමයක් මම ඔබට කිව්වා මතක තියාගන්න කියලා, **'ඉති ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති.'** මොකද ඒක තමයි පටිච්ච සමුප්පාදය පුරාම පාවිච්චි කරන්න තියෙන න්‍යාය. ඒ න්‍යාය තුළ තමයි අපිට සම්පූර්ණයෙන් ම නුවණින් විමසන්න තියෙන්නේ. ඒක අපි සිංහලෙන් ඉගෙන ගත්තා "මෙය ඇති කල්හි මෙය වේ. මෙය උපදින විට මෙය උපදී." මේ න්‍යාය හරියට ගලපගන්න පුළුවන් නම් පටිච්ච සමුප්පාදයට එයාට හොඳට පටිච්ච සමුප්පාදය තේරුම් ගන්න පුළුවන්. ඊළඟ කොටස හැටියට අපි ඉගෙන ගත්තා **'ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති.'** "මෙය නැති කල්හි මෙය නැත. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ". මේක අවබෝධ කර ගැනීමෙන් පටිච්ච සමුප්පාදය නිරුද්ධ වී යන ආකාරයට හොඳට තේරුම් ගන්න පුළුවන්. හටගැනීමත් නැතිවීයාමත් අවබෝධ කර ගැනීමේ දී ඔය න්‍යාය තමයි සම්පූර්ණයෙන් ම භාවිතයට ගන්නේ. එතකොට එයා ඒ තුළ අවබෝධ කරගන්නේ **(ධම්මට්ඨිති - ධම්මනියාම)** පටිච්ච සමුප්පාදයට බුදුරජාණන් වහන්සේ වදාළ වචනය. පටිච්ච සමුප්පාදය තුළින් එයා දකින්නේ අනිත්‍ය වූ දෙයක්, දුක් වූ දෙයක්, අනාත්ම වූ දෙයක් පවතින හැටි. ඒ වගේ ම අනිත්‍ය වූ, දුක් වූ, අනාත්ම වූ දේ නැතිවෙන හැටි. එතකොට තමයි මේක 'මම'

කියල කෙනෙකුගේ ක්‍රියාකාරීත්වයක් නොවෙයි, සිද්ධි ගොඩක් සිද්ධවේගෙන යනවා. එතකොට ඒක තමයි අපි වීරියෙන්, නුවණින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කරලා ඒ සිද්ධිදාමය තමයි බිඳලා දාන්නේ. කෙනෙක් ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කරලා නැතිකරලා දාන්නේ මේ පටිච්ච සමුප්පාදය. ආර්ය අෂ්ඨාංගික මාර්ගය දියුණු වෙන කොට පටිච්ච සමුප්පාදය නැතිවෙනවා. එහෙම තමයි ධර්මයේ තියෙන වැඩපිළිවෙල.

එතකොට මේක හරි සියුම් දෙයක්. බොහොම නුවණින් කල්පනා කරලා තේරුම් ගන්න ඕනෙ දෙයක්. එතකොට පටිච්ච සමුප්පාදය මා ඔබට කිව්වා මතක ද? අපි මේක කටපාඩමින් දැන ගත්තොත් සිහි කරන්න ලේසියි කියලා. ඒ වගේ ම මම ඔබට කියා දුන්නා බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඉගෙනගන්න ආකාරය. මේක නිකම් මේ කණින් අහලා අනිත් කණින් අතහරින එකක් නෙවෙයි කියලා. අපි මේ ධර්මය හොඳට අහගන්නවා. ඒකට අපි මොකක් ද කිව්වේ? **සුතා**. ඒ අහගත්තු ධර්මය මතකයේ දරා ගන්නවා. ඒකට මොකක්ද අපි කිව්වේ? **ධතා**. ඒ මතකයේ දරා ගත්තු ධර්මය වචනයෙන් ප්‍රගුණ කරනවා. ඒකට මොකක්ද අපි කිව්වේ? **වචසා පරිචිතා**. වචනයෙන් ප්‍රගුණ කරන්නා වූ ධර්මය නුවණින් මෙනෙහි කරනවා. **මනසානුපෙක්ඛිතා**. මනසින් මෙනෙහි කරන්නා වූ ධර්මය අවබෝධ කරගන්නවා. **දිට්ඨියා සුප්පටිවිද්ධා**. මේක තමයි බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඉගෙන ගන්න ක්‍රමය. ඒ ක්‍රමයට මේ ධර්මය ඉගෙන ගන්න කෙනෙකුට මේ ධර්මය අවබෝධ කරගන්න පුළුවන්. ඒ ක්‍රමයට ධර්මය ඉගෙන ගන්නෙ නැත්නම් ධර්මය අවබෝධ වෙන්නෙ නෑ.

එතකොට අපි ඉගෙන ගත්තා පටිච්ච සමුප්පාදය මතක තියෙන්න ඕනෙ කියලා. කොහොමද පටිච්ච සමුප්පාදය අපි ඉගෙන ගත්තේ? **"අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං, සෝක පරිදේව, දුක්ඛ දෝමනස්සුපායාසා සම්භවන්ති. ඒව මේ තස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති."** ඔය කොටස දන්නව

නම්, ඔය කොටසට කියන්නේ පටිච්ච සමුප්පාදයේ හට ගැනීම ගැන විස්තරය. ඒක එක කොටසක්. ඒක දැනගත්තා කියලා පටිච්ච සමුප්පාදය සම්පූර්ණයෙන් ම දැනගන්නේ නෑ.

එයා දැනගන්න ඕනෙ ඒකේ නැතිවීම. **"අවිජ්ජාය ත්වේව අසේස විරාග නිරෝධා සංඛාර නිරෝධෝ, සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ, විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරෝධෝ, නාමරූප නිරෝධා සළායතන නිරෝධෝ, සළායතන නිරෝධා ඵස්ස නිරෝධෝ, ඵස්ස නිරෝධා වේදනා නිරෝධෝ, වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ, තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ, උපාදාන නිරෝධා භව නිරෝධෝ, භව නිරෝධා ජාති නිරෝධෝ, ජාති නිරෝධා ජරා, මරණං සෝක පරිදේව දුක්ඛදෝමනස්සුපායාසා නිරුජ්ඣන්ති. ඒව මේ තස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හෝති."** මේ කොටස අහල මතක තබා ගැනීම තමයි මූලික සුදුසුකම.

දවසක් බුදුරජාණන් වහන්සේ තනියම ඔය පටිච්ච සමුප්පාදයේ සමුදයත් (සමුදය කියන්නේ මේ පටිච්ච සමුප්පාදය හැදෙන ආකාරයත්), පටිච්ච සමුප්පාදයේ නිරුද්ධ වීමත් තනියම කිය කිය හිටියා. එතකොට ඈත හිටපු භික්ෂුවක් අහගෙන හිටියා මේක. බුදුරජාණන් වහන්සේ දැක්කා කවුද ඉන්නවා. බැලින්නම් භික්ෂුන් වහන්සේ නමක් ඉන්නවා. "භික්ෂුව මෙහෙ එන්න" කියල කථා කළා. "මම මොකක්ද කිව්වේ කියලා අහගෙන ද හිටියේ?" කියලා ඇහුවා. "එහෙමයි ස්වාමීනී, කිව්වා" "භික්ෂුව, ඕකට තමයි කියන්නේ පටිච්ච සමුප්පාදය කියලා. මේක හොඳට අහගෙන හිටියද ඉවර වෙනකම්" කියලා ඇහුවා. "එහෙමයි ස්වාමීනී" කිව්වා. "හොඳට මතක තියාගන්න. ඕක තමයි නිවනට මුල." කිව්වා.

එතකොට ඒ පටිච්ච සමුප්පාදය හරියාකාර ලෙස අපි දැනගන්න ඕනෙ. මොකද මේ මාර්ගයේ අපිට යන්න තියෙන්නේ අනුන්ගෙන් අහ අහා නො තේරෙන ගමනක යන්න තියෙනව වගේ නෙවෙයි. අපිට යන්න තියෙන්නේ කරුණු තේරුම් අරගෙන, පාර දැනගෙන යන්න තියෙන ගමනක්. එතකොට ඒකට වුවමනා වෙනවා බුදුරජාණන් වහන්සේගේ ධර්මය නිවැරදිව අහලා, නිවැරදිව තේරුම් ගෙන සිටීම.

අපි ඉගෙන ගත්තා පටිච්ච සමුප්පාදය බුදුරජාණන් වහන්සේ තෝරලා දෙන ආකාරය. තෝරලා දෙන්නේ අපිට ප්‍රශ්නය තියෙන තැන ඉඳන්. අපි ඉගෙන ගත්තා ඒක විස්තර වශයෙන්. අපි කරුණු කීපයක් ඉගෙන ගත්තා. බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාදය විමසන්න බලන්න කිව්වේ කොතනින් ද? ජරා මරණ වලින්. ජරාවට පත් වීම කියල කියන්නේ මොකක්ද? මරණයට පත්වීම කියලා කියන්නේ මොකක්ද කියලා අපි පැහැදිලිව ඉගෙන ගත්තා. ඊට පස්සේ ප්‍රශ්නයක් අපි අහනවා. මොකක්ද ප්‍රශ්නය? කුමක් ඇති කල්හි ද ජරා මරණ ඇති වන්නේ? එතකොට ආර්ය න්‍යායට තමයි අපි දාන්නේ. මෙය ඇති කල්හි මෙය වේ. ඉපදීම ඇති කල්හි ජරා මරණ වේ. ඉපදීම ඇත්නම් ජරා මරණ ඇත. ඊට පස්සේ අපි ඉපදීම ඉගෙන ගත්තා, මෙන්න මේකයි ඉපදීම කියන්නේ කියලා. ඉපදීම ක්‍රම හතරකින් සිදුවෙනවා, අණ්ඩජ - ජලාබුජ - සංසේදජ - ඕපපාතික කියල. යම්කිසි මව්කුසක විඤ්ඤාණය බැස ගත්ත ගමන් එතන ඉඳලා උපත. ඊළඟට ඕපපාතිකව පහළ වෙච්ච ගමන් උපත. ඒකට පාවිච්චි කරපු පාළි වචන ඉගෙනගත්තා. ඉපදීම තියෙන තාක් ජරා මරණ වලට මුහුණ දෙන්න වෙනවා. මොකද හේතුව? අපි අර ආර්ය න්‍යායෙන් ගලපලා බලන්නේ. මෙය ඇති කල්හි මෙය වේ. ඉපදීම ඇති කල්හි ජරා මරණ වේ. මෙය උපදින විට මෙය උපදී. ඉපදීම කියන එක උපදින කොට ම ජරා මරණ උපදිනවා. එතකොට අපිට ජරාවට පත්වෙන්නෙ නැති, මැරෙන්නෙ නැති, කායික දුක් නැති, මානසික දුක් නැති, සුසුම් හෙලීම් නැති උපතක් බලාපොරොත්තු වෙන්න බෑ. මොකද හේතුව, මෙය ඇති කල්හි මෙය වේ කියන ධර්මතාවය තියෙනවා එතන. ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත.

ඊළඟට අපි ආයෙ ප්‍රශ්නයක් ඇහුවා. මොකක් ද ප්‍රශ්නය? කුමක් ඇති කල්හි ද ඉපදීම ඇති වන්නේ? මෙය ඇති කල්හි මෙය ඇත. භවය ඇති කල්හි ඉපදීම ඇත. එතකොට භවය කියන වචනය බුදුරජාණන් වහන්සේ තෝරපු ආකාරය අපි ඉගෙන ගත්තා. ඒ කොටස තිබුනේ අංගුත්තර නිකායේ 1 වැනි පොතේ. අපි ඉගෙන ගත්තා ආනන්ද හාමුදුරුවො බුදුරජාණන් වහන්සේගෙන් භවය ගැන ප්‍රශ්න කළා. කොහොමද ප්‍රශ්න කළේ?

"ස්වාමීනී, භවය, භවය කියනවා, මොකට ද මේ භවය කියලා කියන්නේ?" එතකොට බුදුරජාණන් වහන්සේ උත්තර දුන්නා, " කාම ධාතුවේ විපාක විඳීම පිණිස කර්ම සකස් වෙන්නේ නැත්නම්, කාම භවයක් තියෙනවා ද?" කියලා ඇහුවා. එතකොට ආනන්ද හාමුදුරුවෝ උත්තර දුන්නා, "නෑ ස්වාමීනී" කියලා. එතකොට බුදුරජාණන් වහන්සේ විස්තර කළා, "(**ඉති ඛෝ ආනන්ද, කම්මං ඛෙත්තං**) ඒ නිසා ආනන්දය, කර්මය තමයි කුඹුර. (**විඤ්ඤාණං බීජං**) විඤ්ඤාණය තමයි බීජය. (**තණ්හා සිනේහෝ**) තණ්හාව තමයි වතුර. (**අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයෝජනානං**) අවිද්‍යාවෙන් වැහුණු, තණ්හාවෙන් බැඳුණු සත්වයාගේ (**හීන ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං, පත්තනා පතිට්ඨිතං, චේතනා පතිට්ඨිතං**) හීන ධාතුවේ විඤ්ඤාණය පිහිටියා, ප්‍රාර්ථනාව පිහිටියා, චේතනාව පිහිටියා." ඔය විදිහට ම රූප භවයත් අපි තේරුවා. අරූප භවයත් තේරුවා. තෝරලා ඒකේදි අපි පැහැදිලි කරගත්තා, කර්මය කියන එක භවයත් එක්ක සම්බන්ධ කරලා බුදුරජාණන් වහන්සේ කරපු ඒ දේශනාව.

අපි ඉගෙන ගත්තා කර්මය හැමතිස්සේ ම තියෙන්නේ විඤ්ඤාණයේ පැවැත්මට රුකුල් දෙමින්. පොළොව පැළයක් පිහිටන්න, පැලයක් පැලවෙන්න රුකුල් දෙනව වගේ, කර්මය තමයි විඤ්ඤාණය වැඩෙන්න, පැලවෙන්න, මුල් අදින්න රුකුල් දෙන ප්‍රධාන ම එක. පොළොව කොහොම තිබ්බත්, පැළය කොහෙම තිබ්බත් වතුර නැත්නම් පැළය මැරෙනවා. ඒ වගේ විඤ්ඤාණය පැළවෙන්න සම්පූර්ණයෙන් ම උදව් දෙන්නේ තණ්හාව.

ඊට පස්සේ අපි භවය ඉගෙනගෙන, ආයෙමත් අර ප්‍රශ්නේ මතුකළා. කුමක් ඇති කල්හි ද භවය තිබෙන්නේ? එතකොට මෙය ඇති කල්හි මෙය වේ. අපි ඉගෙන ගත්තා උපාදාන ඇති කල්හි භවය ඇත. උපාදාන උපදින විට භවය උපදී. ඒ කියන්නේ විපාක පිණිස කර්ම හැදෙන්නේ උපාදාන තිබුණොත්. ඊට පස්සේ බුද්ධ දේශනාවේ උපාදාන පැහැදිලි කරලා තියෙන ආකාරය ඉගෙනගත්තා. උපාදාන කීයක් ද? හතරක්. මොනවද ඒ? කාම උපාදාන, දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන, අත්තවාද උපාදාන. අපි මේ උපාදාන කියන වචනය තේරුම් ගත්තා. මොකක්ද ඒකේ

තේරුමෙ? බැඳී යාම. ග්‍රහණය වීම. එතකොට කාමයට ග්‍රහණය වුනොත් කාම උපාදාන. දෘෂ්ටි වලට ග්‍රහණය වුනොත් දිට්ඨි උපාදාන. සීල ව්‍රත වලට ග්‍රහණය වුනොත් සීලබ්බත උපාදාන. මම - මාගේ - මාගේ ආත්මය කියන හැඟීමට ග්‍රහණය වුනොත් අත්තවාද උපාදාන. මේවා අපි විස්තර වශයෙන් ඉගෙන ගත්තා.

ඊළඟට අපි ඉගෙන ගත්තා. කුමක් ඇති කල්හි ද උපාදාන ඇති වන්නේ? මෙය ඇති කල්හි මෙය වේ. තණ්හාව ඇති කල්හි උපාදාන ඇත කියල අපි තණ්හාව ඉගෙන ගත්තා. තණ්හාවට අපි අර්ථ ඉගෙන ගත්තා. හිතේ ආසාව ඇති වීම, හිත ඒවාට ඇදී යාම. හිතේ ඇල්ම හටගැනීම. මේවා තමයි තණ්හාව කියලා කියන්නේ. ඇහින් දකින රූපයට ඇති වෙන තණ්හාව රූප තණ්හා, කණින් අහන ශබ්දයට ඇති වෙන තණ්හාව ශබ්ද තණ්හා, නාසයට දැනෙන ගඳ සුවඳට ඇති වෙන තණ්හාව ගන්ධ තණ්හා, දිවට දැනෙන රසයට ඇති වෙන තණ්හාව රස තණ්හා, කයට දැනෙන පහසට ඇති වෙන තණ්හාව ඵොට්ඨබ්බ තණ්හා, මනසට සිතෙන අරමුණු වලට ඇති වෙන තණ්හාව ධම්ම තණ්හා. අපි මේ තණ්හාව ටිකක් විස්තර කර ගත්තා.

දැන් හිතන්න මෙහෙම. අපි ඇහින් රූපයක් දකිනවා. අපි සාමාන්‍යයෙන් ගහක් දකිනවා. එතකොට අපිට රූප තණ්හාව ඇතිවෙනව ද? නෑ. ඇයි ඒ? ඒ ගහට එච්චර බෑ අපිව වින්දනයට පත්කරවන්න. අපි දකිනවා බොහොම රූපය ලස්සන මනුස්සයෙක්ව. එතකොට මොකද වෙන්නේ? ඒ මනුස්සයාගේ රූපයට අපේ හිත ඇදිලා යනවා. දැන් ඒ මනුස්සයා පස්සට යනවා. එතකොට අපේ ඔලුව කැරකෙනවා. වෙන්නෙ නැද්ද? එතකොට අපි ඇදිලා යන්නේ කෙහේට ද? ඒ දිහාට අපි ඇදිලා යනවා. ඒ කියන්නේ ඇස්දෙකේ වින්දනය හැදෙන්න නම්, අපේ ඇස් ඒ දිහාවට යොමු කරන්න ඕනෙ. අපි හිතලා නෙමෙයි කරන්නේ. ඒ කියන්නේ හිතලා නෙවෙයි වගේ තේරෙන්නේ. ඒ වගේ අපි ක්‍රියා කරනවා.

අපි ශබ්දයක් අහනවා. අහනකොට ඒක අපිට තේරෙන්නෙ නැත්නම්, අපේ භාෂාවෙනුත් නෙවෙයි නම්, ඒකට අපේ අවධානය යොමුවෙනව ද? නෑ. මිහිරි සිංදුවක් ඇහෙනවා. එතකොට අපේ

ඔලුව ඒ පැත්තට හැරෙනවා. ඒ කියන්නේ අපි අහන ශබ්දයට, තණ්හාවට ඕනෙ ආකාරයට ශරීරය හැදෙනවා. හැඟීම් හැදෙනවා. අදහස් හැදෙනවා. ඊට පස්සේ බැඳිලා යනවා.

දැන් අපිට සුවඳ දැනෙනවා. හොඳ සුවඳක් දැනෙන කොට අපි දන්නෙ ම නෑ ඉව අල්ලගෙන යනවා. අපිට ආහාරයක සුවඳක් එනවා. එතකොට මොකද වෙන්නේ? ආහාරයක සුවඳක් ආවට අපේ කටට කෙළ එන්නේ නැත්නම්, ඒකට අපි උනන්දු වෙනව ද? ආහාරයක සුවඳක් එනකොට කය සූදානම් නම්, කටට කෙළ එනවා. අන්න බලන්න කොච්චර මේ කය තණ්හාවට අනුව ද ක්‍රියාත්මක වෙන්නේ.

ස්පර්ශයත් එහෙමයි. කය සූදානම් වෙනවා. හිතට එන අරමුණටත් එහෙමයි. මනසට අරමුණක් ආවා ම ඒ අරමුණට හිත හැදිලා යනවා. එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කළේ තණ්හාව මොකක් වගේ ද? ගහක වැලක් එතිලා තියෙනවා වගේ ඇසේ, කණේ, නාසයේ, දිවේ, කයේ, මනසේ සම්පූර්ණයෙන් ම එතිලා තියෙනවා තණ්හාව. ඒකයි තණ්හාවට බැඳිලා ඉන්නවා කියන්නේ. එතකොට මේ වගේ ජීවිතයක් අපි ගෙවන්නේ. ඔන්න ඔතනට එනකම් අපි ඉගෙන ගෙන තියෙනවා.

දැන් අපි ආයෙ අර ප්‍රශ්නය අහනවා. "කුමක් ඇති කල්හි ද තණ්හාව ඇති වන්නේ?" එතකොට ඒකට උත්තරේ (මෙය ඇති කල්හි මෙය වේ) "විඳීම ඇති කල්හි තණ්හාව ඇත." තණ්හාව කියන එක අපිට තේරෙනවා. විඳීම නිසා තණ්හාව ඇති වෙනවා කියන එක අපි මහන්සියෙන් තේරුම් ගන්න ඕනෙ එකක්. විඳීම නිසා තණ්හාව ඇති වෙනවා කියන එක හොඳට සිහියෙන් ඉඳල ම තේරුම් ගන්න ඕනෙ එකක්. දැන් ඇහෙන් රූපයක් දැක්කහම (අපිට විවිධ රූප පේනවනේ - ගෙවල්, යාන වාහන, ගස් කොළන්, මිනිස්සු) මේ හැම දෙයක් සම්බන්ධයෙන් ම අපේ හිතේ ආසාවට අනුව තෝරාගැනීමක් වෙන්නේ නැද්ද? එහෙම වෙනවා. එතකොට අපේ හිත වැඩියෙන් ම වින්දනයට පත්වුනේ කුමන රූපයකට ද, අන්න ඒකට තමයි අර ඔක්කොම මැද්දෙන් හිත යන්නේ. එහෙම වෙන්නෙ නැද්ද? අපි හිතමු අපි ඇඳුම් වලට යි ආසා. ලස්සන ඇඳුමක් ඇඳගෙන ඉන්නවා එක්කෙනෙක්. අර ඔක්කොම මැද්දෙන්

අපේ හිත එතනට යනවා. අපේ ඇලීම එතනට යනවා. ඒකට හේතුව තමයි බලන කොට අපේ හිත වින්දනයට පත් කරන්න ඒකට පුළුවන්වීම. එහෙනම් විඳීම නිසා තමයි තණ්හාව හටගන්නේ.

අපි ශබ්ද අහනවා. එක එක්කෙනා කතා කර කර ඉන්නවා. ඔය අතරෙ මිහිරි ගීතයක් ඇහෙනවා නම්, අර ඔක්කොට ම වඩා අපේ අවධානය යන්නේ මොකේට ද? ඒකට හේතුව තමයි ඒක ඇසීමෙන් අපේ හිත වින්දනයට පත්වෙනවා. එතකොට අපි සිහියෙන් හිටියොත් තේරුම් ගන්නවා, අපේ හිත සම්පූර්ණයෙන් ම ඇදිලා යන්නේ වින්දනය නිසා කියලා. විඳීම නිසා කියලා. සුවඳටත් එහෙමයි, රසයටත් එහෙමයි.

එතකොට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා විඳීම ගැන. හොඳට මතක තියාගන්න විඳීම කියන වචනය පටිච්ච සමුප්පාදයේ දී තෝරගන්න කොට, බුදුරජාණන් වහන්සේ ඒ වචන පාවිච්චි කරන විදිහ අපි අල්ලගන්න ඕනෙ. එහෙම නැත්නම් අපි ඉගෙන ගන්නව වෙන්න බෑනේ. එතකොට ඒ බුදුරජාණන් වහන්සේ පාවිච්චි කරනවා, මෙන්න මෙහෙම. ඇහේ ස්පර්ශයෙන් ඇතිවෙන විඳීම, කණේ ස්පර්ශයෙන් ඇති වෙන විඳීම, නාසයේ ස්පර්ශයෙන් ඇතිවෙන විඳීම, දිවේ ස්පර්ශයෙන් ඇතිවෙන විඳීම, කයේ ස්පර්ශයෙන් ඇතිවෙන විඳීම, මනසේ ස්පර්ශයෙන් ඇති වෙන විඳීම කියලා විඳීම විස්තර කරනවා.

එතකොට ඇහේ ස්පර්ශයෙන් ඇතිවෙන විඳීම තුන් ආකාරයි. ඇහේ ස්පර්ශයෙන් සැප විඳීම හටගන්නවා. ඇහේ ස්පර්ශයෙන් දුක් විඳීම හටගන්නවා. ඇහේ ස්පර්ශයෙන් උපේක්ෂා විඳීම හටගන්නවා. සමහර අවස්ථාවල රූප දැක්කම අපේ හිත සැපයට පත් වෙනවා. අපිට සතුටක් ඇතිවෙනවා. ඒ සතුටක් ඇති වෙන්න හේතුව සැප වින්දනයක් ඇතිවීම. සමහර අවස්ථාවල දී අපට සතුටක් ඇතිවෙන්නේ නෑ. එක්කෝ තරහක්, එක්කෝ එපාවීමක් ඇතිවෙනවා ඒ රූපය දැක්කා ම. එතකොට ඒ තමයි දුක් විඳීම ඇතිවෙනව. අපට එහෙම විශේෂයක් ඇතිවෙන්නේ නෑ සමහර අවස්ථාවල. එතකොට ඒක උපේක්ෂා වේදනාව. එතකොට කණින් ශබ්දය අහන කොට ඔය තුන් ආකාරයක විඳීම්

වලින් එකකට අපි හැමවිට ම වැටෙනවා. නාසයෙන් ආඝ්‍රාණය කරන කොට ත් ඒක වෙනවා. දිවෙන් රස විඳින කොටත් ඔය තුන් ආකාරයක විඳීම් වලින් එකකට වැටෙනවා. කයට පහස දැනෙන කොට ත් එහෙමයි. සිතට අරමුණු ආවාමත් එහෙමයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අපේ හිත වේගයෙන් ඇදිලා යන්නේ මේවායින් අර ආස කරපු දේට. දැන් බලන්න හිතලා තම තමන්ගේ සිත් ගැන අපේ හිත වැඩිපුර යන්නේ අනාගතයට ද, වර්තමානයට ද, අතීතයට ද? අතීතයට. ඇයි ඒ අපේ හිත අතීතයට යන්න හේතුව? වින්දනයක් සිහි කරන්න. දැන් අපිට දුක් ලැබෙන දේවල් සිහිවෙනවා. වේදනාව ලැබෙන දේවල් සිහිවෙනවා. නමුත් අපි කැමති වින්දනයක් ලැබුන දෙයක් සිහිකරන්න. පුරුදු වුනාට පස්සේ අපිට දුක් ලැබුන දේත් හිත හිතා ඒකෙන් සතුටු වෙනවා. ඉතින් මේකෙන් පේන්නේ අපි හැමතිස්සෙ ම විඳපු දේවල් මත යැපෙනව. නැතිවෙලා ගිය දේවල් මත යැපෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ එතනට යන්න එපා කියලා. අනාගතය මවන්නත් යන්න එපා කියනවා. වර්තමානයේ ඉන්න පුරුදුවෙන්න කියනවා. වර්තමානයේ ඉන්න පුරුදු වුනොත් අපි දකින්නේ වෙනස් වීම විතරයි. අනිත්‍ය විතරයි. එතකොට අපි එහෙම නැතිව පුරුදු වෙච්ච නිසා අපි හැමතිස්සෙම හිතන්නේ ගෙවිච්ච ජීවිතය ගැන, ලබාගන්න බැරිවෙච්ච දේවල් ගැන හිතින් මවාගෙන සතුටු වෙන්න.

එතකොට බුදුරජාණන් වහන්සේ විස්තර කරනවා මේ විඳීම කොයිතරම් වේගයෙන් ද ඇතිවෙන්නේ, ජලාශයකට වැස්සොත් ඒ වැහි බින්දුවක් පාසා ජලාශයට මොකද වෙන්නේ? දිය බුබුළු ඇතිවෙනවා. එක වැහි බින්දුවක් වැටෙන කොට දිය බුබුළක් ඇතිවෙනවා. ඊළඟ වැහි බින්දුව වැටෙන කොට ආයෙ වෙන එකක් ඇතිවෙනවා. ආයෙමත් වැහි බින්දුවක් වැටෙන කොට වෙන එකක් හැදෙනවා. හැබැයි මේ එකක් වත් මොහොතක් වත් තියෙන්නෙ නෑ. මේ විදිහයි කියනවා විඳීමත්. ඇසේ ස්පර්ශයෙන් ඇති වුනත් විඳීම; කණේ ස්පර්ශයෙන් ඇති වුනත් විඳීම; නාසයේ ස්පර්ශයෙන් ඇති වුනත් විඳීම; දිවේ ස්පර්ශයෙන් ඇති වුනත් විඳීම; කයේ ස්පර්ශයෙන් ඇති වුනත් විඳීම; මනසේ ස්පර්ශයෙන් ඇතිවුනත් විඳීම මේ විදිහයි කියනවා.

දැන් අපිට තුවාලයක් වෙනවා. කොන්දේ අමාරුවක් හැදෙනවා. එතකොට අපිට ඇතිවෙන්නේ කයේ ස්පර්ශයෙන් ඇති වෙච්ච දුක් විඳීමක්. අපි හිතාගෙන ඉන්නවා ඒක එකපාරට ම නැති වෙන්න ඕනෙ කියලා. ඒ මොකද හේතුව? අපි දන්නෙ නෑ මේ වේදනාව ස්පර්ශයෙන් හටගන්නවා කියලා. අපි හිතාගෙන ඉන්නේ එකපාරට ම අනිත්‍ය වෙලා යන්න ඕනෙ කියලා. මේක ධර්මතාවයක් හැටියටයි තියෙන්නේ. ඒ කියන්නේ ස්පර්ශය හටගන්නකම් ම විඳීම හටගන්නවා. ඒ ස්පර්ශය වෙනස් වෙලා ගිය දවසට ඒ ස්පර්ශය වෙනස් වෙලා යනවා.

එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කළා සම්පූර්ණයෙන් ම විඳීමෙන් තමයි තණ්හාව හටගන්නේ. දිගටම යනකොට මේකෙ පදනම හොයාගන්න අපට පුළුවන්. බුද්ධ දේශනාවේ මේක ලස්සනට පැහැදිලි කරනවා. මේ විදිහේ විඳීමකට පුරුදුවුනාට පස්සේ **(ඉමස්මිං සති - ඉදං හෝති)** මෙය ඇති කල්හි මෙය ඇත. විඳීම ඇති කල්හි තණ්හාව ඇත. තණ්හාව ඇති කල්හි උපාදාන ඇත. උපාදාන ඇති කල්හි භවය ඇත. භවය ඇති කල්හි ඉපදීම ඇත. ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත.

මේ විදිහට මේක බලන්න පුරුදු වුනා ම ඔබට, අවස්ථාවක් ලැබෙනවා මේ සිද්ධිය විතරක් බලන්න. මේ සිද්ධිය විතරක් නේද මෙතන සිද්ධ වෙන්නේ කියල. අන්න එතකොට තමයි අපිට තේරුම් යන්නේ මේක කාටවත් පැතුමකින් නවත්වන්න බෑ. අණ කරල, මේක මෙහෙම වෙන්න එපා, මේක මෙහෙම වෙන්න කියල නවත්වන්න බෑ. මෙතන තියෙන්නේ හේතුඵල දහමක ක්‍රියාකාරීත්වයක් කියල අවබෝධ කරගන්න පුළුවන්.

මම තව ටිකක් ඔබට තේරුම් කරලා දෙන්නම්. ධර්මයේ උගන්වනවා ශ්‍රද්ධා, සිහිය, වීරිය කියල දේවල්. එතකොට ඒවායින් තමයි ඒක වෙනස් කරන්න තියෙන්නේ. ඒ කියන්නේ හේතු ඵල දහමින් ඇතිවෙච්ච දෙයක් වෙනස් කරන්නේ හේතු වලින් ම යි. අණ කිරීමෙන් නෙවෙයි. පැතුමකින් නෙවෙයි. ආසාවකින් නෙවෙයි. හේතු ඵල දහමින් ඇති වෙච්ච දේවල් වෙනස් වෙන්න නම්, ඊට ප්‍රතිවිරුද්ධ හේතු හැදෙන්න ඕනේ. එතකොට වෙනස් වෙලා යනවා.

දැන් අපි ඉගෙන ගත්තා තුන් ආකාරයක විඳීමක් තියෙනවා කියලා. සැප විඳීම, දුක් විඳීම, උපේක්ෂා විඳීම. බුදුරජාණන් වහන්සේ දේශනා කළා, සැප විඳීමෙදි බොහෝ විට හිතේ හටගන්නේ ආසාව ම යි. දුක් විඳීමෙදි හිතේ හටගන්නේ ගැටීම ම යි. උපේක්ෂා විඳීමේ දි හිතේ හටගන්නේ මුලාව ම යි. දැන් රහතන් වහන්සේගේ විඳීමක් තියෙනවා උපේක්ෂාව කියලා. එතන උපේක්ෂාව කියන්නේ මේක නෙවෙයි. අවබෝධයක් නිසා ඇති වෙච්ච උපේක්ෂාව. දැන් සාමාන්‍ය කෙනෙකුට රූපයක් දැක්කා ම විඳීමක් ඇතිවෙනවා. ඒක සැප සහගත නම්, සැප විඳීම ඇති වෙනවා, දුක් සහගත නම්, දුක් විඳීම ඇතිවෙනවා. එහෙම නැත්නම් විශේෂ වෙනසක් ඇති වෙන්නෙ නෑ. ඒක අවබෝධයක් නෙවෙයි. ඒක විඳීමේ ස්වභාවයක්.

එතකොට බුදුරජාණන් වහන්සේ අපට කියා දීපු පිළිවෙලට, කුමක් ඇති කල්හි ද විඳීම ඇති වන්නේ? **(ඵස්ස පච්චයා වේදනා)** ස්පර්ශය ඇති කල්හි විඳීම ඇත. එතකොට විඳීමක් හැමතිස්සෙ ම තියෙන්නේ ස්පර්ශයක් තිබුනොත් තමයි. තණ්හාවක් තියෙන්නේ විඳීමක් තිබුනොත් තමයි. උපාදානයක් තියෙන්නේ තණ්හාවක් තිබුනොත් තමයි. භවයක් තියෙන්නේ උපාදාන තිබුනොත් තමයි. උපතක් තියෙන්නේ භවයක් තිබුනොත් තමයි. ජරා මරණ තියෙන්නේ උපතක් තිබුනොත් තමයි. මේ විදිහට හොඳට නිරවුල් ව පැහැදිලි කරගන්න ඕනෙ.

එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා විඳීමක් තියෙන්නේ ස්පර්ශයක් තිබුනොත් විතරයි. එතකොට ස්පර්ශය කියලා කියන්නේ කරුණු තුනක එකතුවීම. ඇහින් රූපයක් බැලීමේදී ඇහැයි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. බුදුරජාණන් වහන්සේ බොහොම ලස්සනට ඕක තෝරලා තියෙනවා, සංයුත්ත නිකායේ දුතිය ද්වය කියන සූත්‍රයේ. **(චක්ඛුං ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං)** ඇසත්, රූපයත් හේතු කරගෙන ඇසේ විඤ්ඤාණය උපදී. **(තිණ්ණං සංගති ඵස්සෝ)** ඒ තුනේ එකතුවීම ස්පර්ශය යි. එතන සංගති සමවායෝ කියන වචන පාවිච්චි කරනවා. එකට එකතු වීම, එකට සංකලනය වීම ස්පර්ශය යි කියලා. එතකොට ඇහින් රූපයක් බලන කොට කරුණු තුනක් සංකලනය වෙනවා. ඇසයි, රූපය යි, විඤ්ඤාණය

යි. කණෙන් ශබ්දයක් අසද්දී, නාසයෙන් ආඝ්‍රාණය කරද්දී, දිවෙන් රස විඳිද්දී, කයින් පහස ලබද්දී, මනසින් අරමුණු සිතද්දී කරුණු තුනක් එකතු වෙනවා. මේ එකතුවෙච්ච ගමන් ම සිද්ධ වෙන එකක් තමයි විඳීම. විඳීමක් ඇති වුනා නම් යම් තැනක එතැන තණ්හාවක් හටගන්නවා. තණ්හාවක් හටගත්තා නම් යම් තැනක ඒකට බැඳෙනවා. බැඳුන ද යම් තැනකට විපාක පිණිස කර්මයක් හැදෙන්න දෙයක් එතැන වෙනවා. යම් තැනක විපාක පිණිස කර්ම හැදුන ද එතැන උපතක් හැදෙනවා. උපතක් යම් තැනකද එතැන ජරා මරණ හැදෙනවා.

එතකොට එහෙම නම් ඇහේ ස්පර්ශයෙන් සැප දුක් උපේක්ෂා විඳීම් හටගන්නවා, කණේ ස්පර්ශයෙන් සැප දුක් උපේක්ෂා විඳීම් හටගන්නවා, නාසයේ ස්පර්ශයෙන් සැප දුක් උපේක්ෂා විඳීම් හටගන්නවා, දිවේ ස්පර්ශයෙන් සැප දුක් උපේක්ෂා විඳීම් හටගන්නවා, කයේ ස්පර්ශයෙන් සැප දුක් උපේක්ෂා විඳීම් හටගන්නවා, මනසේ ස්පර්ශයෙන් සැප දුක් උපේක්ෂා විඳීම් හටගන්නවා. මේකෙන් බේරෙන්න බැරි වීම ගැන බුදුරජාණන් වහන්සේ උපමාවක් පෙන්නනවා, හම ගහපු එළදෙන වගේ කිව්වා. ඒ කිව්වේ මේ එළදෙනව හමගහලා, ඊට පස්සේ ලිහලා අරිනවා. දැන් මේ එළදෙන ගිහිල්ලා වතුරට පනිනවා. එතකොට වතුරේ ඉන්න සත්තු මේ එළදෙනව කනවා. ඇයි ඒ? හමගහලා නිසා. දැන් මේ එළදෙන බේරෙන්න ගොඩට එනවා. ඇවිල්ලා ගහකට හේත්තු වුනොත් ගහේ ඉන්න සත්තු එළදෙන කනවා. එළිමහනේ හිටියොත් අවට ඉන්න සත්තු එළදෙන කනවා. බේරෙන්න පුළුවන් ද?

ඒ වගේ තමයි අපට මේ ඇහේ ස්පර්ශයෙන් බේරෙන්න බෑ. ඇහෙන් රූපයක් දකින කොට ම ඇහැ යි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. කණෙන් ශබ්දයක් අහන කොට ම කණ යි, ශබ්දය යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. නාසයෙන් ආඝ්‍රාණය කරන කොට ම නාසය යි, ගඳ සුවඳ යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. දිවෙන් රස විඳින කොට දිව යි, රසය යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. කයෙන් පහස දැනෙද්දී කය යි, පහස යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. මනසට අරමුණක් සිතෙද්දී මනස යි, අරමුණ යි, විඤ්ඤාණය යි එකතු වෙනවා.

මම දැන් ඔබට හොඳට තේරුම් ගන්න කාරණා කීපයක් කියන්නම්. ඇහෙන් රූපයක් දකින කොට ඇහැ යි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වෙනවනෙ. ඒ එකතු වෙච්ච ගමන් තමයි විඳීමක් හටගන්නේ. එතකොට විඳීම කියන එක ඇති වෙන කොට එතන විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය තියෙනව ද? නැද්ද? තියෙනවා. ස්පර්ශයෙන් තමයි යමක් හඳුනාගන්නෙත්. හඳුනාගන්න කොට විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය තියෙනව ද? තියෙනවා. ස්පර්ශයෙන් තමයි චේතනා ඇතිවන්නෙත්. එතකොට චේතනා ඇති වෙන කොට ත් විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය තියෙනවා. එතකොට විඳීම ඇති වෙලා තණ්හාව හටගන්න කොට ඒ තණ්හාව පෝෂණය ලබන්නේ විඤ්ඤාණයෙන්. එතකොට ඒ තණ්හාවෙන් යමකට බැඳිලා ගියා ම ඒ බැඳිලා ගිය දේට බලපාන්නෙත් විඤ්ඤාණය යි. එතකොට චේතනා පහල වෙලා ක්‍රියාත්මක වෙන කොට කර්මය තමයි කුඹුර. විඤ්ඤාණය පැළවෙලා. දැක්කද? විඤ්ඤාණයෙන් මිදිච්ච එකක් නෑ. ස්පර්ශය තුළ විඤ්ඤාණය ක්‍රියාත්මක වෙනවනෙ. ඒ විඤ්ඤාණය තමයි විඳීම තුළ, සංඥා තුළ, සංස්කාර තුළ මෝරලා හැදෙන්නේ. එතකොට කර්මයකින් කරන්නේ විපාකයක් දෙන්න ඕනෙ විදිහට පරිසරයක් හදන එක. ඒකට ඕනෙ ආකාරයට මෝරලා වැඩෙන්නේ විඤ්ඤාණය. කම්මං ඛෙත්තං කිව්වේ ඒකයි.

සමහරු මේක ගැන තේරෙන්නෙ නැති නිසා කියනවා කර්මය තියෙන්නේ කොහෙද? කර්මය නැවතිලා තියෙන්නේ කොහෙද? මේක කොයි විදිහට ද යන්නේ. ඔය මහායාන පොත්වල හරියට මේක වරද්දලා තියෙනවා. ඒගොල්ලො හිතුවා එහෙනම් මේ කර්මය තියෙනවා ඇත්තේ විඤ්ඤාණයේ. ඔන්න විඤ්ඤාණය පටලෝගත්තා. මේක තේරුම් ගන්න නම් නිහතමානීව ධර්මය ඉගෙන ගන්න ඕනෙ. දැන් ඔබට තේරුනා ද මේ විඤ්ඤාණය කොච්චර දුර යනව ද කියලා. එතකොට ස්පර්ශය ඇති කල්හි විඳීම ඇත. විඳීම ඇති කල්හි තණ්හාව ඇත. තණ්හාව ඇති කල්හි උපාදාන ඇත. උපාදාන ඇති කල්හි භවය ඇත. භවය ඇති කල්හි ඉපදීම ඇත. ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත.

බුදුරජාණන් වහන්සේ විස්තර කරනවා කුමක් ඇති කල්හි ද ස්පර්ශය ඇති වන්නේ? ආයතනය හය ඇති කල්හි ස්පර්ශය

ඇත. මොනවද ආයතන හය? ඇස, කණ, නාසය, දිව, කය, මනස. මේවට තමයි ආයතන කියලා කියන්නේ. එතකොට ඇසක් තිබුණොත් ස්පර්ශයෙන් ගැලවෙන්න බෑ. ස්පර්ශය ඇති වෙනවා මයි. ස්පර්ශයක් ඇති වුනොත් විඳීමෙන් ගැලවෙන්න බෑ. විඳීම ඇති වෙනවා ම යි. විඳීම ඇති වුනොත් තණ්හාවෙන් ගැලවෙන්න බෑ. තණ්හාව ඇති වෙනවා මයි. තණ්හාව ඇතිවුනොත් ඒකට බැඳෙනවා ම යි. උපාදාන ඇති වෙනවා ම යි. උපාදාන ඇති වුනොත් උපාදාන තුළ තමයි ඔක්කොම චේතනා වැඩකරන්න පටන්ගන්නේ. එතකොට විපාක පිණිස කර්ම හැදෙනවා ම යි. විපාක පිණිස කර්ම හැදෙන එකෙන් බේරෙන්න බෑ. විපාක පිණිස කර්ම හැදෙන තාක් උපදිනවා ම යි. උපදින තාක් ජරා මරණ ඇති වෙනවා ම යි.

බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා, යම් තැනක ඇස, කණ, නාසය, දිව, කය, මනස ඇද්ද, ඒ දුකේ උපතයි. ඒ රෝගයන් ගේ පැවැත්ම යි, ජරා මරණයන්ගේ පහළ වීම යි. අපි ඉපදීම කියලා ඉගෙන ගත්තා. **(ආයතනානං පටිලාභෝ)** ඇස, කණ, නාසය, දිව, කය, මනස ලැබීම ඉපදීම යි. ජරාවට පත්වෙන කොට මොකද වෙන්නේ? **(ආයුනෝ සංහානි ඉන්ද්‍රියානං පරිපාකෝ)** මේ ඇස, කණ, නාසය, දිව, කය, මනස තමයි ජරාවට පත් වෙන්නේ. මරණයට පත් වෙන්නෙත් මේවා ම යි. එතකොට ඒවා ම යි මේ ලෝකෙත් එක්ක අපිව සම්බන්ධ කරලා දෙන්නේ. ඒ තුළින් ම යි විඤ්ඤාණය වැඩෙන්නෙත්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ඇහැ යි රූපය යි නිසා චක්ඛු විඤ්ඤාණය හටගන්නවා. ඇහේ විඤ්ඤාණය හටගන්නවා. එතකොට ඒකට මුල් වුනේ මොකක් ද? ඇහැක් තිබීම. එතකොට ඇහැක් තිබීම නිසා තමයි ඇහේ ස්පර්ශය හටගන්නේ. කණක් තිබීම නිස යි කණේ ස්පර්ශය හටගන්නේ. නාසයක් තිබීම නිසයි නාසයේ ස්පර්ශය හටගන්නේ. දිවක් තිබීම නිසයි දිවේ ස්පර්ශය හටගන්නේ. ඇඟක් තිබීම නිසයි කයේ ස්පර්ශය හටගන්නේ. මනසක් තිබීම නිසයි මනසේ ස්පර්ශය හටගන්නේ. එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කළා, මේ වෙන දේ හොඳට තේරුම් ගන්න කියලා. ජරා මරණ දක්වා මේ සිදුවෙන සිද්ධ වීම හොඳට තේරුම් ගන්න කියලා.

අපි ඊළඟට අහනවා කුමක් ඇති කල්හි ද සළායතන පවතින්නේ? **(නාමරූප පච්චයා සළායතනං)** නාම රූප ඇති කල්හි ආයතන හය ඇත. දැන් ඇහැක් තිබුනට, අපි ඇහැ දිහා බලන කොට පේන්නේ නිකම් භෞතික ඇහැක් වගේ. භෞතික ඇහැකට විඤ්ඤාණයක් උපද්දවන්න බෑ. අපිට කණ දිහා බලපුවා ම පේන්නේ නිකම් භෞතික කණක් වගේ. නමුත් භෞතික කණකට බැහැ විඤ්ඤාණයක් උපද්දවන්න. දැන් අපි ගත්තොත් සතර මහා ධාතූන් එකතු කරල නාසයක් හදල විඤ්ඤාණයක් උපද්දවන්න බෑ. සතර මහා ධාතූන් එකතු කරල දිවක් හදල විඤ්ඤාණයක් උපද්දවන්න බෑ. සතර මහා ධාතූන් එකතු කරල කයක් හදල විඤ්ඤාණයක් උපද්දවන්න බෑ.

බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මව් කුසේ උපතක් ඇතිවෙන කොට, ධාතු හයක් එකතු වෙලා කියනවා මේ උපත වෙන්නේ. ඒ ධාතු හය තමයි **පඨවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු, ආකාස ධාතු, විඤ්ඤාණ ධාතු.** ඉතින් මේ ධාතු හය එකතු වෙච්ච ගමන් එතන තියෙන්නේ නාම රූප වල ක්‍රියාකාරීත්වයක් තමයි. එතකොට ඒ නාම රූපයන්ගේ ක්‍රියාත්මක වීමට අනුව තමයි ඇහැ හැදෙන්නේ, කණ හැදෙන්නේ, නාසය හැදෙන්නේ, දිව හැදෙන්නේ, කය හැදෙන්නේ, මනස හැදෙන්නේ.

දැන් අපි ඇහැ ගත්තොත් ඇහැට මොකක් ද උපද්දවන්න පුළුවන්. ඇහැට උපද්දවන්න පුළුවන් නාම රූප විතරයි. දැන් අපි ලීයක් ගත්තොත්, ඒ ලීයෙන් හදන්න පුළුවන් ලීයේ තියෙන දේ විතරයි නේද? වීදුරුවකින් යමක් හැදුවා නම් ඒකේ තියෙන්නේ වීදුරු. මැටිටෙන් යමක් හැදුවා නම් ඒකේ තියෙන්නේ මැටි. සිමෙන්තියෙන් යමක් හැදුවා නම් ඒකේ තියෙන්නේ සිමෙන්ති. ගලෙන් යමක් හැදුවා නම් ඒකේ තියෙන්නේ ගල්. නාමරූපයෙන් යමක් හැදුන ද (ඇස) අන්න ඒකේ විඤ්ඤාණය හටගන්නවා. නාමරූපයෙන් හැදුණු එකක් කණ. ඒකේ විඤ්ඤාණය හටගන්නවා. නාම රූපයෙන් හැදුනු එකක් නාසය. ඒකේ විඤ්ඤාණය හටගන්නවා. නාම රූපයෙන් හැදුණු එකක් දිව. ඒකේ විඤ්ඤාණය හටගන්නවා. නාම රූපයෙන් හැදුනු එකක් කය. නාම රූපයෙන් හැදුනු එකක් මනස.

දැන් අපි තෝරගන්න ඕනේ මොනවද මේ නාම රූප කියන්නේ? මේක බුද්ධ දේශනාවල දී තියෙන හැටි අඳුන ගන්න ඕනෙ. සමහර අවස්ථා වලදී බුදුරජාණන් වහන්සේ මේ කය, මේ සිත කියල කථා කරනවා. නාම රූපය ගැන විස්තර කරන අවස්ථාව ලදී නාමය කියන්නේ සිත, රූපය කියන්නේ කය කියලා කිසිම බුද්ධ දේශනාවක නෑ. හොඳට මතක තියාගන්න ඕනෙ ඒක. නාමය සිත යි, රූපය කය යි කියලා බුද්ධ දේශනාවක් නෑ. බුද්ධ දේශනාවේ විස්තර වෙන්නේ මෙහෙම යි. මම ඒකේ පාළි පාඨය ම කියන්නම්, ඒකෙ සැකය නැතිවෙන්න.

**(කතමඤ්ච භික්ඛවේ නාමරූපං?)** පින්වත් මහණෙනි, නාම රූප යනු කුමක් ද? **(වේදනා සඤ්ඤා චේතනා ඵස්සෝ මනසිකාරෝ ඉදං වුච්චති නාමං)** විඳීම, හඳුනාගැනීම, කර්මය, ස්පර්ශය, මනසිකාරය මේකට තමයි නාම කියලා කියන්නේ. එතකොට නාම කියලා තියෙනවා පහකට. **(චත්තාරෝ ච මහා භූතා)** සතර මහා භූත පඨවි, ආපෝ, තේජෝ, වායෝ **(චතුන්නන් ච මහා භූතානං උපාදාය රූපං)** සතර මහා භූතයන්ගෙන් හටගත්තු දේ ඒකට තමයි රූප කියන්නේ. **(ඉති ඉදං ච නාමං)** ඔය විදිහට මේ නාමයත්, **(ඉදං ච රූපං)** මේ රූපයත්, **(ඉදං වුච්චති නාම රූපං)** ඕකට තමයි නාම රූප කියන්නේ.

එතකොට දැන් අපි ඔය ඉගෙන ගත්තේ කාගේ අවබෝධය ද? බුදුරජාණන් වහන්සේගේ අවබෝධය. මතක තියාගන්න ඕනෙ අපි **ධම්මං සරණං ගච්ඡාමි** කියලා සරණ ගියේ ඒ බුදුරජාණන් වහන්සේගේ අවබෝධය. එතකොට මේ විමුක්ති මාර්ගයේ දී සම්පූර්ණයෙන් ම බුදු රජාණන් වහන්සේගේ ධර්මයේ අවබෝධය සරණ ගිහින් තමයි ඉගෙන ගන්නේ.

එතකොට නාම රූප කිව්වේ වේදනා, සඤ්ඤා, චේතනා, ස්පර්ශය, මනසිකාරය, සතර මහා ධාතූන් ගෙන් හටගත් දේවල්. මේ දේවල් වලින් තමයි එතකොට ඇහැක් උපද්දවල දෙන්නේ. ඒ නාම රූප ම තමයි කණක් සකස් කරලා දෙන්නේ. ඒ නාමරූපයට අනුව තමයි දිව හැදුනේ. නාසය හැදුනේ. ඒ නාම රූපයට අනුව තමයි කය හැදුනේ. ඒ නාම රූපයට අනුව තමයි මනස හැදුනේ. එහෙනම් ඇස කියන්නේ නාම රූපයෙන් හැදුන එකක්. කණ

කියන්නේ නාම රූපයෙන් හැදුන එකක්. නාසය කියන්නේ නාම රූපයෙන් හැදුන එකක්. දිව කියන්නේ නාම රූපයෙන් හැදුන එකක්. කය කියන්නේ නාම රූපයෙන් හැදුන එකක්. මනස කියන්නේ නාම රූපයෙන් හැදුන එකක්.

ඇසින් රූපයක් දැක්කා ම විඤ්ඤාණයක් හටගත්තා. එතකොට ඇහැ යි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වුනා. ඒක තමයි ස්පර්ශය. ඒක නාමයට අයිති එකක්. ඒ ස්පර්ශය ඇතිවෙච්ච ගමන් වේදනාවක් හටගන්නවා. නාමයකට අයිති එකක්. ඒ ස්පර්ශය ඇති වෙච්ච ගමන් සඤ්ඤාවක් හටගන්නවා. නාමයකට අයිති එකක්. ඒ ස්පර්ශය ඇතිවෙච්ච ගමන් සංස්කාර හටගන්නවා. ඒක අයිති නාමයකට.

අපි කිව්වා ඇහැ යි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වුනා ම ස්පර්ශය ඇතිවුනා. එකට ආවා ස්පර්ශය. දෙකට විඳීම ආවා. ස්පර්ශය නිසා සඤ්ඤා ඇතිවෙනවා. තුනට සඤ්ඤාව. ස්පර්ශය නිසා චේතනා ඇතිවෙනවා. හතරට චේතනා. අපිට ආවේ කොහොම ද? ස්පර්ශය, වේදනාව, සඤ්ඤාව, චේතනාව. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ කොහොමද? වේදනා, සඤ්ඤා, චේතනා, ස්පර්ශය. ඔබට හිතන්න පුළුවන් ද එහෙම දේශනා කළේ ඇයි කියලා. අපි බලපු පිළිවෙලට ඉස්සෙල්ලා ඇතිවෙන්නේ ස්පර්ශය. වේදනා, සඤ්ඤා, චේතනා ඊට පස්සේ. නමුත් දේශනාවේ තියෙන්නේ වේදනා, සඤ්ඤා, චේතනා ළඟට ස්පර්ශය. ඒකට හේතුව තමයි වේදනා, සඤ්ඤා, චේතනා තුන ම හටගන්නේ ස්පර්ශය නිස යි. ඒකයි ස්පර්ශය හතරවෙනියට දාලා තියෙන්නේ.

ඊට පස්සේ තියෙනවා මනසිකාරය කියලා එකක්. මනසිකාරයෙන් තමයි හතර ම හටගන්නේ. ඒකයි එතනට මනසිකාරය දාලා තියෙන්නේ. මම හොඳට කල්පනා කරලා තේරුම් ගත්තා මේක මෙහෙමයි වෙන්නේ කියලා.

එතකොට බලන්න, මනසිකාරයක් නැත්නම් විඤ්ඤාණයක් හටගන්නේ නෑ. ඔබට තේරුම් ගන්න ලේසි වෙන්න මෙහෙම කියන්නම්. දැන් ඔබ මොකක් හරි ලොකු කල්පනාවක වැටිලා

ඉන්නවා. බරපතල කල්පනාවක වැටිලා ඉන්නවා. ඔය අතරේ ඔබට හිතෙනවා රේඩියෝ එක අහන්න ඕනෙ කියලා. ඔන්න රේඩියෝ එක දානවා. ඔබේ හිත ආයෙ අර කල්පනාවට යනවා. ඔබට ටික්ක වෙලා යනකොට මතක් වෙනවා මම රේඩියෝ එක ඇහුවා කියල. නමුත් අහපු දෙයක් නෑ. මෙහෙම දේවල් වෙන්නෙ නැද්ද?

මනසිකාරය තියෙන්න ඕනෙ විඤ්ඤාණය හටගන්න. දැන් තේරෙනව ද දේශනාවේ මේක පුදුම විදිහට ගැලපෙන විදිහට නාම තියෙන හැටි. වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාර ඒ කියන්නේ නාම. ඇහැට පුළුවන් ඔච්චරයි උපද්දවන්න. ඉතිරි ඔක්කොම වෙන කරුණක් නිසා ඉපදෙන ඒවා. තණ්හා, උපාදාන, භව, ජාති, ඒවා ඔක්කොම අපේ ප්‍රශ්න. ඒවා ඔක්කොම හටගන්නේ අනවබෝධයෙන්. දැන් රහතන් වහන්සේ නමක් ගත්තොත් නාම රූප නැතිවෙන්නේ නෑ. විඤ්ඤාණය නැතිවෙන්නේ නෑ. නමුත් තණ්හා, උපාදාන, භව, ජාති, ජරා-මරණ ඔක්කොම නැතිවෙනව.

දැන් ඔබ තේරුම් ගන්න, නාම රූප හේතුවෙන් තමයි ඇස, නාම රූප හේතුවෙන් තමයි කණ, නාම රූප හේතුවෙන් තමයි නාසය, නාම රූප හේතුවෙන් තමයි දිව, නාම රූප හේතුවෙන් තමයි කය, නාම රූප හේතුවෙන් තමයි මනස. එතකොට මෙතන ඔක්කොම තියෙන්නේ කරුණු රාශියකින් හැදිච්ච ඒවා. ඒ නිසයි මේවට මම ය කියලා අයිතියක් හඟවන්න බැරි. මගේ කියලා අයිතියක් හඟවන්න බැරි. මගේ ආත්මය කියලා බැරි. නමුත් අපිට එක දෙයක් කරන්න පුළුවන්. මොකක් ද? සිහිය උපදවන්න පුළුවන් මේ තුළ. ශ්‍රද්ධාව කියන එක උපදවන්න පුළුවන්. වීරිය කියන එක උපදවන්න පුළුවන්. නුවණින් දැකීම කියන එක උපදවන්න පුළුවන්.

අහල තියෙනවද බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනව මනස සහිත, සිත සහිත, විඤ්ඤාණය සහිත බඹයක් විතර ශරීරයේ තමයි දුක තියෙන්නේ. දුකේ හට ගැනීම තියෙන්නේ. දුකේ නිරෝධය තියෙන්නේ. දුක් නිරෝධ ගාමිණී පටිපදාව තියෙන්නේ. මේවා තේරෙන්නේ මේ දේශනාවල් නුවණින් තේරුම් ගනිද්දී.

එතකොට නාම රූප ඇති කල්හි ආයතන ඇත. ආයතන හය ඇති කල්හි ස්පර්ශය ඇත. ස්පර්ශය ඇති කල්හි විඳීම ඇත. විඳීම ඇති කල්හි තණ්හාව ඇත. තණ්හාව ඇති කල්හි උපාදාන ඇත. උපාදාන ඇති කල්හි භවය ඇත. භවය ඇති කල්හි ඉපදීම ඇත. ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත. එතකොට මේ විදිහට මතක තිබුනොත් විතරයි නුවණින් මෙනෙහි කරන්න පුළුවන්. අපි නො අසපු දෙයක්, අපි නො දත් දෙයක් කිසි දවසක අපිට අවබෝධ කරන්න බෑ. එහෙම වුනොත් මේ ලෝකයේ පෘථග්ජනයා නිවන් දකිනවා. එහෙම නම් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් නො වන අයත් මග ඵල ලබනවා. නො අසපු දෙයක්, නො දත් දෙයක් කිසි දවසක ලෝකයේ කාටවත් අවබෝධ කරන්න බෑ. නො අසපු දෙයක් නො දත් දෙයක් මේ ලෝකයේ අවබෝධ කරන්නේ එක්කෙනයි. **සම්මා සම්බුදුරජාණන් වහන්සේ.**

ඊළඟට කුමක් ඇති කල්හි ද නාම රූප ඇතිවන්නේ? විඤ්ඤාණය ඇති කල්හි නාම රූප ඇත. එහෙනම් විඤ්ඤාණය හටගන්නේ කොහේද? ඇසේ, කණේ, නාසයේ, දිවේ, කයේ, මනසේ. විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වයක් තිබුනොත් තමයි නාම රූපයන්ගේ ක්‍රියාකාරීත්වයක් තියෙන්නේ. නාම රූපයක ක්‍රියාකාරීත්වයක් තිබුනොත් තමයි ආයතනයක ක්‍රියාකාරීත්වයක් තියෙන්නේ. ආයතනයක ක්‍රියාකාරීත්වයක් තිබුනොත් තමයි ස්පර්ශයක ක්‍රියාකාරීත්වයක් තියෙන්නේ. ස්පර්ශයක ක්‍රියාකාරීත්වයක් තිබුනොත් තමයි විඳීමක් හටගන්නේ. විඳීමක ක්‍රියාකාරීත්වයක් තිබුනොත් තමයි තණ්හාවක් හටගන්නේ. තණ්හාව ක්‍රියාකාරීත්වයක් තිබුනොත් තමයි උපාදාන හටගන්නේ. උපාදානයක ක්‍රියාකාරීත්වයක් තිබුනොත් තමයි භවය හටගන්නේ. භවයක ක්‍රියාකාරීත්වයක් තිබුනොත් තමයි උපතක් හටගන්නේ. උපතක ක්‍රියාකාරීත්වයක් තිබුනොත් තමයි ජරා මරණ හටගන්නේ.

බුදුරජාණන් වහන්සේ මේ විඤ්ඤාණයේ ක්‍රියාත්මක වීම විස්තර කරන්නේ කොහොමද? අපිට එකපාරට ම අල්ලන්න බැරි එකක්. අපට එක පාරට ම තේරුම් ගන්න බැරි එකක්. වටහා ගන්න බැරි එකක්. ඒකට හේතුව තමයි විඤ්ඤාණය හැම තිස්සේ ම ප්‍රකෘති ස්වරූපයෙන් තියෙනව නෙවෙයි. බුදුරජාණන් වහන්සේ පෙන්නලා දෙන්නේ හතර මං හන්දියක මැජික් කාරයෙක් මැජික්

පෙන්නනවා. එතකොට අපිට පේන්නේ මැජික් එක විතරනේ. අපිට පේන්නෙ නෑ මේ මිනිහා මැජික් එක හදන්නේ කොහොමද කියලා. අපට පේන්නේ අර විශ්මයජනක සිද්ධිය විතරයි. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ ඇසේ විඤ්ඤාණය, කණේ විඤ්ඤාණය, නාසයේ විඤ්ඤාණය, දිවේ විඤ්ඤාණය, කයේ විඤ්ඤාණය, මනසේ විඤ්ඤාණය මැජික් එකක් වගේ කියලා.

මේ මැජික් එකේ ක්‍රියාකාරීත්වය නිසා තමයි අපි හිතුමනාපෙට කරුණු ගොනු කර කර එක එක දේවල් මවාගන්නේ. නොයෙක් දේවල් මවා ගන්න පුළුවන්. බය හිතුන දෙයක් හිතන්න හිතන්න බය ඇති කරගන්න පුළුවන්. ඕනෙ දෙයක් විශ්මයජනක විදිහට, මායාකාරී විදිහට මවා ගන්න පුළුවන්. මේ මායාකාරී විඤ්ඤාණය පවතින්නේ කුමක් ඇති කල්හි ද? සංඛාර ඇති කල්හි. සංස්කාර ඇති කල්හි විඤ්ඤාණය ඇත.

බුදුරජාණන් වහන්සේ සංස්කාර විස්තර කරනවා මෙහෙම. "**(කතමේ ච භික්ඛවේ සංඛාරා?)** පින්වත් මහණෙනි, සංස්කාර යනු කුමක් ද? **(තයෝ මේ භික්ඛවේ සංඛාරා)** පින්වත් මහණෙනි, සංස්කාර තුනකි. **(කාය සංඛාරෝ)** කාය සංස්කාර, **(වචී සංඛාරෝ)** වචී සංස්කාර, **(චිත්ත සංඛාරෝ)** චිත්ත සංස්කාර. **(ඉමේ වුච්චන්ති භික්ඛවේ සංඛාරා)** පින්වත් මහණෙනි, මෙන්න මේවාට තමයි සංස්කාර කියන්නේ."

සංස්කාර කියන වචනය පින්වත්නි, විවිධ තේරුම් වලට පාවිච්චි වෙලා තියෙනව. දැන් අපි ගත්තොත් **(සබ්බේ සංඛාරා අනිච්චා ති - යදා පඤ්ඤාය පස්සති)** සෑම සංස්කාරයක් ම අනිත්‍යය යි කියල යම් දවසක ප්‍රඥාවෙන් දකිනව නම්, **(අථ නිබ්බින්දති දුක්ඛේ)** එතකොට එයා දුක ගැන තමයි අවබෝධයෙන් ම කළකිරෙන්නෙ. **(ඒස මග්ගෝ විසුද්ධියා)** ඕක තමයි විමුක්තියට තියෙන මාර්ගය. එතකොට මෙතන **සබ්බේ සංඛාරා** කියල කිව්වෙ හේතු ඵල දහමින් හටගත්තු සෑම දෙයක් ම කියන එක තමයි සංස්කාර කියන එකේ අර්ථය.

සමහර තැන් වල බුද්ධ දේශනාවෙ සඳහන් වෙනව **පුඤ්ඤාභි සංඛාරෝ, අපුඤ්ඤාභි සංඛාරෝ, ආනෙඤ්ජාභි සංඛාරෝ.**

ඒකත් සංස්කාර. **පුඤ්ඤාභි සංස්කාර** කියල කියන්නේ, " **(අවිජ්ජාගතෝ යං පුරිස පුග්ගලෝ පුඤ්ඤං චේ සංඛාරං අභිසංඛරෝති පුඤ්ඤූපගං හෝති විඤ්ඤාණං)** අවිද්‍යාගත වූ පුද්ගලයා යම් පුණ්‍ය වූ සංස්කාරයක් රැස් කරයි නම්, විඤ්ඤාණය පිනට අනුව සකස් වෙලා යනව" අර පැලවෙන එක තමයි මේ වෙන්නෙ. "**(අපුඤ්ඤං චේ සංඛාරං අභිසංඛරෝති අපුඤ්ඤූපංග හෝති විඤ්ඤාණං)** පවක් නම් රැස්කරන්නෙ, විඤ්ඤාණය පවට අනුව සකස් වෙලා යනව." "**(ආනෙංජං චේ සංඛාරං අභිසංඛරෝති ආනෙංජෝපගං හෝති විඤ්ඤාණං)** ධ්‍යානයක සංස්කාර නම් රැස්කරන්නෙ විඤ්ඤාණය ආනෙන්ජයට අනුව සකස් වෙනවා" එතන කියන්නේ උපතක් කරා යන්න සකස් වෙනවා කියන එක. එතකොට ඒකත් සිද්ධවෙන්නෙ අවිද්‍යාවෙන් ම යි.

අවිද්‍යාව ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කළේ බිත්තරයක කටුව වගේ කියලනෙ. බිත්තරය ඇතුලෙ අපි ඉන්නව වගේ එකක් නෙ මේ තියෙන්නෙ.

එතකොට මෙතන සංස්කාර කියල විස්තර කරන්නෙ කාය සංඛාර කියන්නෙ ආශ්වාස ප්‍රශ්වාස. වචී සංඛාර කියන්නෙ විතක්ක විචාර. විතක්ක විචාර කියල කියන්නෙ අපි වචන කථා කරන්න ඉස්සර වෙලා හිතේ හැදෙන වචන. චිත්ත සංඛාර කියල කියන්නේ සංඥාවත් විඳීමත්.

ආශ්වාස ප්‍රශ්වාස වලට කාය සංස්කාර කියල කියන්නෙ කය හා බැඳී තියෙන නිසා. මේ ආශ්වාස ප්‍රශ්වාස තියෙන්නෙ මේ ගොරෝසු ශරීරයත් එක්ක බැඳිල. විතක්ක විචාර තියෙන්නෙ වචනයත් එක්ක බැඳිල. ඒ කියන්නෙ විතක්ක විචාර හටගන්නෙ නැත්නම් වචන පිටවෙන්නෙ නෑ. විතක්ක විචාර තමයි මේ වචන කථා කරන්න අපිට හැදෙන්නෙ. සංඥා වේදනා කියන දෙක චිත්ත සංඛාරයක්. සිත හා බැඳිල තියෙන්නෙ. එහෙම නම් සිතෙන් වෙන් වෙච්ච විඳීමක් නෑ. සිතෙන් වෙන් වෙච්ච හඳුනා ගැනීමක් නෑ.

එතකොට බලන්න මේ පසුබිම තුළ තමයි අර විඤ්ඤාණය ක්‍රියාත්මක වෙන්නෙ. ඒ කියන්නේ ඇසේ විඤ්ඤාණය, කණේ විඤ්ඤාණය...... වෙන විඤ්ඤාණයක් නෑ. දැන් මේක කියනවා

"**(ඡයිමේ භික්ඛවේ, විඤ්ඤාණකායා)** පින්වත් මහණෙනි, විඤ්ඤාණය හය ආකාර යි" කියල ඇසේ විඤ්ඤාණය, කණේ විඤ්ඤාණය, නාසයේ විඤ්ඤාණය, දිවේ විඤ්ඤාණය, කයේ විඤ්ඤාණය, මනසේ විඤ්ඤාණය කියල විස්තර කළා.

එතකොට හඳුනාගැනීමයි, විඳීමයි කියන දෙක හටගන්න හේතු වෙන්නෙ මොකක් ද? ස්පර්ශය නෙ. මේක විස්තර කරන්නෙ ඒක චිත්ත සංඛාරයක් විදිහට. ඒ කියන්නෙ සිත හා බැඳී තියෙනව. එතකොට ආශ්වාස ප්‍රශ්වාස බැඳිල තියෙන්නෙ මොකක් එක්ක ද? කයත් එක්ක. විතක්ක විචාර බැඳිල තියෙන්නෙ මොකක් එක්ක ද? වචනත් එක්ක. සඤ්ඤා වේදනා බැඳිල තියෙන්නෙ මොකක් එක්ක ද? සිතත් එක්ක.

බුදුරජාණන් වහන්සේ වදාළා මේ සංස්කාර කුමක් ඇති කල්හි ද තියෙන්නෙ. **(අවිජ්ජා පච්චයා)** අවිද්‍යාව ඇති කල්හි සංස්කාර ඇත. මෙන්න අවිද්‍යාව. "**(කතමා ච භික්ඛවේ අවිජ්ජා?)** පින්වත් මහණෙනි, අවිද්‍යාව යනු කුමක් ද? **(යං ඛෝ භික්ඛවේ දුක්ඛේ අඤ්ඤාණං)** මහණෙනි, දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳ යම් අනවබෝධයක් ඇද්ද, **(දුක්ඛ සමුදයේ අඤ්ඤාණං)** දුක හටගැනීම ගැන නො දැනීමක් ඇද්ද, **(දුක්ඛ නිරෝධේ අඤ්ඤාණං)** දුක නිරුද්ධ වීම ගැන නො දැනීමක් ඇද්ද, **(දුක්ඛ නිරෝධ ගාමිනියා පටිපදාය අඤ්ඤාණං)** දුක නිරුද්ධ වන මාර්ගය හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය ගැන අවබෝධයක් නැද්ද එයයි." මේ ආර්ය සත්‍ය හතර ගැන අවබෝධයක් නැද්ද මේක සම්පූර්ණයෙන් ම පවතින්නෙ ඒකෙන්.

එතකොට අපි ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙ පංච උපාදානස්කන්ධය ගැන අවබෝධයක් ඇතිව ද? දුක්ඛ ආර්ය සත්‍යය අවබෝධ කරල නෙවෙයි. 'මම හුස්ම ගන්නව - හෙලනව' කියලනෙ අපි කරන්නෙ. අවිද්‍යාවෙ පිහිටල මේක කරන්නෙ. විතක්ක විචාර වලට වචන ගැලපි ගැලපි එන්නෙ විද්‍යාව පහළ වෙලා ද? නෑනෙ. 'මම කථා කරනව' කියලනෙ කරන්නෙ. හඳුනගන්නෙ 'මම හඳුනගන්නව' කියලනෙ. විඳින්නෙ 'මම විඳිනව' කියලනෙ. එතන ඉඳල අවිද්‍යා සහගත විඤ්ඤාණයක්

තමයි ඇහේ හටගන්නෙ. අවිද්‍යා සහගතව සකස් වෙච්ච විඤ්ඤාණයක් තමයි කණේ, නාසයේ, දිවේ, කයේ, මනසේ හටගන්නෙ.

එතකොට අනවබෝධයකින් හටගත්තු විඤ්ඤාණයක් හටගත්තොත්, ඒ විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් හටගන්න නාම රූප වල තියෙන්නෙත් අනවබෝධය. අනවබෝධයෙන් තියෙන නාම රූප වලින් හටගන්න ඇස, කණ, නාසය, දිව, කය, මනස තුළ තියෙන්නෙත් අනවබෝධය. ඒ අනවබෝධයෙන් තියෙන ආයතන හය තුළ ස්පර්ශයක් ඇතිවෙනව ද, ඒ ස්පර්ශයේ තියෙන්නෙත් අනවබෝධය. අනවබෝධයෙන් යුතු ස්පර්ශයෙන් ඇති වෙන විඳීම තුළ තියෙන්නෙත් අනවබෝධය. අනවබෝධයෙන් විඳපු ගමන් තණ්හාව හටගන්නව. තණ්හාව නිසා උපාදාන හටගන්නව. උපාදාන නිසා භවය හටගන්නව. භවය නිසා ජාති, ජරා, මරණ හටගන්නව.

එතකොට අවිද්‍යාවෙන් තමයි සම්පූර්ණයෙන් ම මේක වහන්නෙ. මේක අවබෝධ වුනොත් විද්‍යාව පහළ වුනා නෙ. අවිද්‍යාවෙන් වැහිල තමයි වේදනාව ගාවට යනකම් ම යන්නෙ. ඊට පස්සේ තණ්හාවෙන් බැඳෙනව. බැඳෙන්නෙ මොකේට ද? ඇසට, විඤ්ඤාණයට, නාම රූප වලට, ස්පර්ශයට. වෙන මොනවට ද බැඳෙන්නෙ? ඕවට තමයි බැඳෙන්නෙ. බැඳීම බුදු රජාණන් වහන්සේ විස්තර කරනවා කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද (මම, මාගේ, මාගේ ආත්මය කියන හැඟීමට) බැඳෙනව. බැඳිල තමයි ක්‍රියාත්මක වෙන්නෙ.

මේ සිද්ධිය වෙන සිදුවීම මෙහෙමයි කියල තම තමන් තුළින් නුවණින් විමසල තේරුම් ගන්න ඕනෙ. ඒකට යි ආර්ය න්‍යාය තියෙන්නෙ.

ඉතින් තේරුම් ගන්න ඕනෙ මේ විදිහට. දැන් ඔන්න අපි ඉගෙන ගත්තා අවිද්‍යාවට යනකම්. දැන් මතක තියාගන්න ඕනෙ මෙහෙම.

- **අවිද්‍යාව ඇති කල්හි සංස්කාර ඇත.**
- **සංස්කාර ඇති කල්හි විඤ්ඤාණ ඇත.**

- **විඤ්ඤාණ ඇති කල්හි නාම රූප ඇත.**
- **නාම රූප ඇති කල්හි ආයතන හය ඇත.**
- **ආයතන හය ඇති කල්හි ස්පර්ශය ඇත.**
- **ස්පර්ශය ඇති කල්හි විඳීම ඇත.**
- **විඳීම ඇති කල්හි තණ්හාව ඇත.**
- **තණ්හාව ඇති කල්හි උපාදාන ඇත.**
- **උපාදාන ඇති කල්හි භවය ඇත.**
- **භවය ඇති කල්හි ඉපදීම ඇත.**
- **ඉපදීම ඇති කල්හි ජරා, මරණ, ශෝක, වැලපීම්, දුක්, දොම්නස්, සුසුම් හෙලීම් ඇත.**

ඉතින් ඔබ හිතන්නේ අප තුළ පටිච්ච සමුප්පාදයේ මේ අංග ඔක්කොම තියෙනව ද නැද්ද? අපි තුළ ඔක්කොම තියෙනව. එහෙම නම් අපිට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා පටිච්ච සමුප්පාදය ඔය විදිහට අවබෝධ කරගත්තා ම ඒකට කියන්නේ **ධම්මේ ඤාණං** කියල. හොඳට මතක තියාගන්න මේ කියන ටික. ඊළඟට බුදු රජාණන් වහන්සේ විස්තර කරනවා මේ පටිච්ච සමුප්පාදය පිළිබඳව ඇති වන අවබෝධයේ පිහිටලා අතීත අනාගත දෙකට ගලපා බලන්න කියනව. ඒකට කියන්නේ **අන්වයේ ඤාණං** කියල. අනුව ගිය නුවණ.

අතීත අනාගත දෙකට ගලපල බලන්න කියනව මෙහෙම.

- **අතීතයේ ජරා මරණ වුනා නම් ඇති වුනේ ඉපදීම නිසා.**
- **අතීතයේ ඉපදීම ඇති වුනා නම් ඇති වුනේ භවය නිසා.**
- **අතීතයේ භවය ඇති වුනා නම් ඇති වුනේ උපාදාන නිසා.**
- **අතීතයේ උපාදාන ඇති වුනා නම් ඇති වුනේ තණ්හාව නිසා.**
- **අතීතයේ තණ්හාව ඇති වුනා නම් ඇති වුනේ විඳීම නිසා.**
- **අතීතයේ විඳීම හටගත්තා නම් හටගත්තේ ස්පර්ශය නිසා.**
- **අතීතයේ ස්පර්ශය හටගත්තා නම් හටගත්තේ ආයතන හය නිසා.**
- **අතීතයේ ආයතන හය හටගත්තා නම් හටගත්තේ නාම රූප**

**නිසා.**

- **අතීතයේ නාම රූප හටගත්තා නම් හටගත්තේ විඤ්ඤාණය නිසා.**
- **අතීතයේ විඤ්ඤාණය හටගත්තා නම් හටගත්තේ සංස්කාර නිසා.**
- **අතීතයේ සංස්කාර හටගත්තා නම් හටගත්තේ අවිද්‍යාව නිසා.**

එතකොට අපිට අවබෝධ වෙනවා එහෙම නම් අතීතයේ අපට තිබිලා තියෙන්නෙත් අවිද්‍යාවෙන් වැහිච්ච, තණ්හාවෙන් බැඳිච්ච මේ පටිච්ච සමුප්පාදය ම යි. ඊට පස්සේ අනාගතයට යොමු කරලා බලන්න කියනව,

- **අනාගතයේ ජරා මරණ ඇතිවෙන්නේ ඉපදීම නිසා.**
- **අනාගතයේ ඉපදීම ඇතිවෙන්නේ භවය නිසා.**
- **අනාගතයේ භවය ඇතිවෙන්නේ උපාදාන නිසා.**
- **අනාගතයේ උපාදාන ඇතිවෙන්නේ තණ්හාව නිසා.**
- **අනාගතයේ තණ්හාව ඇතිවෙන්නේ විඳීම නිසා.**
- **අනාගතයේ විඳීම ඇතිවෙන්නේ ස්පර්ශය නිසා.**
- **අනාගතයේ ස්පර්ශය ඇතිවෙන්නේ ආයතන හය නිසා.**
- **අනාගතයේ ආයතන හය ඇතිවෙන්නේ නාම රූප නිසා.**
- **අනාගතයේ නාම රූප ඇතිවෙන්නේ විඤ්ඤාණය නිසා.**
- **අනාගතයේ විඤ්ඤාණය ඇතිවෙන්නේ සංස්කාර නිසා.**
- **අනාගතයේ සංස්කාර ඇතිවෙන්නේ අවිද්‍යාව නිසා.**

අනාගතයේ ජරා මරණ ඇතිවෙන්නේ මේ වැඩ පිළිවෙල තුළ යි. එතකොට වර්තමානයේ මේ ගන්න අත්දැකීමෙන් තමයි අතීතයටත් අනාගතයටත් ගලපා බලන්නෙ. එතකොට වර්තමානයේ පටිච්ච සමුප්පාදය තේරුම් අරගෙන අවබෝධයක් ඇති වුනා ම ඒකට කියන්නේ **ධම්මේ ඤාණං**. හොඳට මතක තියාගන්න ඕනෙ මේ වචන. ඒකෙ පිහිටල තමයි අතීතයට අනාගතයට විමසලා බලන්නෙ. එතකොට කියන්නේ **අන්වයේ ඤාණං.**

අන්න එතකොටයි එයාට අතීතය කෙරෙහිත් කළකිරෙන්නෙ. අනාගතය කෙරෙහිත් කළකිරෙන්නෙ. වර්තමානය අතහරින්නෙ.

අපි නැත්නම් අපි හැමතිස්සෙම හිතනව මේ ජීවිතයේ දී යම් විඳීමක්, කරදරයක් විඳිනව නම්, අනාගතයේ එහෙම වෙන්නෙ නෑ කියල. අපි හැම තිස්සෙම හිතාගෙන ඉන්නෙ අද හරි නැතිවුනාට හෙට හරියයි කියල. අපි හිතන ඒ හෙට කවදාවත් එන්නෙ නෑ. ඉස්සර පරණ ගෙවල් වල චූටි බබාල හම්බ වුනාම උළුවස්සෙ ගහනව 'අද නෑ හෙට' කියල. යකෙක් ඉන්නවලු. ඒ යකා එනවලු ගෙදරට. යකා මේක කියවල 'ආ.... අද නෑ. හෙට'. යකා හෙට එනවලු. යකා හෙට එනකොට තියෙන්නෙ 'අද නෑ හෙට'. ඒ වගේ තමයි අපේ පැතුම්.

අපි හිතාගෙන ඉන්නේ මේ ජීවිතය නම් හරිගියේ නෑ. ඊළඟ ජීවිතයේ නම්.... නමුත් ඊළඟ ජීවිතය මීටත් වඩා කබල් වෙන්න පුළුවනි. එතකොට මේකෙන් තේරුම්ගන්න තියෙන්නෙ හේතු සකස් වෙලයි මේ ඔක්කොම වෙන්නෙ. ඊළඟ ජීවිතයේ රැකවරණයක් සඳහා නම් මේ ජීවිතයේ හේතු හැදෙන්න ඕනෙ.

දැන් පටිච්ච සමුප්පාදය හොඳට තේරුම් ගනිද්දි, තේරුම් ගනිද්දි පැහැදිලි වෙන්නෙ කරුණු තුනක්. අනිත්‍යයක්. දුකක්. අනාත්මයක්. තේරුම් ගනිද්දි, තේරුම් ගනිද්දි පැහැදිලි ලෙස තේරුම් යන්නෙ 'මේක අපිට වුවමනා හැටියට සිද්ධ වෙන එකක් නෙවෙයි.' අන්න එතකොට තමයි එයාට කුසල් උපදව ගන්න, සිහිය උපදව ගන්න, සතිපට්ඨානය වඩන්න, නුවණින් අවබෝධ කරන්න, දුක දකින්න, දුක්ඛ සමුදය ප්‍රහාණය කරන්න, නිරෝධය සාක්ෂාත් කරන්න, ආර්ය මාර්ගය වඩන්න ඕනෙ වෙන්නෙ. මාර්ගයට එනව කියන්නෙ ඒකයි. එයාගේ ඒ අවබෝධයෙන් තමයි ඒක වෙන්නේ.

එතකොට අපි මෙච්චර වෙලා ඉගෙන ගත්තේ "**ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති**" කියන එක. දැන් අපි ඉගෙන ගන්න යන්නේ "**ඉමස්මිං අසති ඉදං න හෝති** - මෙය නැති කල්හි මෙය නැත. **ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති** - මෙය නිරුද්ධ වූ කල්හි මෙය නිරුද්ධ වේ" දැන් අපි ආයෙමත්

යමු පටිච්ච සමුප්පාදය පටන් ගත්තු විදිහට ම කොණට ම.

ජරා මරණ නැතිවන්නේ කුමක් නැති වුනෝතින් ද? ජරා මරණ නැති වන්නේ ඉපදීමක් නැති වුනොත්. ඒ කියන්නේ කිසියම් ම සත්ව නිකායක, කිසියම් ම සත්ව කොට්ටාශයක අණ්ඩජව හෝ ජලාබුජව හෝ සංසේදජව හෝ ඕපපාතිකව හෝ ඉපදීමක්, විශේෂ ඉපදීමක්, විශේෂ පහළවීමක්, පංච උපාදානස්කන්ධයේ පහල වීමක්, ආයතන හයේ ප්‍රතිලාභයක් නැති වුනා නම්, ජරා මරණ නැත. එහෙම නම් ඉපදීම නැති කල්හි ජරා මරණ නැත. එහෙම නම් ජරා මරණ නැති වන්නේ කිසිම පිළිවෙලකින් උපතක් නැති වුනා ම යි.

උපතක් නැති වන්නේ කුමක් නැති කල්හි ද? කාම ධාතුවේ විපාක විඳින්න කර්ම නැත්නම්, කාම භවයක් නැත. රූප ධාතුවේ විපාක විඳින්න කර්ම නැත්නම්, රූප භවයක් නැත. අරූප ධාතුවේ විපාක විඳින්න කර්ම නැත්නම්, අරූප භවයක් නැත. එහෙමනම් **(කම්මං ඛෙත්තං)** කර්ම ක්ෂේත්‍රය. කර්මය තමයි කුඹුර. කුඹුරක් නැත්නම් පැලයක් හිටවන්න තැනක් නැත. පැලයක් පැලවෙන්න තැනක් නැත. කාම භවයක්, රූප භවයක්, අරූප භවයක් කියන තුන ම නැත්නම් ඉපදීමක් නැත. භවය නැති කල්හි ඉපදීම නැත.

අපි සාමන්‍යයෙන් කරුණු කතා කරද්දී, චුති සිත හා පටිසන්ධි සිත ගැන කතා කළා. චුති සිත සමඟ පටිසන්ධි සිත ඇතිවෙනව කියන සිද්ධාන්තය අපි කල්පනා කරල බලන්න ගියොත් මේ පටිච්ච සමුප්පාදයේ නිරෝධයට ගලපන්නත් බෑ. චුති සිතක් ප්‍රතිසන්ධි සිතකට යන්නෙ භවයක් තිබුනොත් විතරයි. ඇයි **(භව පච්චයා ජාති)** භවය හේතු කරගෙනයි ඉපදීම සිදුවෙන්නෙ.

එතකොට අපිට හොඳට තේරෙනවා රහතන් වහන්සේ පිරිනිවන් පාන්නේ ඇයි කියල. රහතන් වහන්සේගේ සිත චුත වෙන්නේ නෑනෙ. ඇයි චුත වෙන්නෙ නැත්තෙ. චුත වෙන්න නම්, කර්මය නැමති කෙත තියෙන්න ඕනෙ. කර්මය නැමැති භූමිය තියෙන්න ඕනෙ. විඤ්ඤාණය පැළ වෙලා තියෙන්න ඕනෙ. තණ්හාවෙන් ඒක තෙත් වෙලා තියෙන්න ඕනෙ. එතකොට තමයි

විපාක පිණිස හැදෙන්නෙ. එතකොට විඤ්ඤාණය කර්මයට සුදුසු ආකාරයට සකස් වෙලා යනව. එතකොට ඒ ක්‍රියාකාරීත්වය හිතක වෙන්නෙ නැත්නම්, රහතන් වහන්සේ පිරිනිවන් පානවා කියන්නෙ ස්වාභාවික සිද්ධියක්. හේතු නැති වී යාම නිසා ඵලයක් නැති වී යාම.

යමක් හටගන්නේ හේතු ප්‍රත්‍යයන්ගෙන් නම්, ඒ හේතු ප්‍රත්‍යයන් නැතිව ගියා ම ඵලය නිරුද්ධ වී යනව. එහෙනම් රහතන් වහන්සේ පිරිනිවන් පාන්නේ තණ්හාව නිරුද්ධ වීම නිසා විඤ්ඤාණය වැඩෙන්නෙ නෑ. ඒ නිසයි පිරිනිවන් පාන්නෙ. එතකොට භවය නැති කල්හි ඉපදීම නැත.

එතකොට භවය නැතිවෙන්නේ කුමක් නැති වුනා ම ද? උපාදාන නැති වුනාම. කාම උපාදානත් නැත්නම්, දිට්ඨි උපාදානත් නැත්නම්, සීලබ්බත උපාදානත් නැත්නම්, අත්තවාද උපාදානත් නැත්නම් භවයක් නැහැ. උපාදාන නැති කල්හි භවය නැත.

උපාදාන නැතිවන්නේ කුමක් නැති වුනා ම ද? තණ්හාව නැති කල්හි උපාදාන නැත. රූප තණ්හා නැත්නම්, ශබ්ද තණ්හා නැත්නම්, ගන්ධ තණ්හා නැත්නම්, රස තණ්හා නැත්නම්, ඵොට්ඨබ්බ තණ්හා නැත්නම්, ධම්ම තණ්හා නැත්නම් බැඳෙන්න දෙයක් නෑනෙ. උපාදාන නැත.

තණ්හාව නැති වන්නේ විඳීමක් නැති වුනාම. ස්පර්ශය නැති කල්හි විඳීම නැත. සළායතන නැති කල්හි ස්පර්ශය නැත. නාම රූප නැති කල්හි සළායතන නැත. විඤ්ඤාණය නැති කල්හි නාම රූප නැත. සංස්කාර නැති කල්හි විඤ්ඤාණය නැත. අවිද්‍යාව නැති කල්හි සංස්කාර නැත.

එතකොට මේකෙ අවිද්‍යාව කියන එක ටිකක් තේරුම් ගන්න ඕනෙ. වේදනාව වෙනකම් තේරුම් ගැනීමට. පටිච්ච සමුප්පාදයේ නිරෝධය ගැන කථා කරද්දී රහතන් වහන්සේ ගැන කථා කරන්න වෙනවා. මොකද රහතන් වහන්සේට පටිච්ච සමුප්පාදය නැහැ. රහතන් වහන්සේට අවිද්‍යා සහගත ආශ්වාස ප්‍රාශ්වාසයක් නැහැ. අවිද්‍යා සහගත විතක්ක විචාර නැහැ. අවිද්‍යා සහගත සඤ්ඤා නැහැ. විඳීම් නැහැ. ඒ නිසා රහතන් වහන්සේට

අවිද්‍යා සහගත විඤ්ඤාණයක් හටගන්නෙ නැහැ. ඒ නිසා අවිද්‍යා සහගත නාම රූප නැහැ. අවිද්‍යා සහගත නාම රූප නැත්නම් අවිද්‍යා සහගත ආයතන හයක් නැහැ. අවිද්‍යා සහගත ආයතන හයක් නැත්නම් අවිද්‍යා සහගත ස්පර්ශයක් නැහැ. අවිද්‍යා සහගත ස්පර්ශයක් නැත්නම් අවිද්‍යා සහගත විඳීමක් නැහැ.

එතකොට රහතන් වහන්සේගේ සංස්කාර, විඤ්ඤාණ, නාමරූප, ආයතන, ස්පර්ශය ඔක්කොම අවබෝධයක් විතරයි. ඒක පටිච්ච සමුප්පාදයට අයිති නැහැ. පටිච්ච සමුප්පාදයේ තියෙන්නේ **අවිජ්ජා පච්චයා සංඛාරා...** අවිද්‍යාව ප්‍රත්‍යයෙන් හටගන්නා සංස්කාර.

එතකොට රහතන් වහන්සේ ජීවත් වෙන්නේ පටිච්ච සමුප්පාදය නිරුද්ධ කරලා. ඒකයි මේ ධර්ම මාර්ගයට ආපු ශ්‍රාවකයාට හැර වෙන කෙනෙකුට රහතන් වහන්සේ කවුද කියලා අඳුනාගන්න බැරි. ඇයි රහතන් වහන්සේත් ඇහින් රූප දකිනවා, කණින් ශබ්ද අහනවා, නාසයෙන් ආඝ්‍රාණය කරනවා, දිවෙන් රස විඳිනවා, කයින් පහස ලබනවා, මනසින් හිතනවා. රහතන් වහන්සේ සැප දුක් උපේක්ෂා විඳීම් විඳිනව. නමුත් රහතන් වහන්සේට පටිච්ච සමුප්පාදය නිරුද්ධ නිසා මිදුනු සිතින් තමයි වාසය කරන්නේ. ඒ නිසා තණ්හාවක් නෑ. උපාදාන නෑ. භවය නෑ. ජාති, ජරා, මරණ මොකුත් නෑ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දැන් පංච උපාදානස්කන්ධය කියන්නෙ මොනවද? **රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ.** එතකොට පටිච්ච සමුප්පාදයෙන් නිරන්තරයෙන් ම හැදෙන්නේ ඔය පහ තමයි. ඒ කියන්නේ ආශාවකට බැඳුණු රූපයක්, වේදනාවක්, සංඥාවක්, චේතනාවක්, විඤ්ඤාණයක්. මේවා තමයි හැදෙන්නේ. පටිච්ච සමුප්පාදයෙන් තමයි පවතින්නේ.

රහතන් වහන්සේ කියල කියන්නේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් අර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කළ. ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කරන්නෙ සම්මා දිට්ඨියෙන් ඇති කරගත්තු සීලයෙන්. සම්මා දිට්ඨියෙන් ඇති කරගත්තු සමාධියෙන්. සම්මා දිට්ඨිය ම දියුණු කිරීමෙන්.

එතකොට රහතන් වහන්සේ ඒ විදිහට ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කළා ම මොකද වෙන්නේ? දුක අවබෝධ කරනව. මොකක් ද දුක? පංච උපාදානස්කන්ධ දුක. අවබෝධ කරන්නෙ කොහොම ද? මේක අනිත්‍ය දෙයක්. දුක් දෙයක්. අනාත්ම දෙයක්. මෙතන මම ය, මාගේ ය, මාගේ ආත්මය ය කියල දෙයක් නෑ කියල අවබෝධ කරනව. අවබෝධ වීම සමඟ **'දුක්ඛේ අඤ්ඤාණං'** නැතිව යනව. **(දුක්ඛේ ඤාණං)** දුක ගැන අවබෝධයක් ඇතිවෙනව. එතකොට රහතන් වහන්සේට මොකද වෙන්නෙ? දුක තියෙන්නෙ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ මේවා කෙරෙහිනෙ ත්‍රිවිධ තණ්හාව හටගන්නෙ. අවබෝධය නිසා ත්‍රිවිධ තණ්හාව දුරු වෙනව. **(දුක්ඛ සමුදයේ ඤාණං)** තණ්හාව නැති වුනා ම දුක නැතිවුනා කියල දැනගන්නව. **(දුක්ඛ නිරෝධේ ඤාණං)** ඒ දැන ගන්නකොට දන්නව මාර්ගය සම්පූර්ණ වුනා.

එතකොට මේ අවබෝධයට ආවට පස්සේ මේකෙ තියෙනවා **(රූප ධාතුයා භික්ඛවේ භික්ඛුනෝ රාගං පහීණෝ හෝති)** එතකොට මෙයාට රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන මේවායේ රාගය ප්‍රහාණය වෙනව. රාගය කියන එක කරුණු තුනට ම පොදුවේ ආපු එකක්. ත්‍රිවිධ තණ්හාවට ම පොදු එකක්. එතකොට රාගය ප්‍රහාණය වෙන්න හේතුව මොකක් ද? අවබෝධ වීම. රූපයේ යථා ස්වභාවය පිළිබඳ යථාභූත ඤාණය හට ගැනීම. අවබෝධ වීම නිසා රාගය ප්‍රහාණය වෙනව. **(රාගස්ස පහාණා)** රාගය ප්‍රහාණය වීම නිසා **(වොච්ඡිජ්ජති ආරම්මණං)** පැවැත්ම පිණිස අරමුණක් නෑ. අරමුණ සිඳෙනව. **(පතිට්ඨා විඤ්ඤාණස්ස න හෝති)** විඤ්ඤාණයට පිහිටන්න තැනක් නැතිව යනව.

එතකොට එහෙම නම් අපේ හටගත්ත විඤ්ඤාණය පැලවෙච්ච විඤ්ඤාණයක්. මුල් ඇදපු එකක්. එතකොට ඒකෙන් ස්පර්ශය ඇතිවෙලා විඳීම්, තණ්හාව ඇතිවෙන කොට තව තවත් මුල් ඇද ඇද පැලවෙනව. නමුත් රහතන් වහන්සේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය දියුණු කරල හිට, **(පතිට්ඨා විඤ්ඤාණස්ස න හෝති)** කුඹුර නැතිව යනව. විඤ්ඤාණයට පිහිටක් නෑ. එතකොට අවිද්‍යා සහගතව සංස්කාර නො පවත්වන නිසා, ආශ්වාස ප්‍රාශ්වාස නො කරන නිසා, විතක්ක විචාර නො පවත්වන නිසා,

සංඥා වේදනා නො පවත්වන නිසා, අවිද්‍යා සහගතව පුඤ්ඤාභි සංඛාරත් නැත්නම්, අපුඤ්ඤාභි සංඛාරත් නැත්නම්, ආනෙන්ජාභි සංඛාරත් නැත්නම්, විඤ්ඤාණයක් කොහෙත්ම ඒ විදිහට හැදෙන්නෙ නෑ. එහෙනම් රහතන් වහන්සේගේ ඇහේ හටගන්නේ නො පිහිටි විඤ්ඤාණයක්. ඇහේ පිහිටපු විඤ්ඤාණයක් නෑ. ඇහැයි, රූපය යි නිසා විඤ්ඤාණය හටගන්නව. නමුත් ඒක බීජයක් හැටියට නෑ. අපේ විඤ්ඤාණය හටගන්නෙ බීජයක් හැටියට.

එතකොට **(පතිට්ඨා විඤ්ඤාණස්ස න හෝති)** විඤ්ඤාණයට පිහිටක් නෑ. **(තදප්පතිට්ඨිතං විඤ්ඤාණං)** මේ නො පිහිටි විඤ්ඤාණය, බීජයක් හැටියට නැති විඤ්ඤාණය **(අවිරූළ්හං)** පැළවෙන්නෙ නෑ. **(අනභිසංඛති අනභිසංගච්ඡති)** ඒක සකස් වෙන්නෙ නෑ පැවැත්මක් පිණිස. **(විමුත්තං)** නිදහස් වෙනව. **(විමුත්තත්තා ඨිතං)** නිදහස් වීම නිසා විමුක්තියේ පිහිටල තියෙනව. **(ඨිතත්තා සංතුසිතං)** විමුක්තියේ පිහිටල තියෙන නිසා පූර්ණ තෘප්තියක් තියෙනව. **(සංතුසිතත්තා න පරිතස්සති)** ඒ නිසා තැතිගැනීම්, බිය, සැක සංකා මොකුත් හටගන්නෙ නෑ. **(අපරිතස්සා පච්චත්තංඤේව පරිනිබ්බායති)** ඒ නිසා තමා තුළ ම පිරිනිවී යනව. ඒකයි රහතන් වහන්සේට චුති චිත්තයක් නැත්තෙ. මේ ලෝකයේදි ම පිරිනිවන් පානව.

එතකොට මේක සිද්ධවෙන කොට රහතන් වහන්සේ තුළ පටිච්ච සමුප්පාදය සම්පූර්ණයෙන් ම නිරුද්ධයි. එතකොට අපි ශ්‍රාවකයො විදිහට තේරුම් අරන් තියන්නට ඕනෙ මේක තමයි මේ ධර්මයේ තියෙන අවසන් ප්‍රතිඵලය කියල. මේක තමයි විද්‍යාවේ කෙළවර. මේක තමයි බුදුරජාණන් වහන්සේ අවබෝධ කරපු නියම විද්‍යාව. මේ විද්‍යාවේ කෙළවරක් තියෙනව. මේක තමයි ජීවිත අවබෝධයේ උපරිම තලය. එහෙනම් අපි තුළ පැහැදීමක් තියෙන්න ඕනෙ මෙන්න මේ විදිහට තමයි ජීවිතය පවතින්නෙ, මේක මේ විදිහට තමයි නැතිවෙන්නෙ, මේ විදිහට තමයි සිද්ධ වෙන්නෙ කියල. එතකොට තමයි රහතන් වහන්සේ කවුද කියල අපිට යන්තමින් හරි අවබෝධ වෙන්නෙ. එතකොට සංසාරෙ ස්වභාවයත් අන්තිමට අවබෝධ වෙන්නෙ එතකොට යි.

එතකොට අපිට පුළුවන් වෙන්න ඕනෙ නුවණින් මෙනෙහි කරන්න

**ඉති ඉමස්මිං සති ඉදං හෝති**
**ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති**
**ඉමස්මිං අසති ඉදං න හෝති**
**ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති**

එතකොට මේ විදිහට නුවණින් මෙනෙහි කරගෙන යනකොට, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා එයා පටිච්ච සමුප්පාදයේ හට ගැනීමත්, පටිච්ච සමුප්පාදයේ නිරෝධයත් (**ආකංඛමානා අත්තානං බ්‍යාකරෙය්‍ය**) තමන් ම තමන් ගැන අඳුනාගන්නවා. මම පෙරේත ලෝකෙන් නිදහස් වෙච්ච එක්කෙනෙක්. මම තිරිසන් ලෝකෙන් නිදහස් වෙච්ච එක්කෙනෙක්. මම නිරයෙන් නිදහස් වෙච්ච එක්කෙනෙක්. (**ඛීණාපායා විනිපාතං දුග්ගතිං**) මම අපාය නම් දුගතියට වැටෙන්නෙ නැති කෙනෙක්. (**සෝතාපන්නෝ හමස්මි**) මම සෝවාන් වෙච්ච එක්කෙනෙක්. (**අවිනිපාත ධම්මෝ**) මම ආයෙමත් පහළට වැටෙන්නෙ නැහැ. (**නියතෝ සම්බෝධි පරායනෝ**) මම ස්ථිරව ම බුද්ධ ශාසනයේ නිවන් දකිනව කියල තමන් තමන්ව අඳුන ගන්නව.

එතකොට මේකෙ බාහිර සාක්කිකාරයෙක් නෑ. මම ඉන්න තැන බාහිරින් සොයන්න බෑ. එහෙම එකක් බුද්ධ දේශනාවේ නෑ.

හොඳ පැහැදිලි සිදුවීමක් තියෙනව. එක රහතන් වහන්සේ නමක් හිටිය උන්වහන්සේ රහත් වෙන්න කලින් (ලකුණ්ඨක භද්දිය ස්වාමීන් වහන්සේ) උන්වහන්සේට භාවනා ධර්ම මාර්ගය කියා දුන්නෙ සාරිපුත්ත මහ රහතන් වහන්සේ. ලකුණ්ඨක භද්දිය ස්වාමීන් වහන්සේ රහතන් වහන්සේ නමක් බවට පත්වුනා. නමුත් අඩ ගගහ කියල දුන්න සාරිපුත්ත හාමුදුරුවො තව තවත්. එතකොට බුදුරජාණන් වහන්සේ විස්තර කරනව 'ලකුණ්ඨක භද්දිය කරන්න ඕනෙ දේ කරල ඉවරයි. ඇයි ඔබ තවත් කියාදෙන්නෙ?' එතකොට අපිට තේරෙනව සාරිපුත්ත මහ රහතන් වහන්සේට පවා චේතෝපරිය ඥාණය පිළිබඳ සම්පූර්ණ ඥාණයක් නෑ. එහෙනම් අනුන්ගේ චිත්ත දියුණුවක් ගැන, අනුන්ගේ

මාර්ග ඵල ගැන ලෝකයේ වෙන කෙනෙකුට කියන්න පුළුවන් නම් ඒ බුදුරජාණන් වහන්සේට පමණයි.

එතකොට මේකෙ තියෙන්නෙ තමන් තමන් ගැන අඳුනගන්න ඕනෙ. එතකොට අඳුන ගන්න ක්‍රමය බුදුරජාණන් වහන්සේ විස්තර කරනව. එතකොට මේ විස්තර කරපු ක්‍රමයට අනුව අපි නුවණින් විමස විමස බලන කොට තමයි දැන් ඔබට තේරෙනව ඇති, පටිච්ච සමුප්පාදය අවබෝධ කරන්නෙ නැතිව දුක නැමැති ආර්ය සත්‍යයේ ස්වරූපය තේරුම් ගන්න බෑ. එතකොට පටිච්ච සමුප්පාදය තේරුම් ගත්තට පස්සේ අපට පංච උපාදානස්කන්ධය නිකම් ම තේරුම් ගන්න පුළුවනි.

පංච උපාදානස්කන්ධය කිව්වෙ සතර මහා ධාතූන්ගෙන් හටගත්තු දේ රූප. දැන් තේරෙන්නෙ නැද්ද? වේදනා ස්පර්ශයෙන් හටගන්න විඳීම. පටිච්ච සමුප්පාදය හොඳට තේරුම් ගත්තම අපි දන්නව ස්පර්ශයෙන් විඳීම හටගන්නව. සඤ්ඤාව හටගන්නෙ ස්පර්ශයෙන්.සංස්කාර හටගන්නෙත් ස්පර්ශයෙන්. පංච උපාදානස් කන්ධයේදී විඤ්ඤාණය ගැන කියනවා, නාම රූප ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය හටගන්නවා. දැන් මෙතන විස්තර කළේ සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය හටගන්නව.

එතන නාම රූප ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය හටගන්නවා කියල කිව්වෙ අපි අඳුන ගන්න ඕනෙ සම්පූර්ණයෙන් ම ඇසේ, කණේ, නාසයේ, දිවේ, කයේ, මනසේ විඤ්ඤාණය කියන එක ක්‍රියාත්මක වෙන්නෙ නාම රූපයෙන් හටගත්තු ආයතනයක් තුළ. එතකොට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා එක තැනකදි විඤ්ඤාණය ගැන හොයන්න ගියොත්, විඤ්ඤාණ ආහාරය ගැන හොයන්න ගියොත් එයාට හම්බවෙන්නෙ නාම රූප කියල.

එතකොට බුදුරජාණන් වහන්සේ බලන්න කියනවා සතර මහා ධාතු නිසා රූපය, ස්පර්ශය නිසා වේදනා, ස්පර්ශය නිසා සඤ්ඤා, ස්පර්ශය නිසා චේතනා, නාම රූප නිසා විඤ්ඤාණය. එතකොට ස්පර්ශය ගැන කථා කිරීමේදී විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වයෙන් තොරව කථා කරන්න බෑ. කරුණු තුනක් එකතු වෙලානෙ ස්පර්ශය හටගන්නෙ. නාම රූප ගැන කථා කිරීමේ දී

නාම රූප වලට විඤ්ඤාණය ඇතුළත් නෑ. නාම වලට තියෙන්නේ වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර. මේකෙ ස්පර්ශය තියෙනව. එහෙනම් නාම රූප වලත් විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයි. එතකොට මේ ඔක්කොගේ ම සංකලනයකින් තමයි මේ විඤ්ඤාණය කියන එක පවතින්නෙ. මේ සියල්ලට ම හේතු වෙන්නෙ පටිච්ච සමුප්පාදය.

එතකොට පටිච්ච සමුප්පාදයේ අවිද්‍යාව ගැන විස්තර වෙනව. චතුරාර්ය සත්‍යය ගැන නො දැනීම. පටිච්ච සමුප්පාදයේ විඤ්ඤාණය ගැන විස්තර වෙනව. නාම රූප ගැන විස්තර වෙනව. ආයතන හය ගැන විස්තර වෙනව. විඳීම ගැන විස්තර වෙනව. තණ්හාව ගැන විස්තර වෙනව. උපාදාන ගැන විස්තර වෙනව. භවය ගැන විස්තර වෙනව. ඉපදීම ගැන විස්තර වෙනව. එහෙම නම් යම්කිසි කෙනෙක් පටිච්ච සමුප්පාදය මනා කොට තේරුම් ගත්ත නම්, එයා ධර්මයේ බොහෝ දේවල් තේරුම් ගත්තා. පටිච්ච සමුප්පාදය තේරුම් නො ගෙන ධර්මය තේරුම් ගන්න බෑ.

ඒකයි එක තැනක සාරිපුත්ත මහ රහතන් වහන්සේ දේශනා කරනවා, මහා හත්ථිපදෝපම සූත්‍රයේ දී. **(යෝ ධම්මං පස්සති සෝ පටිච්ච සමුප්පාදං පස්සති)** යම් කිසි කෙනෙක් ධර්මය දකිනවා නම් එයා දකින්න ඕනෙ පටිච්ච සමුප්පාදය යි කියලෙ. මොකද පටිච්ච සමුප්පාදයෙන් ම තමයි මේක අනාත්මයි කියල අවබෝධ කරගන්න තියෙන්නෙ.

සංයුත්ත නිකාය දෙවැනි කොටසේ තමයි ගොඩක් ම පටිච්ච සමුප්පාදය ගැන විස්තර වෙන්නෙ. හොඳට නුවණින් විමස විමස බලද්දි තේරුම් යනව මේකෙ තමාගේ වසඟයේ පවත්වාගෙන යන්න දෙයක් නෑ කියල.

නමුත් මේ අර්ථය මම අල්ල ගත්තෙ **අනත්ත ලක්ඛණ සූත්‍රයෙන්.** සංයුත්ත නිකායේ ඒක සඳහන් වෙන්නේ **පංච වග්ගීය සූත්‍රය** කියල. ඒකෙ බුදුරජාණන් වහන්සේ විස්තර කරනව "**(රූපං භික්ඛවේ අනත්තා)** පින්වත් මහණෙනි, රූපය අනාත්මයි. **(රූපං ච භික්ඛවේ අත්තා අභවිස්ස නයිමේ රූපං ආබාධාය සංවත්තති)**

මේ රූපය ආත්මයක් වුනා නම්, මේ රූපය ආබාධ පිණිස පවතින්නෙ නෑ. **(ලබ්භේ ත ච රූපේ ඒවං මේ රූපං හෝතු)** මාගේ රූපය මෙසේ වේවා, මෙසේ නො වේවා කියල ලැබෙන්නෙ ඕනෙ."

බුදුරජාණන් වහන්සේ කියනවා ආත්මයක් වුනා නම් ඒක ලැබෙන්න ඕනෙ මෙසේ වේවා, මෙසේ නො වේවා කියල. "**(යස්මා ච බෝ භික්ඛවේ රූපං අනත්තා)** පින්වත් මහණෙනි, යම් කරුණක් නිසා රූපය අනාත්ම ද, **(තස්මා රූපං ආබාධාය සංවත්තති)** ඒ නිසා රූපය ආබාධ පිණිස පවතිනව. **(න ච ලබ්භති රූපේ ඒවං මේ රූපං හෝතු ඒවං මේ රූපං මා අහෝසී ති)** ඒ නිසා මාගේ රූපය මෙසේ වේවා, මෙසේ නො වේවා කියල ලැබෙන්නෙ නෑ" කියනව. අන්න එතනින් තමයි අපට අනාත්ම කියන වචනයේ තේරුම දැනගන්න තියෙන්නෙ.

අනාත්ම කියන්නේ තමාගේ වසඟයේ පවත්වන්නට බැරිකම. තමාගේ වසඟයේ පවත්වන්නට පුළුවන් නම් මාගේ රූපය මෙසේ වේවා කියල පවත්වන්නත් පුළුවන් වෙන්න ඕනෙ, මාගේ රූපය මෙසේ නො වේවා කියලත් පවත්වන්න පුළුවන් වෙන්න ඕනෙ. මාගේ වේදනාව මෙසේ වේවා කියල හරි මෙසේ නො වේවා කියල හරි, මාගේ සඤ්ඤාව මෙසේ වේවා කියල හරි මෙසේ නො වේවා කියල හරි, මාගේ සංඛාර මෙසේ වේවා කියල හරි මෙසේ නො වේවා කියල හරි, මාගේ විඤ්ඤාණය මෙසේ වේවා කියල හරි මෙසේ නො වේවා කියල හරි පවත්වන්නට පුළුවන් වෙන්න ඕනෙ. ඉතින් එහෙම පවත්වන්නට බැරි නිසයි අනාත්මයි කියල කියන්නෙ. ඒ බුද්ධ දේශනාව නො තියෙන්න අපි ඔහේ මගේ ආත්මය නෙවෙයි කිය කිය යයි, මොකක් ද මේකෙ අර්ථය කියල දන්නෙ නැතිව. එතකොට අනාත්මයි කියන්නේ තමන්ගේ වසඟයේ පවත්වන්න බැරිකම.

සංයුත්ත නිකායේ තියෙන ඒ අනාත්ම ලක්ඛණ සූත්‍ර දේශනාව හරි ම වැදගත් එකක්. ඊට පස්සේ සම්පූර්ණයෙන් ම විස්තර කරන්නේ පංච උපාදානස්කන්ධය ගැන. පංච උපාදානස්කන්ධය විදර්ශනා කරන්න පුළුවන් වෙන්නෙ පටිච්ච සමුප්පාදය, ආයතන හය, ධාතු මේ ඔක්කොම තේරුම් ගත්තු කෙනාට තමයි. ඊට පස්සේ එයාට නුවණින් යුක්තව විමසන්න

පුළුවන්. විමසන්න ඕනෙ හැටි ඒ අනත්ත ලක්ඛණ සූත්‍රයේ ම විස්තර වෙනව.

ඉතින් මේ විදිහට තේරුම් ගත්තහම පටිච්ච සමුප්පාදය ගැන සෑහෙන අවබෝධයක් ඇති කරගන්න පුළුවන්.